## 2019/12/10 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/12/10 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2019.12.10 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

### 02. මූලාසනයේ පිළිගැනීමේ කතාව

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. අද දෙසැම්බර් මස 10 වැනිදා. මේ වසරේ පවත්වන අවසන් සභාව. 2020 වසර සඳහා අයවැය ඉදිරිපත් කරන දිනයත් අද. ඒ නිසා අද දින සභාව විශේෂ සභාවක් වෙනවා. ඒ අනුව මේ අවස්ථාවට සහභාගී වී සිටින ගරු උප සභාපතිතුමා ඇතුලු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාම. මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මම කවදත් බලාපොරොත්තු වෙන පරිදි සභාව ඉදිරියට කරගෙනයාමට. ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමින් මගේ පිළිගැනීමේ කතාව අවසන් කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

**(අ)02. 2019.11.08 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.11.08 දින පැවති මහා සභාවේ සභා වාර්තාව, සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත මගින් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම-2019 උපමාන පාදක සංවර්ධන ප්‍රදාන, අංශය - පසුගාමී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ සඳහා වූ විශේෂ වැඩසටහන - සංශෝධන 4 සම්බන්ධව 2019.12.04 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.
02. හත්විටියාගොඩ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ කාලය දීර්ඝ කර ගැනීම සම්බන්ධයෙන් සිතමු පැරකුම් කාන්තා සමිතිය, නැහිනිගල විසින් යොමු කරන ලද 2019.12.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.
   මේ සම්බන්ධව දින දීර්ග කරගැනීමට ඉල්ලීම් කරලා තියෙනවා. නමුත් ඒක කරන්න බැහැ. 2019.12.20 වෙන කොට මේ කර්මාන්තය අවසන් වෙන්න ඕන. ගරු පලාත් සභා නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මහතා විසින් වාචිකව දින දීර්ඝ කරගෙන තිබුනා. නමුත් ලිඛිතව එවල තියෙන්නෙ 2019.12.20 වෙන කොට බිල්පත් ඉදිරිපත් කරන්න කියලා. නමුත් 2019.12.31 ට කලින් කොළඹ අමාත්‍යාංශයට බිල් ඉදිරිපත් කලොත් ප්‍රශ්නයක් නැහැ. යනුවෙන් ගරු සභාපතිතුමා විසින් පැවසීය.
03. 2020 වර්ෂය සඳහා අවශ්‍ය ඇමතුම් දිනපොත හා දින දර්ශන මිළදී ගැනීම සම්බන්ධව ගා/නාප්‍රාස/ගි/02/සැපයුම් විසින් යොමු කරන ලද 2019.12.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

04. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත මගින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2019, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2019, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2019 සම්බන්ධව 2019.11.27 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

05. පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගාල්ල විසින් යොමු කරන ලද උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය සම්බන්ධයෙන් ගාල්ල දිසා අධිකරණයේ පවතින එල් 15888 දරණ නඩුව සම්බන්ධව උපදෙස් ලබා ගැනීම සම්බන්ධ 2019.11.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

06. ගා/නාප්‍රාස/සං/02/2019 මගින් යොමු කරන ලද නාගොඩ හා මාපලගම නගර පවිත්‍ර කිරීමේ හා කසල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - 2019.12.12/13 සම්බන්ධව 2019.12.06 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.
මෙම වැඩසටහන මෙම මස 12 වෙනි දින නාගොඩ ප්‍රදේශයේත්, 13 වන දින මාපලගම ප්‍රදේශයේත් පවත්වනවා ඒ සඳහා ඔබතුමන්ලාත් සහභාගි වෙන්න. අපි තල්ගස්වල කරපු වැඩසටහනට හොද ප්‍රතිචාර ලැබුනා. යනුවෙන් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී , එන්.ජී. ගයාන් මධුසංක මහතා විසින් යොමු කරන ලද 2019.12.09 දිනැති මාර්ග සංවර්ධනය සම්බන්ද ලිපිය සභාගත කරන ලදී.

08. විහාරාධිපති, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක , පූජ්‍ය බුත්තල විමලනන්ද හිමි, ක්ශේත්‍රාරාම විහාරස්ථානය, උඩවැලිවිටිය විසින් යොමු කරන ලද විහාරස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම සම්බන්ධව 2019.11.18 දිනැති ලිපිය සභාගත කරන ලදී.

09. වතුර බවුසරයක් ලබා ගැනීම සම්බන්ධව, ලේකම්, එක්සත් අනෝන්‍යාධාර සමිතිය, කැප්පිටියගොඩ දකුණ විසින් යොමු කරන ලද 2019.12.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

10. අත්‍යාවශ්‍ය වීථි ලාම්පුවක් සවි කර ගැනීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී බී.ජී.අරුණ ශාන්ති මහත්මිය විසින් යොමු කරන ලද 2019.12.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

11. සිළිංඩරයක් ලබා ගැනීම සම්බන්ධව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.පතිනායක මහතා විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

12. ශ්‍රී මහා බෝධිරාජ පෙරහැර කමිටුව විසින් යොමු කරන ලද ජාතික උත්සවයක් ලෙස ස්ථාපිත කොට ඇති උඩුගම ශ්‍රී බෝධිරාජ පෙරහැර යන මැයෙන් 2019.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

13. එච්.ජී. නිමල්, පොපියුලර් සැලූන්, තල්ගස්වල විසින් යොමු කරන ලද 2019.12.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.
එම සැලූන් එක පිටිපස්සෙ වැටක් ගහල තිබුනා. ඒක සභාවෙන් ගලවල අයින් කළා. ඔහුට අයිතිවාසි කමක් කියන්නත් නැහැ. ඔහුටත් ප්ලෑන් එකක් තියෙනවා. අපටත් ප්ලෑන් එකක් තියෙනවා. හැබැයි දැන් ඔහු ලොකු වපසරියක් අල්ලලා නැවතත් කනු ගහල තියෙනවා. ඒක අයින් කරල දාන්න ඕන. රජයේ දේපොල එහෙම කරන්න දෙන්න බැහැ. ඒ වගේම සභාවේ එකගත්වයක් නොමැති බැවින් අපට ඔහුට මැනුම් කටයුතු කරන්න අවසර දෙන්නත් බැහැ. ඒ නිසා ඔහුට මිනින්දෝරු මහතා මගින් හතර මායිම් කරුවන් දැනුවත් කොට ඔහුගේ කොටස මැන ගන්න කියලා දන්වමු. යනුවෙන් ගරු සභාපතිතුමා විසින් පැවසීය.

14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් යොමු කරන ලද ගරු දකුණු සභා මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සිළිංඩර් මිළදී ගැනීම යනුවෙන් 2019.12.10 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සභා ගත කරන ලදී.
15. කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව විසින් යොමු කරන ලද අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සම්බන්ධ ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**i.** බණ්ඩාරනායකපුර කුරුපනාව මාර්ගය ගිලා බැසීමට ලක්ව ඇති බැවින් හිටපු ගරු දකුණු පළාත් සභා මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ මාර්ග සංවර්ධනය සඳහා ලැබී ඇති රු. 150,000.00 ක මුදලින් තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව අදාළ අමුද්‍රව්‍ය මිළදී ගෙන බණ්ඩාරනායකපුර කුරුපනාව මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ii. නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පෙර පාසල් 15 හි දරුවන් 400 දෙනෙකු වෙනුවෙන් පෙරපාසල් නිල ඇඳුම් 2න් 1ක් නොමිලේ ලබාදීමටත්, එම නිළ ඇඳුම් 400 සඳහා යන වියදම සභා අරමුදලින් දැරීමටත් යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

iii. උඩුගම සති පොළ, ඉදි කොට ඇති නව පරිශ්‍රයට රැගෙන විධිමත් ආකාරයෙන් පොළ පවත්වාගෙන යාමටත්, එහි සියළුම වෙළඳුන්ට අවශ්‍ය ඉඩකඩ නොමැති බැවින් නව පොළ පරිශ්‍රය ඉදිරිපිට දෙපස තාවකාලික වෙළඳ කුටි ඉදිකිරමට අවශ්‍යව ඇත. ඒ අනුව 2020 වර්ෂයේ සිට උඩුගම සති පොළ විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා තාවකාලික වෙළඳ කුටි ඉදිකිරීමට අවශ්‍ය කොන්ක්‍රීට් කණු මිළදී ගැනීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

iv. පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමු කරන ලද උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය සම්බන්ධයෙන් ගාල්ල දිසා අධිකරණයේ පවතින එල් 15888 දරණ නඩුව සම්බන්ධව ලබා දී ඇති උපදෙස් අනුව එම නඩුව වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතාට සභා අනුමැතිය මත සභා අරමුදලින් ගාස්තු ගෙවීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී සුභාෂී ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

v. කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව විසින් යොමු කරන ලද අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සම්බන්ධ ඉල්ලීම අනුව එම සංවිධානයට එම කර්මාන්තය කර ගෙන යාම සඳහා අත්තිකාරම් මුදලක් ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

vi. **පහත සඳහන් අංක 01 සිට අංක 03 දක්වා ආවරණ අනුමැතිය යටතේ සිදුකල ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට යෝජනා කරමි.**

**2019.12.10 දින පැවැත්වෙන මහ සභාව සදහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ විස්තරය**

01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව
2019 වර්ෂයේ පැවැත්වීමට නියමිත සාහිත්‍ය උත්සවයේ තරඟ සඳහා ත්‍යාග ලබාගත් ත්‍යාගලාභීන් වෙනුවෙන් පොත් මිළදී ගැනීම සඳහා අවශ්‍ය අත්තිකාරම් මුදලක් ලබා ගැනීම - රු. 30000.00

02. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ඒකල, ජාඇල
ආදාහනාගාර තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා මුදල් ගෙවීම - රු. 4500.00

03. මධුරකාන්ත ජයවීර, මාපලගම , ගාල්ල
වාහන වෙන්දේසිය වෙනුවෙන් ගෙවන ලද තැන්පතු මුදල ආපසු ගෙවීම - රු. 3000.00

**ආවරණ අනුමැතිය යටතේ සිදු කල ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

vii. **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 43 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**<u>2019.12.10 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.2019 නොවැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 606.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 276.60 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 8557.40 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1795.50 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1484.40 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 734.10 |
| 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 240.00 |
| 8619142704 | - රන් කැකුළු පෙර පාසල | - රු. 276.60 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීරණ කොරිඩෝව | - රු. 368.10 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 935.40 |
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 294.90 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |

**2019 ඔක්තෝම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 349.80 |
| 4509082800 | - උදාර පෙර පාසල | - රු. 294.90 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි**

**දුරකථන බිල්පත් ගෙවීම** (2019.10.01 - 2019.10.31)

| | | |
|---|---|---|
| i. | 091 2296433 - ප්‍රධාන කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම | - රු.9770.92 |
| ii. | 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම | - රු. 4195.64 |
| iii. | 0912296577 - මාපලගම උප කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම | - රු. 475.09 |

**දුරකථන බිල්පත් ගෙවීම** (2019.11.01 - 2019.11.30)

| | | |
|---|---|---|
| i. | 0912296577 - මාපලගම උප කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම | - රු. 475.09 |

**03.සී/ස ලංකාබෙල් සමාගම**

0915701722 -උප සභාපති නිවසේ දුරකථන බිල්පත පියවීම - රු. 688.50

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2019.11.25) - රු. 68.86

**05.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2019.10.22 – 2019.11.19) -රු. 1706.41

**06. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. ආහාර පනතේ රාජකාරි වෙනුවෙන් ආහාර සාම්පල් ලබාගැනීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම උඩුගම ම.සෞ.ප.කොට්ඨාසය (ම.සෞ.ප එච්.එල්.එන්. පී කුමාර මයා) -රු. 1000.00

ii. රාජකාරි අවශ්‍යතා සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම -රු. 3300.00

**<u>07. අතිකාල දීමනා ගෙවීම</u>**

**<u>2019 නොවැම්බර් මස</u>**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 6981.16 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 7680.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු. 9053.90 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8320.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| කේ.ජී. ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු. 688.59 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 436.04 |

**<u>2019 ඔක්තෝම්බර් මස</u>**

| | | |
|---|---|---|
| කේ.ජී. ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු. 392.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 381.53 |

**<u>08 .2019 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**<u>09. 2019 නොවැම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | -ගරු සභාපති | -රු. 5000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | -රු. 4200.00 |
| යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | -රු. 1020.00 |
| එච්.එම්.හේවාවිතාන මිය | - කළමනාකරණ සහකාර | -රු. 480.00 |
| චන්දිමා සෙනෙවිරත්න මිය | - කළමනාකරණ සහකාර | -රු. 480.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1610.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 700.00 |

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| සී.දයාවංශ | -ලේකම් | - රු. 2180.00 |

**<u>2019 දෙසැම්බර්මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 700.00 |
| යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | -රු. 530.00 |

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

| | | |
|---|---|---|
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4400.00 |

**<u>2019 ඔක්තෝම්බර්මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 805.00 |

**10. බී.ඩී. රුවිනි චතුරිකා මිය, කළමනාකරණ සහකාර, නාගොඩ ප්‍රාදේශීය සභාව**

කළමනාකරන තනතුරට අදාල පරිගණක හැකියා කඩඉම් විභාගය සමත්වීමේ පුහුණු දීමනාව ලබා දීම - රු. 7000.00

**11. දිලිනි දිසානායක, තාක්ෂණ සේවා නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව**

සති අන්ත නිවාඩු දිනයන්හි රාජකාරී කටයුතු කිරීම වෙනුවෙන් දීමනා ලබා ගැනීම - රු. 2940.00

**12. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**13. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2019 නොවැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් - රු. 62400.00
LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 240 ක් - රු. 24960.00
252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 40 ක් - රු. 4160.00
LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 110 ක් - රු. 11440.00

-

**එකතුව** **- රු.102960.00**

**14.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**
**2019 ඔක්තෝම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් - රු. 5200.00

**එකතුව** **- රු. 5200.00**

**15.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක එල් 13814 ට අදාළව 2019.11.21 වන දිනට කැඳවීමට නියමිත නඩු වාරය සඳහා නීතීඥ පෙනී සිටීමේ ගාස්තු, නඩු අංක එල් 16242 ට අදාළව 2019.12.06 වන දිනට කැඳවීමට නියමිත නඩු වාරය සඳහා නීතීඥ පෙනී සිටීමේ ගාස්තු , නඩු අංක පී 14658 ට අදාළව 2019.12.10 වන දිනට කැඳවීමට නියමිත නඩු වාරය සඳහා නීතීඥ පෙනී සිටීමේ ගාස්තු -රු. 13000.00

**16.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 දෙසැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00
ii. 2019 නොවැම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2100.00
iii. 2020 අයවැය පිටපත් 44 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු10362.00

**17. එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 නොවැම්බර් - රු. 5490.00

**18. බී.ජේ. කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 ඔක්තෝම්බර් - රු. 5390.00

**19. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා දෙසැම්බර් මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**20. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2019 නොවැම්බර්) - රු.13000.00

**21. දයානි පුද්.සමාගම, මාපලගම**

i. නාගොඩ ප්‍රා දේශීය සභාවේ ඇති කණකොළ කපන යන්ත්‍රය සඳහා උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 850.00
ii. මාපලගම පුස්තකාලයේ ප්‍රධාන දොර සඳහා දොර ලොක් එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 1024.00
iii. පොප් රිවට් මැෂිමක් ලබා ගැනීම වෙනුවෙන් බිල්පත - රු. 750.00

iv. නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ හා වැසිකිලි පද්ධතියේ දොර සඳහා සරනේරු හා සොයිබ මිළදී ගැනීමේ බිල්පත - රු. 757.50
v. තල්ගස්වල ශ්‍රමදාන වැඩසටහන සඳහා අත්මේස් ලබාගැනීමේ බිල්පත -රු. 1690.00
vi. මාපලගම ක්‍රීඩාංගනය සඳහා ට්‍රිප් ස්විචයක් මිලදී ගැනීමේ බිල්පත -රු. 3255.00

**22. පී.එල්.රංජන් මයා, ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල**
සමභාවට අවශ්‍ය පොලිමර් සීල් දෙකක් ලබා ගැනීමේ බිල්පත - රු. 900.00

**23. ජී.ඩී.ආර්. යූ. උපුල් අබේරත්න මයා, පේරාදෙණිය විශ්ව විද්‍යාලය**
පුස්තකාල තුන සඳහා උසස් පෙළ දේශපාලන විද්‍යා පොත් මිළදී ගැනීමේ බිල්පත - රු. 2850.00

**24. සෙල් එක්ස් කම්පියුටර්, ගාල්ල**
ෆැක්ස් යන්ත්‍රයක් මිළදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.19900.00

**25. උපාලි නිව්ස්පේපර්ස් පුද්ගලික සමාගම, කොළඹ**
i. 2020 වර්ෂය සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමට අදාල දැන්වීම පළ කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.20125.00
ii. 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන දැන්වීම පළ කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.43470.00

**26. එක්ස්ලන්ට් ඇඩ්ස් ඇන්ඩ් කාර් කෙයා, තල්ගස්වල**
සාහිත්‍ය උළෙල සඳහා අවශ්‍ය බැනර් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 4400.00

**27. සිසිර ජයමාන්න මයා, පොලිසීය අසල, උඩුගම**
2019 නොවැම්බර් මස 08 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සහ තේ සඳහා) - රු. 9490.00

**28. ජ්.පී.ජී. නිලූකා උදයංගනී, ඩී.එන්.පී. එකෝ පොලිතීන්, වත්තහේන**
කොම්පෝස්ට් පොහොර ඇසුරුම් කිරීම සඳහා පොලිතීන් බෑග් මිළදී ගැනීමේ බිල්පත - රු. 56143.00

**29. එම්.කේ.එම් සුරංග මයා, විමාෂා ප්‍රින්ටර්ස්, පිටිගල**
පෙර පාසල් දරුවන් සඳහා සහතික පත් 300 ක් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 7500.00

**30. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**
නිදහස් දුම්රිය ගාස්තු ගෙවීම
දිලිනි දිසානායක මිය හික්කඩුව- බදුල්ල - රු. 3000.00

**31.ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**
කොම්පෝස්ට් පොහොර ඇසුරුම් කිරීම සඳහා කවර මිලදී ගැනීමේ බිල්පත - රු. 500.00

**32. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.22150.00

**33. නිව් විජය මෝටර්ස්, ගාල්ල**
PF 7360 කැබ් රථයේ එලයිමන්ට් පරික්ෂා කිරීමේ බිල්පත - රු. 1000.00

**34. ජයන්ත ඉලේපෙරුමආරච්චි මයා, ජේ.පී. කමියුනිකේෂන්, නාගොඩ**

2020 අයවැය පිටපත් 44 ක් සකස් කිරීම සඳහා පරිගණක වර්ණ පිටපත්
ලබා ගැනීමේ බිල්පත - රු. 6688.00

**35. එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**
RA 8570 ට්‍රැක්ටරයේ මයිලෝ මීටරය සඳහා කේබලයක් දැමීමේ බිල්පත - රු. 950.00

**36.ලක්දිවි එන්ටර්ප්‍රයිසස්,උඩුගම පාර,කොට්ටවගම**
කොම්පෝස්ට් අංගනය සඳහා අවශ්‍ය ප්ලාස්ටික් හෝස් 1ක් මිලදී ගැනීමේ බිල්පත-රු. 845.00

**37.දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම**
යූ.වී.මධුර ප්‍රභාත් මයා -රු.221340.00

**38.එම්.වී.නාමල් ලක්රුවන් මයා**
ගෝනදෙණිය රුක්මල්ගහදෙණිය මාර්ගයට වැටී ඇති පස්කණ්ඩිය
බැකෝ යන්ත්‍රය යොදා ඉවත් කිරීම -රු. 5250.00

**39.ලක්රුවන් සම්පත් මයා,උඩවැලිවිටිය,නාගොඩ**
උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරනඩ මාර්ගය සම්බන්ධව ගොනු වී ඇති
එල්.15888 දරණ නඩුව සඳහා වියදම් වූ නීතීඥ ගාස්තු සහා අනුමැතියට යටත්ව ගෙවීම -රු.20000.00

**40.ඊ.ඒ.සමන් කුමාර එදිරිසිංහ මයා,උඩුගම**
252-6478 දරණ කැබ්රථයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ බිල්පත ගෙවීම -රු.7090.00

**41.තල්ගස්වල ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස්,තල්ගස්වල**
252-6478 දරණ කැබ්රථයේ අලුත්වැඩියා කටයුතු බිල්පත ගෙවීම -රු. 2275.00

**42.ටී.ජී.සුමනසිරි මයා,නාගොඩ,**
නාගොඩ ත්‍රීරෝද රථ ගාලෙහි කැටගල් ඇල්ලීමට හා මාර්ග නාමපුවරු සවිකිරීමට
සිමෙන්ති ලබාගැනීමේ බිල්පත -රු.2940.00

**පොදු අරමුදල් කර්මාන්ත**
**43. ආසිරි ජොෂ්ඨ පුරවැසි සංවිධානය, මහජන බැංකුව**
ප්‍රධාන කාර්යාලයේ සභාපති නිල කාමරය හා පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ
මුදල් ගෙවීම - රු. 48203.33

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

vii. 2020 සංවර්ධන සැළැස්ම සභාගත කිරීම
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ix 2020 වර්ෂයට අදාල නාගොඩ ප්‍රාදේශීය සභා අයවැය සභා අනුමැතිය සඳහා යෝජනා කරමි.

- ❖ සභාපතිතුමා අයවැය ඉදිරිපත් කිරීම

සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු උප සභාපතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ලේකම්තුමිය, අපි ගිය ගමන් මගේ එලබෙන 2020 වර්ෂයට මේ ප්‍රාදේශීය සභාවෙන් වියයුතු සේවාවන් පිළිබඳව. සංවර්ධන ක්‍රියාවන් පිළිබඳව, අපෙන් වියයුතු කරුණු කාරණා පිළිබඳව. අපි කවුරුත් දැනුවත්ව ඉන්නෙ. ප්‍රාදේශීය සභාවක් හැටියට අපි ඉදිරිපත් වෙනකොට ඒ ප්‍රාදේශීය සභාවෙ අයවැය ලේඛනයක් ඉදිරිපත් කරනවා. ඒ අනුව 2019 අවසන් වෙලා. 2020 සඳහා වූ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ අයවැය අද ඉදිරිපත් කරන්න යෝජනා වෙලා තියෙන්නෙ. ඒ අනුව ගරු උප සභාපතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ාල ගෙන් මම අවසර ඉල්ලා සිටිනවා. මේ අවස්ථාවෙ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ 2020 වර්ෂයේ අයවැය වාර්තාව ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමාගේ අයවැය පනිවුඩය**

ආදිකාලීන මානවයාගේ පටන් නූතන මිනිසා දක්වා. සමස්ථ ජනසමාජයම ඉදිරියට දෝලනය වූයේ. ඔවුනොවුන් විසින් ක්‍රියාවට නංවන ලද හෝ අනුගමනය කරන ලද සම්ප්‍රදායන් සංස්කෘතික හා නෛතික ක්‍රියාදාමයන් ඔස්සේය යන්න මාගේ හැඟීමයි. අතීත මානවයාට වඩා නූතන මිනිසාගේ ක්‍රියාකාරීත්වය හා පරිපාලනමය හැකියාව යම් විද්‍යාත්මක පදනමක් මත පදනම් වී තිබීම විශේෂ ලක්‍ෂණයක් ලෙස පෙන්නුම් කරයි. ඒ තුලින් ගම නගරය මෙන්ම ප්‍රදේශය කේන්ද්‍ර කරගත් පරිපාලන ඒකක පිහිටුවා ගෙන තිබේ. එසේ ගම් රැසකින් සැදුම් ලත් ප්‍රදේශයක් ප්‍රාදේශීය සභාවක් වශයෙන් ස්ථාන ගත කොට ඇත. ප්‍රාදේශීය සභාව මගින් නා නා විධ මානව වර්ගයාගේ පොදු උපයෝගීතා සේවාවන් විෂයෙහි ප්‍රමුඛතාවයක් ලබා දීම විශේෂ ලක්‍ෂණයකි. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජන ජීවිතය විධිමත් කිරීම තුලින් ඔවුනොවුන්ගේ කායික මානසික සංවර්ධනය මෙන්ම භෞතික වටපිටාවද පෝෂණය කොට සංවර්ධනය කිරීම අපේක්ෂිතයි. මෙහිදී සභාව සතු මූල්‍යමය වත්කම් හා ආදායම් වියදම් පිළිබඳව විශේෂ අවධානය යොමුකරවීම අතිශය වැදගත් වගකීමක් වනු ඇත. සභාව සන්තකව පවත්නා චංචල නිශ්චල දේපොළ මෙන්ම මූල්‍යමය තත්වයන් හරියාකාරව කළමනාකරණය කරවීම වාර්ෂික අයවැයක් මගින් අපේක්ෂිත ප්‍රධාන අරමුණකි. 2020 වර්ෂයේ ඉදිරිපත් කෙරෙන අයවැය සම්බන්දයෙන් සුබ පැතුමක් එක් කිරීමට ලැබුනු මේ අවසරය අතිශය සතුටට කරුණක් සේ විශ්වාස කරමි. ඒ අනුව සභාපතිවරයා වශයෙන් මේ සඳහා ක්‍රියාකාරීව මැදිහත් වූ සියලුම පාර්ශවයන්ට මාගේ හොඳහිත ප්‍රධානය කරමි. නාගොඩ ප්‍රාදේශීය සභාවේ පොදුජන එක්සත් පෙරමුණ බලය පිහිටු වීම මගින් සියලු අරමුණු ඉටුකර ගත නොහැකි වුවද ගත වූ කාල පරිච්ඡේදය තුල යම් සාධනීය වෙනසක් ඇති කරවීමට මාහට හැකියාව ලැබුනි. සභාව සතු අදහස් යෝජනා සංවර්ධන ව්‍යාපෘතිවල විශාල වශයෙන් තිබුනද ඒවා ක්‍රියාවට නැංවීමට තරම් ආදායම් එකතුවක් සභාව සතු නොවීම බලවත් අඩුපාඩුවක් සේම කණගාටුවට කරුණක් සේ සිතමි. එහෙත් සභාව විසින් ක්‍රියාවට නංවන ලද සියලු ව්‍යාපෘති මෙන්ම සේවාවන්ද අඛණ්ඩව ඉදිරියට කරගෙන යෑමට අපට ශක්තිය ලැබුනි. ප්‍රාදේශීය සභාව සතු අතුරු මාර්ග පිළිසකර කරවීම නඩත්තුව මාර්ගස්ථ විදුලි පහන් සවි කිරීම හා නඩත්තු කටයුතු කැලි කසල බැහැර කරවීම හා ප්‍රතිචක්‍රීකරණය කරවීම හා කලට වේලාවට සභාවාර පැවැත්වීම. සතිපොළ නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු පෙරපාසල් අධ්‍යාපනය වැඩිදියුනු කරවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම පාලම් ඇල වේලි අමුණු ආදිය පිළිසකර කරවීම හා බොහොමයක් කටයුතු පවත්වාගෙන යෑමට සභාව සතු සියලු ශක්තීන් උපයෝගී කරගත්බව අවිවාදයෙන් සඳහන් කරනු කැමැත්තෙමි. එහෙත් මහා පරිමාණ මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ අධික මූල්‍ය පිරිවැයක් යොදවා කරන ලද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට නොහැකි වීම අපගේ නොහැකියාවක් නොව රටේ පැවති දේශපාලන බල තුලනයේ විශමතාව නිසා සිදුවූවක් ලෙස කණගාටුවෙන් වුවද සඳහන් කරනු කැමැත්තෙමි. නාගොඩ ප්‍රාදේශීය සභාවට අත්‍යවශ්‍ය අංගයක් ලෙස ඉතා දීර්ඝ කාලයක සිට කතා බහට ලක්වූ ආදාහනාගාරයක් ස්ථාපිත කරවීමට පසුගිය වසරේ යෝජනා අතර ප්‍රමුඛ යෝජනාවක් වුවද එය ක්‍රියාවට නැංවීමට

ප්‍රමාද වීම බලවත් අඩුවක් ලෙස අවංකවම පිළිගත යුතුව තිබේ. එහෙත් මා විසින් දරන ලද උත්සාහයේ ප්‍රතිඵල මේවන විට ලැබී තිබීම අතිශය සතුටට කරුණකි. මේ සඳහා අවශ්‍ය භූමිය ලබා ගැනීමේදී පසුගිය රජයේ හිටපු ඉඩම් අමාත්‍ය ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා ලබාදුන් සහයෝගය මේ අවස්ථාවේ මහත් ගෞරවයෙන් සිහිපත් කරමි. එමෙන්ම මෙම ආදාහනාගාරය ඉදිකිරීමට අවශ්‍ය ලක්ෂ 200 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට හිටපු පළාත් පාලන අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමා මැදිහත්වී ලබාදුන් සහයද ගෞරවයෙන් සිහිපත් කරමි. ඒ වෙනුවෙන් එම දෙපලට දේශපාලන භේදයෙන් තොරව අවංකව ස්තූතිය පුද කරනු කැමැත්තෙමි. යෝජිත ආදාහනාගාරය සඳහා අවශ්‍යවෙන සෙසු කරුණු අතර ප්‍රධාන වූයේ සුදුසු භූමියක් ශක්‍යතා අධ්‍යනයකින් යුතුව වෙන්කර ගැනීමයි. එම කාරණයද මේවන විට අවසන් කර තිබෙන බැවින් අදාල ව්‍යාපෘතිය 2020 වර්ෂය තුල ස්ථිර වශයෙන්ම ක්‍රියාවට නැංවීමට හැකිවනු ඇත. තවද මේවන තුරු සභාව පරිහරණය කළ සමහර දේපොළවල නීත්‍යානුකූල අයිතිය සභාව සතු නොවීමෙන් එම දේපොළවල සංවර්ධන කටයුතු සිදු කිරීම ගැටලුකාරී වූ නිසා එම දේපොළ සභාවට නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට හැකිවීම සහ සභාවට අලුතින් ඉඩම් කිහිපයක් පවරා ගැනීමට හැකිවීම මා ලැබූ ජයග්‍රහයක් යයි මා සිතමි. ඉදිරියේදී එම ඉඩම්වල සංවර්ධනයන් සිදුකොට සභාවට ආදායමක් ලබා ගැනීම මගේ බලාපොරොත්තුවයි. මීට අමතරව ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් රාශියක් න්‍යාය පත්‍රයට ඇතුලත් කොට ඇත. විශේෂයෙන්ම මේවන විට පැවති රජය වෙනස්වී අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් හා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලනයක් හා රජයක් ස්ථාපිත වී ඇති බැවින් රටේ පාලනයත් සභාවේ පාලනයත් එකම පක්ෂයක වීමෙන් ඉදිරියේදී ඉතා වාසි සහගත තත්වයක් උදාවෙනු ඇතැයි යන්න මාගේ ඒකායන අපේක්ෂාවයි. එමෙන්ම ගාලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අපගේ දිස්ත්‍රික් නායක වතු කර්මාන්ත හා අපනයන කෘෂි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා ගරු අධිකරණ මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය මොහාන් පී සිල්වා යන අමාත්‍යවරුන්ගේ ආශිර්වාදය නියත වශයෙන්ම අපට හිමි වෙනු ඇත. තවද අපට නායකත්වය දෙමින් නිතරම අප දිරිමත් කරන හිටපු පළාත් සභා නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමා ඇතුලු ගාල්ල දිස්ත්‍රික්කයේ පක්ෂ ප්‍රති පක්ෂ සියලු මන්ත්‍රීතුමන්ලාගේ ආශිර්වාදයත් හොඳ හිතත් ලබා ගනිමින් ලබන වර්ෂය තුල අපගේ සභාවේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර දීමට බලාපොරොත්තු වෙමි. එමෙන්ම සභාවේ කටයුතු හා අවශ්‍යතාවයන් නිසියාකාරව ඉටු කිරීමට නිරන්තර උපදෙස් ලබා දෙමින් කටයුතු කරන පළාත් පාලන කොමසාරිස්තුමා හා පළාත් පාලන සහකාර කොමසාරිස් තුමියද අගය කරනු කැමැත්තෙමි. 2020 අයවැය කටයුතු වෙනුවෙන් වෙහෙසී ක්‍රියා කළ සැමටත් සභාවේ උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන්ටත් මන්ත්‍රීතුමියන්ටත් සමස්ථ කාර්යය මණ්ඩලයටත් ස්තූතිය පුද කරමින් මාගේ අයවැය සංදේශය නිමා කරමි. ඔබ සැමට 2020 වසර සුබ නව වසරක් වේවා!

නිමල් වික්ටර් නාගොඩ විතාන.<br>
සභාපති<br>
නාගොඩ ප්‍රාදේශීය සභාව.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2020 අයවැය ගරු සභාව විසින් පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා 2020 අයවැයට විපක්ෂව යෝජනාවක් ගෙනෙන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිර කරන ලදී**

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමනි මේ වෙලාවෙ 2020 අයවැය සභාවට ඉදිරිපත් කළා. ඒ ගැන අපි සභාපතිතුමාට ස්තුති වන්ත වෙනවා. මේ පිළිබඳව අපට කරුණු දක්වන්න තියෙන්නෙ. ඇත්තටම අපි ගිය සැරේ විපක්ෂව ඡන්දය දුන්නා. නමුත් මේ යෝජනා දිහා බැලුවට පස්සෙ, මේ සැරේ අපි පක්ෂයි කියන කතාව නෙවෙයි. මේකට හේතුවක් කියන්න ඕන. මම ක්ෂණිකව මේක එපාය කියන කතාව කියල හරියන්නෙ නැහැ. දැන් යෝජනාව සභාවට ගෙනාවා. අපි කියනවා අපි විරුද්ධයි කියලා. අපි කියනවා මෙන්න මේ හේතුව නිසා විරුද්ධයි. ඒක වෙනත් කරුණු යටතේ මට කියලා තේරුමක් නැහැ. මේක සම්මත වුනාට පස්සෙ අපිට වෙනත් කරුණු යටතේ කතා කරන්න දෙයක් ඉතුරුවෙන එකකුත් නැහැ. මම 2019 අයවැය වාර්තාව ගෙනාවා. මම බැලුවා ගිය සැරේ ගෙනාපු පළවෙනි යෝජනාව මේ සැරෙත් තියෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ අපිට කියන්න ඕන. අපි ගිය සැරේ ඇත්තටම යෝජනා දීල තියෙනවා. නමුත් ක්‍රියාත්මක වෙලා නැහැ. එවකට තිබුන රජය විසින් ප්‍රතිපාදන වෙන් කරන ලද, මම හිතන්නෙ සාමාන්‍යයෙන් කෝටි දෙකක විතර යෝජනා දීල තියෙනවා. ඒ තුල තමයි යම්කිසි සංවර්ධනයක් වුනේ. ඒ ගැන සභාවක් හැටියට තමුනාන්සෙල අපි සියලු දෙනාම සතුටු වෙන්න ඕන. නමුත් අපි කණගාටු වෙනවා දැන් දෙවෙනි අවුරුද්ද යන්න හදන්නෙ. දෙවෙනි අවුරුද්ද තුලවත් ප්‍රති පක්ෂයේ මම හිතන්නෙ කිසිම කෙනෙකුට එකම සංවර්ධන යෝජනාවක්වත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒක නිසා තමුන්නාන්සෙ මේ අවුරුද්දත් ඒකමද කල් මරන්නෙ කියන එක ප්‍රශ්නෙ තියෙන්නෙ. අපි මේ සැරේ ඔබතුමාට පුංචි සහයෝගයක් හැටියට අපි ඡන්දෙ දෙනවයි කියන කතාව නෙවෙයි. ප්‍රති පක්ෂයක් හැටියට අපි හැමදේකදිම සහයෝගය දීල තියෙනවා. ඒ සහයෝගය දීපු එකේ ප්‍රතිඵලයක් හැටියට අපි බලාපොරොත්තු වුනා. පහුගිය වසර තුල අඩු ගානෙ වීථි ලාම්පුවකින් හරි ඒ කටයුත්ත සිද්ද වෙයි කියල. නමුත් සිද්ද වුනේ නැහැ. අපි හිතනවා සමහර වෙලාවට තමුන්නාන්සෙ දකිනව ඇති. අපි ගියසැරේ අයවැයට විරුද්දයි මොකටද වැඩකරන්නෙ කියලා. තමුනාන්සෙට එහෙම කරන්න බැහැ. මොකද සමස්ථයක් අපේ ප්‍රජාව වෙනුවෙන් ඒ යෝජනා ගෙනැල්ලා තියෙන්නෙ. අන්න ඒක නිසා මේ වෙලාවෙ අපි ඉල්ලීමක් කරනවා. ප්‍රති පක්ෂයක් හැටියට මත විමසුමකට යමු. එතනදි අපි තමුනාන්සෙට දක්වන්නෙ මොකක්ද කියන එක මත විමසුමකින් පෙන්නන්නම්. ඡන්දෙකට යමු ඒකයි මම යෝජනා කරන්නෙ. ගරු සභාපතිතුමනි, අයවැය පිළිබඳ අදහස් දක්වන්න බැරිද? අපි සාධාරණ පැත්තෙන් එන්න හැදුවෙ. අපි කියනවා එහෙමනම් පක්ෂ නැහැ කියලා. එහෙමනම් මත විමසුමකට, ඡන්ද විමසීමකට යන්න. සභාපතිවරයාට මම මේ කරුණු දක්වලා සාධාරණ පැත්තකට යන්න හැදුවෙ. ඒකට ඉඩ දෙන්නෙ නැත්නම් ඒකට විරුද්ධනම් එහෙමනම් අපි කියනවා සම්මත කරන්නෙ නැහැ කියලා. කරුණු දක්වල ඔබතුමාට යම්කිසි පනිවිඩයක් දෙන්න හැදුවෙ. මෙතන විතරක් නෙවෙයි පාර්ලිමේන්තුවෙත් අයවැය තුල පනිවිඩයක් දෙනවා. කොහොමත් ආණ්ඩු පක්ෂය අයවැය සම්මත කර ගන්නවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ගරු මන්ත්‍රීතුමන්ලා මම ඉදිරිපත් කළේ මගේ පනිවිඩය. ඔබතුමන්ලට අයවැය වාර්තාව ලබා දුන්නා කියවන්න. අනිත් එක මේ වාර්තාව කියවන්න ගියොත් සෑහෙන කාලයක් ගත වෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා උප සභාපතිතුමනි මේක සහයෝගෙන් කටයුතු කළයුතු කාලයක්. මෙතුම කිව්ව වගේ මේ අවුරුද්දෙ සමහර ඒව වෙන්න නැතුව ඇති. ආර්ථික ප්‍රශ්න හා වෙනත් ප්‍රශ්න තිබුන නිසා. අපි බලාපොරොත්තු වෙනවා 2020 වර්ෂයේ ඒ කටයුත්ත කරන්න. මොකද අපි මේ අවශ්‍ය යෝජනා දාන්නෙ. නොකෙරුණානම් ආපහු ඒ යෝජනාව දානවා. එහෙම තමයි දිගටම සිදු වුනේ. මොනම හරි යෝජනාවක්, ඒක අපි අවශ්‍ය යෝජනාවක් හැටියට සලකල තමයි කටයුතු කරන්නෙ. ඉතිං ඒක නොවුනාම ආපසු ඒ යෝජනාවම දානවා. ආදාහනාගාරය කියමු අපි ඒක හැමදාම යෝජනා කරනවා. දෙවියන්ගෙ පිහිටෙන් ලබන වසරෙ ඒකෙ කටයුතු සිදු වේවි. අන්න ඒ වගේ එහෙම තමයි අපේ අදහස තිබුනෙ. මමත් සභාවෙ 2002 ඉදල ඉන්නවා. අයවැයක් ඉදිරිපත් කරනකොට ඇත්තටම මේ

යෝජනා 100 ක් ඉදිරිපත් කරනකොට යෝජනා එකයි දෙකයි ඉටු වෙන්නෙ. ඇත්තටම පසුගිය කාලෙ ඔය යෝජනා කරගන්න බැරිවුනේ කාලගුණයත් එක්ක. ඊලගට ආර්ථික තත්වෙ සහ අපි කළ යෝජනා වෙනත් ආයතන මගින් කෙරිල තියෙන නිසා. ඒක තමයි ඇත්ත කතාව. ඉතිං මේ අවස්ථාවෙ ඔබතුමාලට මේ අයවැය පිළිබඳව වැරදි වැටහීමක් හෝ මොකක් හරි තියෙනවා නම්, මම අපට ඡන්දය ඉල්ලන්නෙ නැහැ. ඒක ඔබතුමාලගෙ කැමැත්ත ප්‍රශ්නයක් නැහැ. මොකද මට පක්ෂව දෙන්න කියල මම කාටවත් බල කරන්නෙ නැහැ. තමන්ගෙ කැමැත්ත ප්‍රකාශ කරන්න. මොකද මේක විවෘත්තව කතා කළ යුතු දෙයක්. අර සාම්ප්‍රදායික අයවැය ඉදිරිපත් කිරීමක් වගේ වෙන්න ඕන නැහැ. සමහර ප්‍රාදේශීය සභාවල අයවැය වෙලාවෙ අපි දන්නවා මහා විනාශකාරී දේවල් වෙනවා. අපේ මෙච්චර කල් එහෙම වුනේ නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්**

මේ විසි හත් දෙනාටම අදහස් දැක්වීමේ අයිතියක් තියෙනවා. මේ සේරම ඇවිල්ල හරි අපිත් එකඟයි අපිත් එකඟයි කියල යන්න තරම් මෙතන මොංගල් කට්ටිය නැහැ. අපි මේ සභාවෙ අඩුපාඩුවක් හැටියට කියනවානම්, අපි ලක්ෂ ගණනක සල්ලි ගෙනැල්ලා. මේ ප්‍රාදේශීය සභාව සතු පාරවල් සංවර්ධනය කරල තියෙනවා. එහෙමනම් මේකෙ ඒ ගැන සඳහන් වීමක් තිබුනෙ නැහැ. එහෙමනම් ඒකත් සඳහන් විය යුතුයි. අපි කෝටි ගණනක පාලම් බෝක්කු නොයෙකුත් දේ ගෙනත් තියෙනවා. ඒකෙ ගරුත්වය එන්නෙ සභාවට. ඉතිං ඒක නිසා අපි මෙන්න මෙච්චර කොටසක් ඔබතුමාගේ අයවැයට පරිභාහිරව මේ සභාවේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරල තියෙනවා කියන එක ගැන කරුණු දක්වන්න තමයි සූදානම් වුනේ. එතකොට පසුගිය දවස් වෙනකම් පැවති රජයට ස්තූති වන්ත වෙන්න ඕන. ඒකයි අපි කියන්න හැදුවෙ. මේ කට්ටියට මෙතන මේ පුහුණුව අද ලැබෙන්නෙ නැත්නම් ඊලග සභාවෙත් මොංගල් වේවි. මේකෙදි පුහුණුවකුත් වෙනවා. අලුත් මන්ත්‍රීවරියො මන්ත්‍රීවරු ඉන්නවා. ඒ කට්ටියට අයවැය කියන්නෙ මොකක්ද කියල දැන ගන්න ඕන. මම පැහැදිලිව කිව්වා තමුන්නාන්සෙට හානියක් නොවෙන පැත්තටෙයි කතා කරන්නෙ කියලා. වෙනත් සභාවක අයවැයක් ඉදිරිපත් වෙනකොට මේ මන්ත්‍රීවරු ගිහිල්ල බලාගෙන හිටියොත් මොකක්ද වෙන්නෙ කියන එක, අපි මෙතන ගහ බැන ගෙන නැහැ. මෙතන මොංගල් වගේ අත උස්සල යන්න ආවෙත් නැහැ. ඒකයි මම කිව්වෙ සභාපතිතුමා, ඔබතුමා කිව්වා වගේ මේකෙ තියෙන අඩුපාඩු කියන්න ගියොත් අපට හැන්දෑවෙ පහ වෙනකම් ඉන්න වෙනවා. අපිත් ඒ කාලෙ ඔක්කොම කියාගෙන යන්නෙ නැහැ. නමුත් නියම විදිහට නම් සභාවට සියල්ල ඉදිරිපත් කරන්න ඕන. නමුත් අපි ඒක කියන්නෙ නැහැ. හැන්දෑවෙ පහ වෙනකම් මෙතනට වෙලා ඉන්න බැරිනිසා. කවුරු කවුරුත් දැන් අවුරුද්දක් පුහුණු වෙලා තියෙන්නෙ. මම ගිය අවුරුද්දෙ අයවැය වාර්තාව ගෙනාවා. ගිය අවුරුද්දෙ අයවැය වාර්තාව ගෙනාවෙ නිකන් නෙවෙයි. හදසියෙ ප්‍රශ්නයක් ආවොත් එකින් එක උත්තර දෙන්න හිතාගෙන. ගිය වකවානුව තුල අපි පොඩ්ඩනම් වැඩ කරල තිබුනෙ සභාපතිවරයටත් ඔබගේ කණ්ඩායමටත් යම්කිසි දැනුමක් එනවා. මෙන්න මේ අඩුපාඩුව අපි සකස්කරගත යුතුයි කියන එක. මෙතනදි මම ඒකයි කියා දෙන්න හැදුවෙ.

**ගරු සභාපතිතුමනි 2020 අයවැය සම්මත කර ගැනීම සඳහා බෙදීමක් අවශ්‍යයි. යනුවෙන් ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා බෙදීමක් ඉල්ලා සිටින ලදී.**

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

මම ඉදිරිපත් කළ අයවැය පිළිබඳව අපේ ප්‍රතිපක්ෂ මන්ත්‍රීවරු යම් අදහස් ඉදිරිපත් කිරීමක් කළා. එතුමන්ලාට අයවැය පිළිගැනීමට නොහැකියාවද? ඒ පිළිබඳ විරෝධතාවයක්ද? මම දන්නෙ නැහැ. මේ සඳහා මත විමසුමක් අවශ්‍යයි. සභාපති හැටියට මම ඉදිරිපත්කළ අයවැය පිළිබඳව පක්ෂනම් අත ඔසවා කැමැත්ත ප්‍රකාශ කරන්න.

ඒ අනුව සභා ලේකම්වරිය විසින් ඡන්ද විමසීම සිදුකළ අතර අයවැයට පක්‍ෂව ඡන්ද 19 ක් හිමි වූ අතර විපක්‍ෂව ඡන්දය ප්‍රකාශ නොවුනි. ඡන්දය දීමෙන් වැලකී සිටි සංඛ්‍යාව 08 කි.

**අයවැයට පක්ෂව ඡන්දය ලබා දුන් මන්ත්‍රීවරුන්**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 5. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 6. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 7. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 8. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 9. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 10. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 11. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 13. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 14. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 15. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 16. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |

**අයවැයට ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරුන්**

| | | |
|---|---|---|
| 1. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 2. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 3. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 4. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 6. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 7. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 8. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**ඒ අනුව නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2020 අයවැය වැඩි ඡන්ද 19 කින් සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

(ඉ) 2. **ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**01. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. උඩවැලිවිටිය හා කැප්පිටියාගොඩ යා කරන කොන්ක්‍රීට් පාලම ඉතා අබලන් තත්වයේ ඇති බැවින් ගමනාගමනයට නුසුදුසු තත්වයට පත්ව අවධානමකට ලක්ව ඇත. එබැවින් මෙම පාලම කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම හෝ අලුතින් පාලමක් ඉදි කිරීමට හෝ මහාමාර්ග අමාත්‍යාංශය දැනුවත් කොට සුදුසු පියවරක් ගැනීමට යෝජනා කරමි.

ii. උඩවැලිවිටිය ප්‍රජා ශාලාව පිහිටි සම්පූර්ණ ඉඩම මීට පෙර ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් මැන වෙන්කොට නාගොඩ ප්‍රාදේශීය සභාවට පවරා ඇත. එම භූමිය නිරවුල් කොට ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට යෝජනා කරමි.

iii. නාගොඩ පාලම අසළ සිට රැකඩහේන දක්වා මාර්ගය පුළුල් කොට කාපට් යොදා සංවර්ධනය සඳහා මහාමාර්ග අමාත්‍යාංශයට ඉල්ලීමක් කිරීමට යෝජනා කරමි.

iv. උඩවැලිවිටිය ප්‍රජා ශාලාවේ 2020 වෙනුවෙන් පෙරපාසලක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

I. කැටගොඩ එක්සත් මාර්ගය සංවර්ධනය කිරීම - රු. 10000.00

**ඉහත සඳහන් මාර්ගය සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**(ඊ) කාරක සභා වාර්තා**

i. ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම.
**ප්‍රසම්පාදන කමිටුව මගින් ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ගරු සභායට යෝජනා කළ අතර ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2019 නොවැම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරංශය සළකා බැලීම සඳහා දෙසැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 නොවැම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරංශය සළකා බැලීම සඳහා දෙසැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 නොවැම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා දෙසැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**පසුගිය සභා රැස්වීමේදී ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් කොම්පෝස්ට් පොහොර අස්ථානගතවීමක් සම්බන්ධව කරන ලද ප්‍රකාශය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර, ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට කරුණු පැහැදිලි කිරීම**

මෙහිදී ගරු සභාපතිතුමා විසින් කරුණු පැහැදිලි කරමින් කියා සිටියේ, සහබන්දු ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සභාවෙ මතුවුන පොහොර අස්ථානගතවීම පිළිබද ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි අදාල පුද්ගලයන් කැඳවලා ඇහුවා. ඒකෙදි ඒ අදාල නිලධාරීන් සහ සේවකයන් කැඳවලා අහන කොට එහෙම දෙයක් නොවුන බව තමයි අපේ විමර්ශනයෙදි හැගුනේ. මොකද කොම්පෝස්ට් නිෂ්පාදනය

එදා ඉදල සිදු කළ විදිහට තමයි ඒ කටයුතු අදටත් කෙරෙන්නෙ. ඔය කිලෝ 350 ක නැතිවීම පිළිබඳව දැන ගන්න කරුණු තිබුනෙ නැහැ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි ගරු සභාවෙ මේක අභූත චෝදනාවක් වෙනවා. පැහැදිලිවම මම දන්නෙ නැහැ. මේ වැඩකරපු අයගෙ පොටෝ එකක්වත් නමක්වත් දැනගෙන නෙවෙයි. එතන වුන සත්‍ය සිද්දිය හා එතන කතා වුන සියල්ලම තමයි මම මෙතන ප්‍රකාශ කළේ. ඊලගට අපට මේක සොයා ගන්නවා නම් අපි සාමාන්‍යයෙන් දිනකට කොපමණ නිෂ්පාදනය වෙනවද? උදාහරණයක් විදිහට අපි හිතමු ගිය සතියෙ සඳුදා ඉදල සිකුරාදා වෙන කොට කිලෝ 100 ක් නිෂ්පාදනය වෙලා, ඒකෙන් යම් ප්‍රමාණයක් බදාදා එක්කො විකුණලා තියෙනවා. එක්කො මෙහේට භාරදීල තියෙනවා. මොකක් හෝ ක්‍රමවේදයක්. ඊටපස්සෙ බ්‍රහස්පතින්දා සිකුරාදා නිෂ්පාදනය කොපමණද කියන එක අපට හොයා ගන්න පුලුවන්. මේක එතකොට අද ඊයෙ කටයුත්තක් නෙවෙයි. පැහැදිලිව දිනකට මෙතන ස්ටොක් එක කොපමණද කියලා නිලධාරියෙක්ගෙන් හෝ සේවකයගෙන් අනිවාර්යයෙන් එන්න ඕන. එතකොට පොහොර එනවයි කියල තියෙනවා නම් බොහොම සරල දෙයක් මේක. එතකොට මම දැනගන්න කැමතියි මේ කියන දවස වෙනකොට ඔතන ස්ටොක් එක කොච්චර තිබිලා තියෙනවද කියලා. තමුන්නාන්සෙල වාර්තාවක් හැදුවනම් වාර්තාවෙ ඇති. ඕක හරියටම හොයා ගන්නනම් අපි හිතමු අවසාන ස්ටොක් එක භාර ගැනීමෙදි මෙතන තිබුන කිලෝ 100 ක් කිලෝ 100 සභාවට භාරදීලා හෝ විකුනල තියෙනවා. උදාහරණයක් කියන්නෙ මේ 10 වෙනිද විකුනල තියෙනව නම් 10 වෙනිද ඉදල අපි ඔය කියන දවස වෙනකම් කොපමණ නිෂ්පාදනය වෙලා තියෙනවද? ඒ නිෂ්පාදනය වෙලා තියෙන ගණන එක කම්කරුවෙක් හෝ දෙදෙනෙක් යොදවල නිෂ්පාදනය කරන්නෙ. එක් අයෙකුට කිලෝ දෙකනම් දෙදෙනෙක් නම් හතරයි. එතකොට ඒ නිෂ්පාදනය එහෙමනම් මෙතන තිබේද? මේ පරීක්ෂණය කරන්න නම්, ඊලගට මම ඕක පරීක්ෂණය වහන පැත්තත් මෙතන කියන්න යන්නෙ නැහැ. පරීක්ෂණයක් වහන හැටි ඕන නම් පෞද්ගලිකව ප්‍රධාන තුන්හතර දෙනා ගාවදි කියන්නම්. ඉතිං ඒක නිසා ඒ පුද්ගලයම මෙතන ප්‍රකාශයක් කරනවා නම් කෝ මම ඊයෙ පෙරේදා හදපු පොහොර ටික නැහැ කියලා කියනව නම් වෙනත් සාක්ෂි කුමටද? මේකට සාක්ෂිත් නැහැ දැන් මේක දිගටම ගියොත් යම් යම් පුද්ගලයො අපහසුතාවයට පත්වෙනවා. ඒක නිසා මම ඔය පරීක්ෂණ වාර්තාව සභාවට ඉදිරිපත් කරනවා නම් වචනෙන් ප්‍රතික්ෂේප කරයි කියන එක හරියන්නෙ නැහැ. මෙන්න 10 වෙනිද වෙනකොට අපට ස්ටොක් එක කිලෝ 100 ක් පෙන්නල තියෙනවා. ඒ කිලෝ 100 විකුනලා තියෙනවා. එහෙම නැත්නම් ආයතනයට භාර ගෙන තියෙනවා.10 වෙනිද ඉදල 15 වෙනිද වෙනකම් මෙන්න මෙපමණ කිලෝගණනක් භාරගෙන තියෙනවා. එතකොට මෙතන කිලෝ 50 ක් ඉතිරිවෙලා තියෙනවා. ඊට පස්සෙ පනහ පනහ දවස් තුනක් නිෂ්පාදනය කරල තියෙනවා. එතකොට 200 ක් අනිවාර්යයෙන් තියෙන්න ඕන. එහෙම නම් ඉස්සෙල්ල මගේ පනිවිඩය ලැබිච්ච වෙලාවෙ ගිහිල්ල තියෙන ප්‍රමාණය ස්ටොක් ගන්න ඕන. ඕක තමයි කෙරෙන්න ඕන. එහෙම කෙරුනද? එහෙම ගත්තානම් එතකොට 200 අපි සටොක් එක අරගෙන තියෙවා. අවසානයේ විකිනීම හෝ මෙතනට භාරදීම සිදුවෙලා තියෙනවා. එතකොට මේ දිනයෙ මේ ගණන තියෙන්න ඕන. එතකොට මෙතන පැහැදිලිවම නිලධාරියෙක් ඉන්නවා නම් ඔහු දැනගෙන සිටිය යුතුයි. දිනකට මේ කම්කරුවා විසින් පොහොර කොපමණ නිපදවනවාද? කියන එක. එතකොට ඒ නිෂ්පාදනය තිබේද? අන්න ඒ වගේ පරීක්ෂණයකින් තමයි මේක හොයා ගන්න පුලුවන් වෙන්නෙ. නැතුව අපි ගෙන්නුවම කියනවා අපේ අතින් එහෙම දෙයක් වුනේ නැහැ කියලා. තව කෙනෙක් කියනවා අපි දන්නැහැ කියලා. මම කියන්නෙ නැහැ වැඩකරපු කම්කරුවා කෙලින්ම මේකට වගකිව යුතුයි කියලා. එයා සිකුරාද ඇවිල්ල වැඩ කරලා ගිහිල්ලා සඳුදා ඇවිල්ලා මෙතන බඩු කෝ කියල ඇහුවෙ? එතකොට එක්කො මුරකාරයෙක් හිටියෙ නැහැ. සමහර විට අර සේවකය අහිංසකයෙක් වෙන්න පුලුවන්. ඒක නිසා තමයි බැලුවෙ. බලල ඉවරවෙලා ක්ෂණිකව කියවුනේ

කෝ බඩු නැනෙ කියලා. ඒක නිසා මට කියන්න බැහැ කොයි පැත්තෙන් මේක අස්ථානගත වුනාද කියන එක. මම කියන්නෙ පැහැදිලිවම සිද්දියක් වෙලා තියෙනවා. වෙලා තියෙන සිද්දිය ඔබතුමාල සභාවට ඉදිරිපත් කරනවානම්, මෙන්න පළවෙනිද මෙච්චරයි. දහවෙනිද මෙච්චරයි. දොලොස් වෙනිද මෙච්චරයි. දොලහෙ ඉදල විසිවෙනිද වෙනකම් මෙච්චරයි. කිසිම අඩුපාඩුවක් නැහැ. මේ සභාවෙ ප්‍රකාශ කළාට පස්සෙ අපි ගියා ගිහිල්ල මෙච්චර ප්‍රමාණයක් භාරගත්ත කියලා. අන්න උත්තරේ එකොට අපට කතා කරන්න දෙයක් නැහැ. මෙතන 200 ක් නෙවෙයි 300 ක්ම තියෙනවා. මෙන්න විසි වෙනිද ඉදල සභාව තියෙන දිනේ වෙනකොට මෙන්න මේ වගේ මේ වගේ ගනුදෙනු වෙලා තියෙනවා. ස්ටොක් එක මෙච්චර තියෙනවා. මේවා පොත්පත්වල තියෙන්න ඕන. ඉතිං ඒක නිසාවෙන් එවැනි එකක් ඔය වාර්තාවෙ කිය වෙන්නෙ නැහැ.

**ගරු සභාපතිතුමා නැවතත් පැහැදිලි කරමින්,** ගරු මන්ත්‍රීතුමා ඇත්ත මේකෙ අඩුපාඩු සිදු වෙලා තියෙනවා. අර ඔබතුමා කියන ආකාරයේ අද නිෂ්පාදනය වෙන පොහොර ටික සටහන් වීම් කෙරිලා නැහැ. ඊට පස්සෙ ඔය කියන තැනැත්තා මම දන්නෙ නැහැ කිව්වද කියල. එතන පොහොර නිෂ්පාදනය කරන පුද්ගලයා ගෙන්නල ඇහුවම එහෙම අඩුවීමක් නැහැ කියනවා. මුරකරුවනුත් ගෙන්නල ඇහුව එහෙම දෙයක් අපි දැනුවත්ව වුනේ නැහැ කියනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා තව දුරටත් අදහස් දක්වමින්,** ඔය දෙන්නගෙන්ම අහල වැඩක් නැහැ. සභාපතිතුමනි, මෙතන පොත හදන නිලධාරි මහත්මයා හරි මහත්මිය හරි එයාගෙ ස්ටොක් එක අවසාන දවසෙ, මම දන්නෙ නැහැ. මෙතන කෙරුනද නැද්ද කියන එක. ඒ අවසාන දවසෙ මෙතනට ස්ටොක් එකක් වාර්තාවෙන දවස තියෙනවා. එතකොට ස්ටොක් එකක් වාර්තාවෙන දවස අපි හිතමු 10 වෙනිදනම් තියෙන්නෙ. 10 වෙනිද වෙනකොට කිලෝ 100 ක මෙතනට ස්ටොක් එකක් ඇවිල්ලා තියෙනවා. එතකොට 20 වෙනිද වෙනකොට අලෙවියක් කරලත් නැත්නම් දෛනික නිෂ්පාදනය කිලෝ 10 නම් තව 100 ක් තියෙන්න ඕන.

**ගරු සභාපතිතුමා තව දුරටත් පැහැදිලි කරමින්,** ගරු මන්ත්‍රීතුමා එතන අපේ වරදක් අඩුපාඩුවක් වෙලා තියෙන බව පේනවා. මොකද අපේ නියම ක්‍රමානුකූලව නිෂ්පාදනය කිරීම ගණනය කිරීම් කෙරෙන්නෙ නැහැ. ඒක නිසා මේක පොඩ්ඩක් ව්‍යාකූලයි. ඇත්තටම අපි හොරකමට වංචාවට ඉඩදෙන්නෙ නැහැ. ඒකයි ඒ වෙලාවෙම ගෙන්නලා මම පියවර ගත්තෙ. දැන් බිල් කඩන්නෙ උපකාර්යාලයෙන්. බඩු තියෙන්නෙ එතන. එක්කෙනෙක් බඩු ගෙනියන්න බිලක් අරගෙන යනවා. කිලෝ 50 ක් කියමුකො ඉතිං ඕක දකින මිනිහ ඇහුවම බිල පෙන්වනවා. ඕක තමයි මිනිස්සු හිතන්නෙ ගත්තයි කියලා. තව එක්කෙනෙක් බිලක් නැතුව ගෙනියනවා. ඔන්න ඔය විදිහට වෙනවා. මම කිව්වා ඒක නතර කරන්න. කෙලින්ම උපකාර්යාලයට ගේන්න එතන විකුනන්න එපා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා නැවතත් අදහස් දක්වමින්,** මම උපදෙසක් දෙන්නම්, මම දැන් ඕක පෙන්නුවෙ. මම කිව්වනෙ මට ඇගිල්ල දික්කරන්න බැහැ කියලා. ඇගිල්ල දික්කළොත් කීප දෙනෙක් අපහසුතාවයට පත්වෙනවා. ඔයිට වැඩිය විශාල ආයතනයක් සමුපකාර සමිතියක් කියන්නෙ. අපි ඒකෙ එදා සමුපකාර ප්‍රාදේශිකයක හාල් කිලෝ එකක් අඩුවෙන කොට. හාල් කිලෝ එකක් අඩුයි කියල කියන්නෙ. ඒක මෙතන ඉදගෙන කියන්නෙ. එතනට ගිහිල්ල නෙවෙයි. එතකොට ඉදිකට්ටෙ ඉදල කියන්න පුලුවන්. එතකොට මේක දැන් මෙතන කවුරු හරි සේවකයෙක් ඉන්නවනම්, දෛනිකව අපට පුලුවන් සරලව දවසේ නිෂ්පාදනය හොයා ගන්න. නිෂ්පාදනය අද දවසේ වෙන්නැත්නම් දුරකතනය මගින් අදාල පුද්ගලයට කියන්න මේ ආයතනයට දැනුම් දෙන්න කියලා. අද නිෂ්පාදනය නැත. ඒ අතරතුරේ අපට මේ මහත්මයෙක් හෝ මහත්මියක් යවන්න පුලුවන්. පොත් ටිකක් තියාගෙන. මේසයක් තියාගෙන. මේසෙ වාඩිවෙලා පොත්ටික දිග ඇරලා. අරය කියන එක අද 10 ක් දාන්න. අද 50 ක් දාන්න. අද 60 ක් දාන්න. එහෙම දමන දැමිල්ලක් ඇත්තෙ නැහැ. ඒක නිසා මෙතන මේ කියන්නෙ ආයතනය රකින්න. මටත් සද්ද නැතුව ඉන්න පුලුවන්. මට

ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ ආයතනයෙන් දරුවන්ට නොමිලේ ඇඳුමක් හරි දෙන්නෙ, ඔය නිෂ්පාදනයෙන් කීයක්හරි හෙව්වොත්. ඒක නිසා තමයි මේක රකින්න අපි කතා කරන්නෙ. ඒක නිසා මම උපදේශයක් දෙනවා. දෛනිකව එක කම්කරුවෙක්ද දෙන්නෙක්ද මෙතන නිෂ්පාදනය කරන ප්‍රමාණය. නියම විදිහට නම් හැන්දවෙනකොට තියෙන්න ඕන. එතකොට මේ පොතේ සටහන් වෙනවා. එතකොට යන්න ඕනත් නැහැ. වැඩකරන පුද්ගලාය කියනවා. මම ඔන්න පොහොර කිලෝ 10 ක් පොහොර ගොඩට දැම්මා. ඊට දවස් පහකට පස්සෙ ගිහිල්ල ස්ටොක් ගන්නවා. මාසෙ අන්තිමට අපි ස්ටොක් එකක් ගන්න ඕන කොච්චරද කියලා. එතකොට 100 ක් තියෙනවා. 50 අපි විකුනලා තියෙනවා. 50 ක් මෙතන තියෙන්න ඕන. අඩුනම් මොකක් හෝ සිද්දියක් වෙලා තියෙනවා. කට උත්තර ගන්න වෙනවා. යම් කිසි නිලධාරියෙක් මේ පිළිබඳව මෙතන බැඳී වැඩ කරයි නම් ඔහුද එක්තරා, පොත් හදන හැටි මම මෙතන කියන්නෙ නැහැ. පොතක් හදන හැටි කිව්වොත් ඒක පාරාවලල්ලක් වෙලා ආපස්සටත් එනවා. ඒක හින්ද ඒක කියන්නෙ නැහැ. ඒක ඔබතුමාට පෞද්ගලිකව කියන්නම්. ඒක නිසා ලීකේජ් එකක් වහනවයි කියන එක සිම්පල්. ඒක කම්කරුවා මුරකරුවා ලිපිකරුවා එකතුවෙන එක විතරයි කරන්න තියෙන්නෙ. ඒක නිසා මේ පිළිබඳව අවදානය යොමු කිරීමටත්, මේක නොදැක්කත් හරි දෙයක් නිසාත්, මට ඕනනම් ඒ අය ගෙන්නල පෞද්ගලිකව කියන්න කිව්වොත් කියාවි. ඒක නිසා අවදානය යොමු කරන්න. ආයතනය රැකගන්නනම්, මේ නිෂ්පාදනයෙන් අපි බලාපොරොත්තුවෙන ඉලක්කයට යන්නනම්, දැන් ඇහුවොතින් ගිය මාසෙට අපි කොච්චර නිෂ්පාදනය කරල තියෙනවද? අපි කොච්චර විකුනලා තියෙනවද? කියලා. ඇහුවොතින් මම හිතන්නෙ ඔය ආයතනය පාඩු ඇති. ලාබෙයි කියලත් අපි අතඇරල ඉන්න බැහැ. ලාබෙ අපි වැඩිකර ගන්න ඕන. අන්න ඒ නිසා ඒ කටයුත්ත තමුන්නාන්සෙට යෝජනාවක් හැටියට ගේනවා. මට මේ සේවකයන්ට නිලධාරින්ට දඩුවම් දෙන්නවත් නෙවෙයි. අපේ පුරුද්දක් තියෙනවා හොරකමක් දැක්ක තැන ඒකට එලවල ගිහිල්ල ගහනවා. ඒක නිසා ඒක දැනුවත් කරලා තව මාස දෙකකින් අපි ඇහුවොත් ගබඩාවෙ ස්ටොක් එක කීයද කියල. තමුන්නාන්සෙට හැකියාව තියෙන්න ඕන. අර පොත ගෙනැල්ල අදට ස්ටොක් එක200 ක් තියෙනවා. දැන් ගිහිල්ල සටොක් ගන්න කියන්න. අන්න එවැනි තත්වෙට හදන්න. ඒක තමයි මම යෝජනා කරන්නෙ. ඒක කරන්න. ඕක සත්‍ය සිද්දියක් කියල හුලගේ පාවෙලා ගියෝතින් ඔය වැඩකරන මිනිස්සුත් සතපහකට ගණන් ගන්නෙ නැහැ. ඒක නිසා අඩුමගානෙ හොරකම නැල්ලුවත් ඒ පිළිබඳව නැඹුරු වුනයි කියන එක ක්‍රියාත්මක විය යුතුයි. මට කියන්න තියෙන්නෙ එපමණයි. පැහැදිලිවම මෙතන වංචාවක්, එදා දවසෙ නෙවෙයි. පළවෙනි එකත් අවසාන එකත් නෙවෙයි කියමින් මම නිහඩ වෙනවා.

**ගරු සභාපතිතුමා නැවතත් පැහැදිලි කරමින්,** මම ඒක පිළිගන්නවා මොකද සභාවට ආදරේ නැති මිනිස්සු වංචා කරනවා ඇති. නමුත් කිලෝ එකක් දෙකක් තුනක් සමහරවිට මොනවාහරි වෙනවා ඇති. ඔය කිලෝ තුන්සිය ගාණනක් නම් අස්ථාන ගත වෙලා නැහැ. එතන ක්‍රියාත්මක කරන එක්කෙනා මම ගෙන්නල ඇහුවාම කිව්වෙ අඩුවෙල නැහැ කියො. මම කිව්වා ඔය කිව්ව කටින් කියල තියෙන්නෙ. එහෙම කිව්වෙ නැහැයි කිව්වා. ලේකම් තුමිය නිලධාරිනිය සේරම හිටියා. ඉතිං අපට අර සී සී ටී වී කැමරා තිබ්බනම් බලාගන්න තිබුනා. ඊලගට ගරු මන්ත්‍රීතුමා ඒ වගේ අඩුපාඩු තියෙනවා. අපිට දවසේ නිෂ්පාදනය කොච්චර වෙනවද? කොච්චර විකුනුවද? කියල දෛනිකව අපේ සටහන් වෙන්නෙ නැහැ. ඒක මම යෝජනාවක් හැටියට ක්‍රියාත්මක කරන්න කිව්වා. ඊලගට පොහොර එතන විකුනන්න එපා. එතනට කුනු ගෙනිච්චාම ලොරියෙන් පොහොර උපකාර්යාලයට ගෙනත් බාන්න කිව්වා. එතකොට අර පුස්තකාලෙ ඉන්න මිස් බිල් ලියන්නෙ. එයාමට භාර දුන්නා ඒක කරන්න කියලා. ඒකයි එතන තත්වෙ මොකද මම හොරකමට වංචාවට ඉඩ දෙන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, ඒවගේම සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. අද දවසේ 2020 වර්ෂයට ඉතාමත් හොඳ අයවැයක් ඉදිරිපත් කරලා, මත විමසුමක් තුල ඉතාමත්ම ඉහළ ප්‍රතිශතයක්, ඡන්ද 18 ක් ලැබිලා. ඉතාමත් සාර්ථකව ඔබතුමා ඉදිරිපත් කළ ඒ අයවැය සම්මත කිරීම පිළිබඳව මම සියලුම දෙනාට සුබ පතනවා. ගරු සභාපතිතුමනි, මට අත්‍යාවශ්‍ය කරුණක් තියෙනවා. ඒක නිසා මේ ස්ථානයෙන් බැහැර වෙන්නත් අවස්ථාව ලබා දෙන්න. ඒවගේම මම සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා. මම ගිය සභාවාරෙදි කෑම වේලක් දෙනවයි කියලා පොරොන්දුවක් වුනා. ඇත්තටම දෙන්න ඕන. මොකද 17 වෙනිද වෙන දේ පිළිබඳව මම ඊට ඉස්සෙල්ල කිව්වා නම්, ඒ සියල්ල ඉෂ්ඨ කරන්න පුලුවන් විදිහට මට කතා කරන්න පුලුවන් වුනානම්, මේ පොඩි ගාණනක් වියදම් කරල කෑම වේලක් දෙන එක මොකක්ද? ඒක කරන්න පුලුවන්. ඒක දෙනවා. මම සියලු දෙනාට ආරාධනා කරනවා. 13 වෙනිද රෑට අපේ ගෙදරට එන්න. සියලුම දෙනාට මම ඔබ වෙනුවෙන් කෑම වේලක් සූදානම් කරල තියෙනවා.පිරිත් සජ්ඣායනයකුත් අහන්න පුලුවන්. අද දවසෙ කෑම ටික මට දෙන්න එපා කියලා කිව්වා. ඒක නිසා සභාපතිතුමාගෙ සන්තෝෂම් වශයෙන් අද කෑම ටික ලැබේවි. ඒක නිසා 13 වෙනිදා අපේ නිවසට එන්න කියන කාරුණික ආරාධනය කරමින්, ඔබ සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින්, මට බැහැර වීමටත් අවසර පතමින්, නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේ දවස්වල බොහෝම හදිසි වැඩවගයක් කරගෙන යනවා. දැන් මේ අපි සංවර්ධනය කරලා ගහන ලද බෝඩ් ගලවගෙන යන්නෙ සභාවෙන්ද? එහෙම නැත්නම් පිටස්තර පුද්ගලයින්ද? මේ මොහොත වෙනකොට අපේ ප්‍රදේශවල බෝඩ් එකත් එක්ක තරහ නැහැ. අර බටෙත් එක්ක තරහයි. මොකද බෝඩ් එක තියෙනවා බටේ නැහැ. එක්කො ගෙනියන කෙනා බටෙයි, බෝඩ් එකයි දෙකම ගෙනියන්න ඕන. බට ටික නැහැ කටවුට් ටික තියෙනවා. ඒක නිසා මම පැහැදිලි කරගන්න කැමතියි. මොනව හරි නීත්‍යානුකූල තත්වෙකට මේවා අයින් කරන්න කියලා චක්‍ර ලේඛයක් නිකුත් කරල තියෙනවද? ගරු සභාපතිතුමනි, මම පහුගිය දවස්වල මාතර පැත්තෙ යනකොට ඒ පැත්තෙ එක බෝඩ් එකක්වත් ගලවලා නැහැ. නමුත් අපේ යම් යම් ස්ථානවල බෝඩ් ගලවලා තියෙනවා. ඊලගට අපි වැදගත් විදිහට එදා 2015 වර්ෂයේ ජනාධිපතිවරණය ජයග්‍රහණය කර ආණ්ඩුව ගත්තා. මම අභියෝග කරනවා. අපි එක බෝඩ් එකකටවත් මොනවත් කළේ නැහැ. බැසිල් රාජපක්ෂ මහත්තයලගෙ පොටෝ එකක් තවමත් තියෙනවා. දැන් මගේ ගෙදර ලඟට ගිහින් බලන්න තාමත් තියෙනවා. එකකට අත තිබ්බෙ නැහැ. අපි ඒවගේ දෙකයි පනහෙ, තුන්වෙනි පංතියෙ වැඩ කරන්නෙ නැහැ. මම ඒකයි ඇහුවෙ චක්‍ර ලේඛයක් හෝ නියෝගයක් තියෙනවද කියලා. මේක එසේ මෙසේ කරුණක් නෙවෙයි. සමහර එක දැන්වීමකට රුපියල් 6000 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවල තියෙනවා. රුපියල් 6000 ක් ගෙවනකොට රජයේ සල්ලි එතකොට බෝඩ් 100 ක් තිබුනොත් ලක්ෂ හයයි. ඒවගේ 500 ක් ලක්ෂ 30 යි. සමහර වෙලාවට 500 කට වැඩියි. මේක ගලවන්න කියල නියෝගයක් තිබේ නම්, මම කියනවා වෙන්දේසි කරන්න සභාවට ගෙනත් දාන්න. ඒක සභාවට මුදලක්, එතකොට මේක එක එක්කෙනාට ඕන විදිහට ගිහිල්ල ගලවලා ගෙවල්වල ගෙනියන්න බැහැ. අපි ඔය චක්‍රලේඛනය පිළිගත්තයි කියමු. එතකොට මේ බටේ කාටද අයිති? පාරෙ යන මිනිස්සුන්ටද? රෑට ඇවිල්ල කපාගෙන යන්නද? නැහැ.මේක අයිති සභාවට. සභාවෙන් ගිහිල්ල ඌරල පහල බෝඩ් ගැලෙව්වයි කිව්වා. කියනකොටම මම ඇහුව සභාවෙන්ද කියල. ඔව් කැබ් එකෙයි කිව්ව ආවෙ. මම ගිහිල්ල බැලුව ඒ බෝඩ් මෙතන මේ ගොඩේ නැහැ. පැහැදිලිවම ගලවන හැම බෝඩ් එකක්ම සභාවට ගේන්න ඕන. කවුරු ගියත් සමහර වෙලාවට ඒ යන පුද්ගලයත් අපට 100% ක් විශ්වාස කරන්න බැහැ. මේ බෝඩ් හයිකරන ලොකු බටයක් රුපියල් දෙතුන් දාහක් වෙනවා. රුපිල් 2000 ක් වුනොත් බට දෙකට 4000 ක් එහෙම නම් මම කියනවා සභාව සතු බට ටික මෙතනට ගෙනාවොත් ලක්ෂ 25 ක ආදායම තියෙනවා. වෙන්දේසි කර ගමන් ඕක ගෙනියාවි. ඉතිං ඒක නිසා එක එක්කෙනාට ඕන විදිහට බට ටික ගලවන්න දෙන්න එපා. සභාවෙ වගකීම සභාවෙන්

ඉටු කරන්න. ඒකයි සිදුවෙන්න ඕන. ඊයෙ නැහිනිගල ග්‍රාමසේවක බෝඩ් එකත් ගලවලා. ඒක නිසා මම කියන්නෙ රාජ්‍ය දේපොල මේ විදිහට පරිහරනය කරන්න කිසිම කෙනෙකුට ඉඩ දෙන්න එපා. ඒ පිළිබඳ දැඩි අවධානයෙන් ඉන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම බෝඩ් හයිකරපු ලිස්ට් එක ගන්න පුලුවන්. ගලවගෙන ඇවිල්ල වෙන්දේසි කරන්න අපට ප්‍රශ්නයක් නැහැ .හැබැයි ගලවන කොට අද අපේ ඒව විතරක් ගලවගෙන ඇවිල්ල හරියන්නෙ නැහැ. නියෝගය තියෙන්න ඕන එවකට ආණ්ඩුවෙ තියෙන ඒවත් ගලවගෙන එන්න. ඒක තමයි සාධාරණ වෙන්නෙ. අන්න ඒක තමයි තමුන්නාන්සෙට මතක් කරන්න ඕනකම තිබුනෙ. මම හිතන විදිහට තමුන්නාන්සෙ මේවත් දන්නෙ නැතුව ඇති. තමුන්නාන්සෙට මට මෙතනදි කියන්න තියෙන්නෙ නොසැලකිල්ල කියන එක. හැම දෙයක් ගැනම සැලකිලිමත් වුනොත් විවේචන එන එක නැතිවේවි. ඒක නිසා පළමු කොටම මම මතක් කරල දෙන්නෙ ඒක.

ඊලග කාරණය තමයි අපේ කාලෙ අපි පෙරපාසල් උත්සව තියනවා. දැන් අපි කිසි දෙයක් දන්නෙ නැහැ. අපි ඒ දවස්වල පෙරපාසල් උත්සව තියනකොට පෙරපාසල් 20 ක්ද කොහෙද එනවා. විස්සම ගෙන්න ගන්නවා. අපේ මේ පරන මන්ත්‍රීවරු හිටියා. ඒ අය දන්නවා. අපට කාඩ් එක කාඩ් එක වෙන වෙනම බෙදන්න බැහැ. අද මේ සභාවෙ මන්ත්‍රීවරු 27 දෙනාම පෙර පාසල නිළ ඇඳුම් දෙන්න අනුමත කළා. තව ප්‍රශ්නයක් ආවත් මේ 27 දෙනාම අනුමත කරනවා. මම කියන්නෙ නැහැ 27 දෙනාටම දෙන්න ඕන කියලා. මේ 27 දෙනාම ගියත් අපහසුතාවයට පත්වෙන එකත් මම කියනවා. මොකද වාඩිවෙන්න දෙන්න විදිහක් නැහැ. තේ දෙන්නත් බැහැ ඒක මම කියනවා. නමුත් හැමෝම යන්නෙ නැහැ. අපි හිතමු යටලමත්ත,ඌරල,නාගොඩ තියෙනවනම් අදාල මන්ත්‍රීවරුවත් අඩුගානෙ සහභාගි වෙයි. ඉතිං ඇයි මේවගේ නොසැලකිල්ලෙන් මේවා කරන්නෙ. මේ සභාවෙ සභාපතිතුමා ඇතුළු මේ 27 දෙනා. අපි මේ සභාවෙ පෙරපාසල් දියුනු කරන්න හැම උත්සාහයකම යෙදෙනවා. එහෙම නම් මම කියන්නෙ ඒ පුංචි තුන්ඩු කෑල්ල මේ 27 දෙනාටම ලැබිය යුතුයි. මේ මම ගැන කතා කරනවා නෙවෙයි. තමුන්නාන්සෙලට සමහර විට එතනට ගිහිල්ල අර දරුවොත් එක්ක විනාඩියක් මේ අපේ පෙරපාසල කියන හැඟීම ඇතිවෙනවා. අපි ගාවත් දරු සෙනෙහස ඇතිවෙනවා. අපි සතුටු වෙනවා. පොඩි ළමයින්ගෙ නැටුම් දිහා බලල.නමුත් ගමේ භාහිර පෙරපාසලේ ආරාධනා කරනවා. ඕක තමයි ඇත්ත උත්තරේ. ඒක නිසා කරුණාකරල ඊළඟ වර්ෂෙවත් සේවක රැස්වීම තියපු දිනයට ඒ මහත්ම මහත්මීන්ට පෙර පාසල් උත්සවවලට ආරාධනා කරන්න. අපට මේ යන්න ඕනකමට කියනවයි කියල හිතන්නත් එපා. අපට යන්න ඕන කමට නෙවෙයි. යමක් වෙන විදිහක් තියෙනවා. ඒක නිසා ආයතනය තුල කාර්යයන් පිළිබඳ දැනුවත් කරන්න. අජිත් හිටපු සභාපතිතුමා, උප සභාපතිතුමා දන්නවා ඇති. යන නොයන එක වෙනම වැඩක් අපි දෙගොල්ල තුන්ගොල්ලම ගිහිල්ලා දේශපාලනය කතා කරයි. නැහැ. එතන පුංචි අයට, දෙමව්පියන්ට පනිවිඩයක් අපි දෙන්නෙ. තමුන්නාන්සෙල පාලක පක්ෂෙන් කියනවට වැඩිය වටිනවා. අපි ගිහිල්ල පෙරපාසලක අපි සභාවක් හැටියට මෙන්න මේ වැඩ කොටස අපි තමුන්නාන්සෙලට ලබා දෙනවයි කියල. ඇයි මේක මේ වගේ වෙන්නෙ ඒක නිසා නොදැනුවත් කමෙයි කියන එකත් කියන්න බැහැ. ඔය පෙර පාසල් පාලිකාවො ඉන්නවා. මම හිතන්නෙ දැන් පැන්ෂන් යන්න කිට්ටු කට්ටිය ඉන්නෙ. අපි තුන්ඩු කෑල්ලක් වත් මෙතන ගණන් ගන්නෙ නැති තත්වෙට පත් වෙනවනම් ඒ මන්ත්‍රීවරු ගණන් ගන්නෙ නැහැ කියන පනිවිඩය දෙන්නෙ. ඉතිං ඒක නිසා යන නොයන එක අපේ වැඩක් ඉදිරියටවත් දැන් මේ අවුරුද්දෙ දෙන්න යන්න එපා. දැන් මේ කතා කර හින්ද හෙට අනිද්ද තියෙනම් එයි අපට එපා. දැන් එවන්න එපා. කීයටවත් අර පිට පෙරපාසල්වලින් ගම්වල අපට කිව්වා. ඒක නිසා එවැනි අපහසුතාවයට සමස්ථ සියලුම මන්ත්‍රීවරු පත්කරන්න එපා කියන එක තමයි මම කියන්නෙ. ඒ ගැන මම මීට වැඩිය කතා කරන්නෙ නැහැ.

දැන් තමුන්නාන්සෙලගෙ රජයක් තියෙන්නෙ. තමුන්නාන්සෙගෙන් දැනට ආදාහනාගාරෙ තත්වෙ මොකක්ද කියන එකත් දැනගන්න කැමතියි. මේ වෙලාවෙ නව රජයක් ඇවිල්ල තමුන්නාන්සෙලට

තවම හැරෙන්නවත් වෙලාවක් වුනේ නැහැ. අපි විවේචනය කරන්න යන්නෙ නැහැ. හොඳ දෙයක් කළොත් අපි රජය නෙවෙයි කවුරු කළත් අනුමත කරනවා. අපේ මොනව හරි දුර්වලතාවයන් තිබිල තමයි අපි පරාජයට පත්වුනේ. ඒ ගැන අපි සැලෙන්නෙ නැහැ. සමහර ප්‍රදේශවල ඉතාමත්ම ගෞරවණීය අන්දමින් මන්ත්‍රීවරු සැරිසරලා තියෙනවා. අපි ඒක කියන්න ඕන. සමහර ප්‍රදේශවල ඒ දේ සිද්ද වෙලා නැහැ. ඒක නිසා අපි ගෞරවය දක්වනවා. පක්ෂද විපක්ෂද, ඊට ඉස්සෙල්ල සභාවෙ අපි කතා කළා. ඒක නිසා මට දැනගන්න ලැබුනා. සභාපතිතුමා සමහර පෙලපාලි යනකොට පිටිපස්සෙන් ගිහිල්ලා තියෙනවා. ආරක්ෂාව පිළිබඳව උපදෙස් දීගෙන යනවත් පනිවිඩ ලැබුනා. ඒ ගැන අපි ස්තූතිවන්ත වෙනවා. කවුරු හොඳදේ කළොත් අපි හොඳෙයි කියල කියන්න පැකිලෙන්නෙ නැහැ. ඒක නිසා සංවරව හැසිරිලා ඒ විදිහට ඒ පනිවිඩයකුත් දීපු මන්ත්‍රීවරුන්ට අපි ස්තූතිවන්ත වෙනවා. ඒක නිසා ඉදිරියට තමුන්නාන්සෙලගෙ වකවානුව තියෙන්නෙ. අපි බාධා කරන්නෙ නැහැ. අපි සිදු කළාට වඩා වැඩි ප්‍රමාණයක සංවර්ධනයක් කරගෙන යන්න. සංවර්ධනයෙදි අපි අකුල් හෙලන්නෙ නැහැ. තව සංවර්ධනය කරන්න ප්‍රමාණය වැඩියි. ඒක නිසා තමුන්නාන්සෙලගෙ වාරය දැන් ඇවිල්ල තියෙන්නෙ. ඒක නිසා බාධාවක් තිබුන රජය වෙන පැත්තක තමුන්නාන්සෙල තව පැත්තක හිටපු එක. දැන් බාධාව ඉවත්වුනා. ඒක නිසා ඉතිරි වැඩ කොටස් ටික ඉතාම සාධාරණව ඒ කටයුත්ත කරන්න. එතකොට තමයි තමුන්නාන්සෙගෙ ජනප්‍රියතාව ඉස්සරහට යන්න පුලුවන් වෙන්නෙ. නැත්නම් පක්ෂග්‍රාහී විදිහට වැඩ කරන්න ගියොත් අපහසුතාවයට පත්වේවි. එහෙමනම් තමුන්නාන්සෙලට මම මීට වැඩිය කරණු දක්වන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. තමුන්නාන්සෙල සියලු දෙනාටම සුභ ගමනකට ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, අපි මේ සභාවේ දේශපාලන කතා වලින් තොරව කතා කරනවයි කියලා ගිය සභාවෙ මම ප්‍රකාශ කළා. අපි ජයග්‍රහණය කරලා අපේ සහෝදර මන්ත්‍රීවරුන්ට වගේම අනිත් කාටවත් හිත රිදෙන්නෙ නැති වෙන විදිහට, බොහොම වැදගත් විදිහට මේ සභාව අවසන් කරනවයි කියලා කිව්වා. ඒක නිසා ගරු සභාපතිතුමනි, දේශපාලන වශයෙන් අපි කාටවත් හිත් රිදෙන්න කතා කරන්නෙ නැහැ. මොකද අපේ සහෝදර මන්ත්‍රීවරු මෙතුමන්ලාගේ පරාජය ඒගොල්ලන්ට ඒ වෙලාවෙ බොහොම කණගාටුක් ඇතිවෙන සිද්ධියක් කියලා. මම ගිය මාසෙ මගේ කතාවෙදි කිව්වා. ඒක නිසා අපි එහෙම මොකුත් කියන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි අපි බලාපොරොත්තු වුන විදිහටම විශිෂ්ඨ ජයග්‍රහණයක් අපි ලැබුවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අර බෝඩ් ප්‍රශ්නෙ, අපේ රජයේ වැඩ පිළිවෙල යටතේ වත්මන් රජය චක්‍ර ලේඛනයකුත් එවල තියෙනවා. අපිත් ඉදිරි සංවර්ධන කටයුතු වලදි කිසිම බෝඩ් එකක් ගහන්නෙ නැහැ. ඒ සල්ලි ටිකත් කොන්ක්‍රීට් එකක් දානවනම් ඒකට යොදවනවා මිසක්, සකස් කරන පාර වැඩි කරන්න යොදවනවා මිසක් බෝඩ් ගහන්නෙ නැහැ. සමහර විට ඔය ගහගෙන ආපු විදිහට පාරවල් හදල හදල බෝඩ් ගැහුවොත් බෝඩ් විතරයි පාරක යන්න නැති වෙනවා. ඒ නිසා ඕවයින් හදිසි අනතුරුත් වෙනවා. ඒක නිසා බෝඩ් ටික ඉවත් කරන එක හොඳයි. දැන් අලුත් වැඩ පිළිවෙලක්, අලුත් ජනාධිපතිතුමෙක් ඒ ජනාධිපතිතුමාගෙ හොඳ වැඩ පිළිවෙලක්. මම හිතන්නෙ ඒව අයින් කළාට වරදක් නැහැ. අනවශ්‍ය සියලු දේවල් අයින් කරල ලස්සන නගරයක්, ලස්සන ගමක් හදන්න අපි කටයුතු කරමු.

ඒ වගේම අපේ මන්ත්‍රීතුමාලා ගිය ඡන්දෙ වෙලාවෙ අපි කාටවත් හිත රිදෙන්න වචනයක් කිව්වෙ නැහැ. අපි කාගෙන්වත් ඇහුවෙත් නැහැ. අපේ මන්ත්‍රීතුමාල හම්බවුනහම වැස්ස පැවිල්ල ගැන තමයි කතා කළේ. නැතුව දිනුවද, පැරදුනාද කියලවත් අපි කතා කළේ නැහැ. මම දැක්ක මේ අපේ වනමල් මන්ත්‍රීතුමා එතුමා ඡන්ද ගණන් කරන මධ්‍යස්ථානෙ බොහොම කණගාටුවෙන් දුව ඇවිදිනවා. මට කතා කරන්නත් ලෝබයි. මම ඒ පාර ගෙදර ඇවිල්ලා පහුවද කතා කළා. මොකද එතුමාගෙ වේදනාව

මට දැනුන මට පව් කියල හිතුනා. මොකද ඇත්තටම අපිටත් ඕව වෙලා තියෙනවා. ජය පරාජය ඔහොම තමයි. ඉතිං අපි ඒ වෙලවෙ කෙනෙකුට හිත රිදෙන්න වචනයක් කිව්වොත් ඒක අපි අදහන ආගමට දහමට අනුවත් පාපයක්. අපේ ජනාධිපතිතුමා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ ප්‍රතිපත්ති අනුව අපි කටයුතු කළා. සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් අද දේශපාලන කතා නවත්තලා ලබන මාසෙ වෙන කොට තමුන්නාන්සෙලටත් විවේචනය කරන්න කතා කරන්න දේවල් සමහර විට තියේවි. සියලු දෙනාටම සුබ අනාගතයක් අපි හැමදාම ප්‍රාර්ථනා කරපු අනාගතය අපිට ලැබුනා. ඒ නිසා අපි සතුටු වෙමින්, සභාපතිතුමනි අද අපේ සභාවෙ කටයුතු වේලාසනින් අවසන් කරලා. කවුරුත් එක්ක එකතුවෙලා කෑම ටික කාල යන්න අවස්ථාව ලබා දෙන්න කියල ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මගේ ඡන්ද කොට්ඨාසයට මාපලගම සහ තල්ගස්වල ප්‍රධාන නගර දෙක සම්බන්ද වෙලා තියෙනවා. මේ මාපලගම නගරය පිරිසිදු කරන්න දැනට අවුරුදු 15 ක 20 ක ඉදල ගිය මාසෙ විතර වෙනකම් සේවකයෙක් යොදවල තිබුනා. ඔහු අසනීප තත්වය නිසා දැන් විශාම ගිහිල්ල ඉන්නෙ. දැනට නගරය පිරිසිදු කිරීමට කෙනෙක් නැහැ. ඒ නිසා මම අපේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ පුරප්පාඩුව සඳහා අපි ද්‍රවිඩ ජාතික පුද්ගලයෙක් තෝරාගෙන ඉන්නවා. ඒ රැකියාව ඔහුට ලබාදීල අර අපිරිසිදු වෙච්ච වැසිකිලි පද්ධතියත් පිරිසිදු කරගෙන කටයුතු කරන්න අවස්ථාව ලබාදෙන්න කියලා. ගමන් වාර 60 ක් විතර බස් රථ නගරයට එනවා. ඒ ගන්න බලාපොරොත්තුවන පුද්ගලයා පොරොන්දු වෙලා තියෙනවා. වැසිකිලියත් සුද්ද කරගෙන හවස් වෙනකම් ඉන්න. කලින් හිටපු සේවකයට වැසිකිලිය සුද්ද කරන්න බැරිය කියපු නිසා ඒක අපිරිසිදු වුනා. මේ ද්‍රවිඩ ජාතික පුද්ගලය දවසෙම ඉන්න පොරොන්දු වුනා. ඒ පුද්ගලයාට මේ රැකියාව ලබා දෙන්න කියල මම යෝජනා කරනවා. ඔහුට නගරය පවිත්‍ර කිරීමේ කොටසත් භාර දෙන්න.

ඒ වගේම තමයි මාපලගමට හා තල්ගස්වලට දැන්වීම් පුවරු දෙකක් ලබාදීමට දානපතියෙකු හෝ සම්බන්ධ කරගෙන කටයුතු කරන්න. මොකද දැන් තැන තැන පෝස්ටර් ගහන්න දෙන්නෙ නැහැ. ඒ අයටත් මාධ්‍ය සන්නිවේදනයක් තමයි දැන්වීම් ඇලවීම. නැත්නම් කොච්චර තීන්ත ගෑවත් රැට ගිහිල්ල දැන්වීම් අලවන එක කරනවා. අපේ මාපලගම මහජන ක්‍රීඩාංගනයේ තාප්පෙ දිගටම හැමදාම පුද්ගලික පංති කරන අය පෝස්ටර් ගහනවා. ඒක නිසා දැන්වීම් පුවරු දෙකක් සවිකරල එතන සුද්ද කර ගත්තොත් ආයිත් එහෙම වෙන එකක් නැහැ.

ඒ වගේම මට දැන් අපේ සභාවෙ විදුලි කාර්මික නිලධාරියා කිව්වා. මේ මීටරේකින් ඇම්පියර් 32 ක ධාරිතාවකට පමණලු බලය සපයන්න පුලුවන්. එතකොට මේ AC එකට වෙනම ඇම්පියර් 32 ක බලයක් ඕනලු. එතකොට අනිවාර්යයෙන් මීටර් දෙකක් මේ කොටසට හයි වෙන්න ඕන. ඒක නිසා ඒකත් මම යොජනාවක් හැටියට සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ වසර හතරහමාරක පහක ඒ අඳුරු යුගය අවසන්වෙලා. නව ජනාධිපතිවරයෙක් පත්වෙලා තියෙන මේ මොහොතෙ. මුලින්ම මම මෙය අවස්ථාවක් කර ගන්නවා. නව ජනාධිපතිතුමාට ජනාධිපති තනතුරට පත්වෙන්න ඡන්දය දීපු 69 ලක්ෂයක් වන ජනතාවට, අපේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, බද්දෙගම ආසනයේ, හිනිදුම ආසනයේ, ගාලු දිස්ත්‍රික්කයේ සමස්ථ ජනතාව ඇතුලු සියලු දෙනාට ස්තුතිය පුද කරන්න.

ඒ වගේම ජනාධිපතිතුමා පත්වෙලා දවස් කීපයක් ඇතුලත තවම මාසයක් ගියෙත් නැහැ. මේ කාලය ඇතුලත මේ වෙන කොට සියලු රාජ්‍ය ආයතනවල අදාල අමාත්‍යවරුන්ගේ ඡායාරූප ඉවත් කිරීමේ

සිට යම් ප්‍රතිපත්තියක් යටතේ ක්‍රියාත්මක වන ඒ අලුත් වැඩපිළිවෙල ඉතාමත්ම ප්‍රසන්සනීය වැඩපිළිවෙල ගැන ඇත්තටම අපි ආඩම්බර වෙනවා. මොකද මේ නව ජනාධිපතිවරයා පත්කර ගන්න ඇපකැප වෙච්ච මන්ත්‍රීවරු, ජනතා නියෝජිතයො විදිහට අපි සන්තෝෂයට පත්වෙනවා. මීට දවස් කීපයකට පෙර රු. 1400.00 ට තිබුන කුරුඳු මිල රු. 2000.00 පැනලා තියෙනවා. ඒ වගේම පහුගිය ආණ්ඩුව කාලෙ රුපියල් 400.00 ට තිබුන ගම්මිරිස් රුපියල් 800.00 දක්වා නැගලා තියෙනවා. ඒ වගේම තේ මිල රබර් මිල මේ ආකාරයේ සුළු අපනයන බෝග පිටරටින් ප්‍රතිඅපනයනය කිරීම නතර කිරීමේ වාසිය මේ දින කිහිපය ඇතුලත ජනතාවට ලැබෙමින් තියෙනවා. ඉදිරියෙදි මේ ප්‍රතිලාභ ඉතාමත්ම ප්‍රභලව ලැබිලා අපේ ගම්වල ජනතාවට මීට වඩා සුඛිත මුදිත සාර්ථක සෞභාග්‍යමත් බවට පත්වෙන්න හැකියාව ලැබීමේ පෙරනිමිති මේ වෙනකොට පලවෙමින් තියෙනවා. ඒ පිළිබඳ මගේ සතුට ප්‍රකාශ කර සිටිනවා.

නමුත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විදිහට නවක මන්ත්‍රීවරයෙක් විදිහට මම පත්වෙලා තව මාස කීපයකින් වසර දෙකකට ආසන්න වෙනවා. මම ඉතාම පැහැදිලිව කියනවා. මම අලුත් මන්ත්‍රීවරයෙක්. පෙර වෙච්ච හොඳ දේවල් වගේම නරක දේවලුත් මට අදාල නැහැ. මම දකින්නෙ පහුගිය 2018 මාර්තු මාසෙ ඉඳල දකින ප්‍රාදේශීය සභාව සහ ඉන් ඉදිරියට ගලාගෙන ආපු ක්‍රියාදාමය. මේ ක්‍රියාදාමය තුල මන්ත්‍රීවරයෙක් විදිහට මම කිසිසේත්ම සෑහීමකට පත්වෙන්නෙ නැහැ. මට ජනතාව වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ දී මන්ත්‍රීවරයෙක් විදිහට කිසිම දෙයක් කරන්න අවස්ථාව ලැබුනෙ නැහැ. කටුපොල් තහනම, කටුපොල් වෙනුවෙන් ගත්ත පියවරක් කිසිම දෙයක් මේ වෙනකම් ක්‍රියාත්මක වුනේ නැහැ. අර ගොම වෙනුවෙන් මම හැමදාම කතා කළා. ඊයෙත් මම යද්දි ගොම හැලි හැලි තමයි ප්‍රධාන පාර දිගේ අරගෙන යන්නෙ. ඉතිං මේව මුදල් මත කෙරෙන දේවල් නෙවෙයි. මේවා මුදල් නැහැ කියලා, අපට මුදල් හම්බවුනේ නැහැ කියලා, ආණ්ඩුව නැහැ කියලා, කරන්න බැරිවෙච්ච දේවල් නෙවෙයි. මේ සභාවේ බලතල පාවිච්චි කරලා, කරන්න පුළුවන් දේවල්. මන්ත්‍රීවරුන්ට ජනතාව ලබාදීල තියෙන බලතල පාවිච්චි කරලා, සභාපතිවරයට සභාවට කරන්න පුලුවන් දේවල් ටික පවා සිද්ද වෙන්නෙ නැහැ. අයවැයට මම ඡන්දය දුන්නා. මොකද අයවැයට ඡන්දය දුන්නෙ පක්ෂයක් විදිහට මන්ත්‍රී කණ්ඩායමක් විදිහට සාමූහික හැගීමෙන් අපි කටයුතු කරන්න ඕන. අන්න ඒ කටයුත්ත සලකලා මම අයවැයට ඡන්දය දුන්නා. නමුත් අයවැයට ඡන්දය දුන්නෙ මම හිතට එකඟව නෙවෙයි කියන එක මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරන්න ඕන.

ඒ වගේම විශේෂයෙන්ම අයවැය ඡන්දය පිළිබඳව මම කතා කළේ. මේක හැමදාම සුරංගනා කතා පොතක් වගේ. ගිය සැරේ එකත් ඒ වගේ. මේකත් හරි ලස්සනට අකුරුවලින් ලියල ඉදිරිපත් කරල තියෙනවා. ඉතිං බැලුවහම සුරංගනා කතා පොතක් බලනව වගේ තමයි. හැබැයි කරන්න ගියාට පස්සෙ අපිට මන්ත්‍රී කෙනෙකුට වතුර බවුසරයක් ගෙන්න ගන්න බැහැ. මන්ත්‍රී කෙනෙකුට යම්කිසි තීරණයක් ක්‍රියාත්මක කරල කටයුතු කරන්න බැරි සභාවක් බවට පත්වෙලා තියෙනවා. මන්ත්‍රී කෙනෙක් වෙල වැඩක් නැහැ. මන්ත්‍රී කමේ ඉඳල කරන්න බැරි දේවල් තමයි සියල්ල තියෙන්නෙ. ගමේ පාරවල් ටික සුද්ද කරගන්න බැරිවෙලා තියෙනවා. ලයිට් ටික හරියට හදාගන්න බැරිවෙලා තියෙනවා. ඉතිං මේ දේවල් මුදල් නැතිකම කියලා ඇඳලා ඒක සාධාරණීකරණය කරනවනම් ඒක සම්පූර්ණ වැරදියි. එක ටෙලිෆෝන් කෝල් එකෙන් කරන්න පුලුවන් දේවල්. සභාපතිතුමාට සහ සභාවෙ නිලධාරීන්ට කරන්න පුලුවන් දේවල්. මේ අවුරුදු දෙක ඇතුලත සභාවෙ නිලධාරී මණ්ඩලය ගැන වගේම සභාපතිවරයා ගැනත් මම කිසිම සෑහීමකට පත්වෙන්නෙ නැහැ කියන එක ප්‍රකාශ කරනවා.

ඒ වගේම ඉදිරියෙදි සාමූහිකව ගන්න තීරණයකදි හැර අනිකුත් අවස්ථාවකදි ගමට ජනතාවට මේ සභාවෙන් සාධාරණයක් ඉෂ්ඨ නොවෙනවා නම් ජනතාවත් එක්ක එකතුවෙලා. ජනතාවගෙ පැත්තෙ ඉඳගෙන ජනතාව කියන දේත් එක්ක සමහර විට යම්කිසි අරගලකාරී තත්වයකට වුනත් ඉදිරිපත්වීමට මම සූදානමින් සිටිනවා කියන එකත් මතක්කරනවා. මොකද ගෝණදෙනිය ක්‍රීඩාපිටිය

මේ වෙනකොට අහිමි වෙමින් තියෙනවා. ඒ සම්බන්දයෙන් මේ සභාවෙන් අරගෙන තියෙන තීන්දු තීරණ පිළිබඳව කිසිම සෑහීමකට පත්වෙන්නෙ නැහැ. ඒ විතරක් නෙවෙයි ජනතාව සතු අපේ දේවල් මේ සභාවෙ සහ මේ නිලධාරීන් සහ මේ නියොජිතයන් පක්ෂග්‍රාහීව කටයුතු කිරීම නිසා අපට නැතිවෙමින් තියෙනවා. පුද්ගලිකව මඩ ගහන්න මට අවශ්‍යතාවක් නැහැ. මම සභාපතිතුමාගෙන් දුරකතනෙන් කතා කරල ඇහුව අපි මන්ත්‍රීවරු වෙලා ඉන්නෙ ඇයි කියලා. මට ඒ වෙලාවෙ සභාපතිතුමා තදින් කතා කළා. මේ වෙනකොට අපේ මන්ත්‍රීකමේ තියෙන ගෞරවය නැති වෙලා තියෙනවා. ඉතිං ඒ පිළිබඳ දැඩි කණගාටුව,අප්‍රසාදය,කළකරීම ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපත්තුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පසුගිය ඉරිදා උදේ යටලමත්ත කනත්තගොඩ අර අබලන්වෙලා තිබුන පරන පාලම ගැලෙව්වා. ඔබතුමා ගලවන්න කිව්වයි කියල ඩෝසරේ වැඩ කරන ළමයා කිව්වා. ඩෝසරේ බරව මුල්ලෙ පාලම ලගින් උඩට ගිහිල්ල වැඩ කරන අතරෙ අපේ ගෙදර ලගින් ඇලේ දිගේ ආපස්සට ආව. මම ඇහුව මොකද ඔයා ආපහු එන්නෙ කියල.එතනදි කිව්ව අද පාලම කඩන්න අවසර දීල තියෙනවයි කියල. පාලම ලගට එන්නෙයි කියල කිව්වයි කිව්ව. මම කිව්ව ඒක නම් හොද වැඩක් කියල.ඇත්තටම මම කණගාටුවෙනවා. මට පේන තැන ඒ පාලම තියෙන්නෙ. සභාපතිතුමාට අමතක වුනාද දන්නෙ නැහැ. මට පොඩ්ඩක් මතක් කළා නම් මම එතනට කවුරුහරි දාල ඒ යකඩටික ගන්නවා. මොකද ඒ මිනිස්සුත් එක්ක ගොඩක් සම්බන්ද තාවයක් තිබුනා. ඇත්තටම පාලම ගලවන විත්තිය මම දන්නෙ නැහැ. ඇත්තටම මට කිව්වනම් ඒ දවසේ යකඩටික අපතේ යන්න දෙන්නෙ නැහැ. එතනදි  ඇත්තටම සභාවෙ සල්ලි වියදම් කරල තමයි ඒ පාලමේ ඇදි දාල තියෙන්නෙ. දැන් එක ඇන්දක යකඩ විතරක් මම හිතන්නෙ පාලමෙන් එහා පැත්තෙ ගොඩේ තියෙනවා. අනිත් ඒව නම් මම හිතන්නෙ නැහැ. පොඩි යකඩ කෑලි කවුද අරගෙන ගියයි කියලත් කිව්වා. කවුද කියලනම් මම දන්නෙ නැහැ. ඇත්තටම අපි ඒ වෙලාවෙ යකඩටික ආරක්ෂා කර ගත්තනම් මම හිතන්නෙ හොදයි. ඊට ඉස්සෙල්ල දවසක් ඒ පාලමේ වැඩ කරන ඉංජිනේරුවා කිව්වා. අපට මේක නිකන් ගලවන්න බැහැ. සභාවෙන් අවසර ලියුමක් ඕනෙයි කියල. ඊට පස්සෙ නන්දෙ අයිය සභාවට ආවට පස්සෙ කියල තිබුනා. සභාවට ලියුමක් දෙන්නෙයි කියල. එතුම ඒ වෙලාවෙ ලේස්තිවෙල ඇවිල්ල තිබුනෙ නැහැ.ලියුම් සම්බන්දව දන්නෙත් නැහැ. සභාවෙන් කොහොමත් පාලම කඩන්න ඕන. අපි වියදම් කරල කඩනවට වැඩිය හොදයි ඒකෙන් වියදම් කරල කඩන එක. කොච්චර වියදමක් යනවද ඒ පාලම කඩන්න. ඒ කිසි ලියවිල්ලක් නැතුව තමයි මම හිතන්නෙ කඩල තියෙන්නෙ. ඔබතුමාගෙ අවසරයක් තියෙනවයි කියල තමයි එතනදි කියල තියෙන්නෙ. මම බලාගෙන හිටියා. කොන්ත්‍රාත් එක ගනිපු කෙනා ඇවිල තමයි පාලම කැඩෙව්වෙ. අපරාදෙ යකඩටික ඒ වෙලාවෙ පොඩ්ඩක් මටවත් දැනුවත් කළානම් මම කොහොම හරි එතනට යනවා.

ඒ වගේම වාරිමාර්ග එකෙන් ආරියතිලක මහත්තයගෙ යෝජනාවක් අනුව ඇල සුද්ද කිරීම් කරනවා. පහුගිය දවසෙ ගංවතුර ගලපු වෙලාවෙ. අපේ ගෙවල් හරියෙ වෙනදා යටවුන තැන් ගොඩක් යට වුනේ නැහැ. මොකද අර ඇල සුද්ද කරපු නිසා. ඒවගේම යම්කිසි වැඩක් කරන කොට, ගමේ පොදු කටයුතු කරන කොට. දැනුවත්වෙලා ඉන්නව නම් කොහොම හරි අපි නොගිහින් ඉන්නෙ නැහැ. ඇත්තටම අර පෙරපාසල් උත්සව  ගැන කිව්වා. ගිය වර්ෂෙ නම් අපට ආවා. උත්සව තියෙන වෙලාව දාල පෙරපාසල් 15 නාම ලේඛනය. මේ සැරේ ආවෙ නැහැ. ලොකු අඩුපාඩුවක් තමයි ඒක. ඒවගේම අපේ ගමේ පෙරපාසල් ගුරුතුමිය ඇවිල්ල ආරාධනා කළහම. අපි යටලමත්තෙ පෙරපාසල් උත්සවයට ගියා. ඒවගේ පිටස්තර ඒවට අපට යන්න බැහැ. ආරාධනාවක් නැතුව එහෙම යන්න බැහැ. ඒ වගේම මම හිතන්නෙ 2020 වසරේ හොද වැඩපිළිවෙලකට යාවි. ලබනා වූ 2020 වසරේ

සංවර්ධන යෝජනා විශාල ප්‍රමාණයක් කර ගැනීමට හැකියාව ධෛර්යය ශක්තිය ලැබේවායි කියමින් ලබන්නාවූ 2020 වසර සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම මුලින්ම කියන්න ඕන. අයවැයට අපිට විරුද්ධ වෙන්න හේතුව වුනේ. ඇත්තටම අපේ ධනංජය මන්ත්‍රීතුමා කිව්වා වගේ අවුරුදු දෙකක් තුල අපිට මොනවද මේ සභාවෙන් ඉෂ්ඨ වුනේ කියන කාරණාව තමයි කියන්න තියෙන්නෙ. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම හැමදාම මේ යෝජනා ගේන්නෙ අපේ ගමේ අපේ බල ප්‍රදේශයේ දරුවන්ගෙ යහපත සඳහා තියෙන ස්ථාන තෝරගෙන. ඒ වගේම සියලු ජනතාවගේ අවශ්‍යතාවයන් තමයි මම නිතරම යෝජනාවලට ගේන්නෙ. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අර කොළඹ කඩේ ලග සිට කුඹුරුහේන මාර්ගය දක්වා යන කුඹුස්ස පාලම අපේ නන්දන මන්ත්‍රීතුමත් දන්නවා. ඒ පාලම ඇත්තටම දැන් ගිලා බැහැලා තියෙන්නෙ. මම ගිය සභාවාරෙත් කිව්ව හැම සැරේම කිව්වා. ඒකට කිසිම පිළිතුරක් හම්බවුනේ නැහැ. අර යකඩ තහඩුවක් දීලා ඒ මාර්ගය පොඩ්ඩක් පිළිසකර කරල දුන්නනම් ඇත්තටම අර බස්එක වුනත් ගන්න පුලුවන්. එතනින් ඇත්තටම යන්න බැහැ. මාරාන්තික වැඩක් තමයි එතන වෙන්නෙ. මම හිතන්නෙ ඒකට වෙන විකල්පයක් හරි ගන්න. අපි සභාවෙ මන්ත්‍රීවරු වශයෙන් ඇත්තටම දෙයක් වුනාට පස්සෙ අපට කතා කරන්න ලැජ්ජයි. එහෙම නැත්නම් පාර වහල හරි දාන්න. එතකොට ඒ අනතුර වලක්වා ගන්න පුලුවන්. නැත්නම් ඒක අනිවාර්යයෙන් සිද්ද වෙනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි අපේ අර තල්ගස්වල සිට කුඹුරුහේන මාර්ගයට යන මාර්ගය ගිලා බැහැලා තියෙන්නෙ. මම යෝජනා ගෙනාවා. නමුත් මෙතෙක් කල් මේ සභාවෙ TO කෙනෙක් ගිහිල්ල නිරීක්ෂණය කරලා නැහැ. අන්න ඒ අඩුපාඩු නම් තියෙනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපේ පියල් මන්ත්‍රීතුමා කිව්වා වගේ අර පොදු වැසිකිලිය ඇත්තටම මාපලගමට තියෙන්නම ඕන එකක්. ඒකට අර කම්කරුවෙක් දාල වැඩ කරවන්න. එහෙම කියන්නෙ මොකද දන්නවද? ඔබතුමාලා කිරිබත් උයාගෙන කාපු වෙලාවෙ එතන රංඩුවකුත් වුනා. ඒ කියන්නෙ අර සිසිර මහත්තයගෙ ගෙදර පිලිකන්නට අපේ සහෝදරයෙක් ගියයි කියලා. අන්න ඒවගේ ඒව තියා ගන්න එපා. ඇත්තටම ඒවට මොනව හරි කරන්න.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ වීථි ලාම්පු හැම තැනම හයි කරනවා. නමුත් ගරු සභාපතිතුමනි අර තල්ගස්වල ප්‍රධාන බස් නැවතුම්පොල ලග වීථි ලාම්පුව පත්තු වෙන්නෙ නැහැ. දැන් සතියකට විතර ඉස්සරවෙලා හොරංගල්ලෙ එක්කෙනෙකුයි අම්බලන්ගොඩ මල්ලි කෙනෙකුයි අනතුරකට ලක් වුනා. ඒ මොහොතෙ පොලීසියෙන් අහනව කෝ මෙතන වීථි ලාම්පුවවත් පත්තු වෙන්නෙ නැහැ කියල. ගරු සභාපතිතුමනි අන්න ඒ වගේ ගොඩාක් දේවල් තියෙනවා. ඒ වගේම තමයි දැන් මේ අලුත් ආණ්ඩුවක් පත් වුනේ. ගරු සභාපතිතුමනි, මාර්ගයේ වතුර බහින්නෙ නැති තැන් තියෙනවා. ඒවට අලුත් ආණ්ඩුවෙන්වත් මොකක් හෝ ක්‍රියාමාර්ගයක් ගන්න. අපේ අර ගයාන් මන්ත්‍රීතුමාලගෙ ගෙවල් ගාව ඇත්තටම වතුර බහින්නෙ නැහැ. ඇත්තටම එක පාරක් ඒ කිට්ටුව මලගෙයක් වුනා. මෝටර් දෙකක් දාල පාරෙ වතුර ඉස්සෙ ඇත්තටම ලැජ්ජයි. ඒක නිසා මම කියන්නෙ මේ සැරේ සියලුම බලතල ටික තියෙනවා. මේ සැරේ හරි ඒ ප්‍රශ්නය සඳහා මොකක්ම හරි ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපි කියන්නෙ අපි සියලු දෙනාටම ජය වෙන්නෙ ඔන්න ඔය ටික කළොත් විතරයි. එතකොට අපිත් සතුටු වෙනවා. අපි කිරිබත් කන්නෙත් අන්න ඒ වෙලාවට. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව වගේ අපි කිරිබත් කන්නෙ අන්න එදාට. ඒ වැඩපිළිවෙලවල් ටික කරන්න. එදාට අපි සියලු දෙනාම එකතුවෙලා කිරිබත් කමු. එසේනම් ගරු සභාපතිතුමනි, මම මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අපි සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. මේ වසරෙ අවසාන සභාවාරය. මුලින්ම ඔබතුමාලගෙ ජයග්‍රහණය වෙනුවෙන්, ඔබතුමාලගෙ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, අපේ අපේක්ෂක සජිත් ප්‍රේමදාස මැතිතුමාත් එක්ක ප්‍රධාන අපේක්ෂකයො දෙන්න විදිහට ඉදිරිපත්වෙලා ඒ පහුගිය ජනාධිපතිවරණෙන් ඔබතුමාලා ජයග්‍රහණය කළා. ඇත්තටම අපි ඔබතුමාලට සුභ පතනවා. ඔබතුමාලා කිසිම ගැටුමකින් තොරව, ඉතිහාසයේ තිබුන සාධාරණම මැතිවරණයක් අවසන් කරලා ඒ වටපිටාව හදල තිබුන හින්දා එවැනි මැතිවරණයකට අපට මුහුණ දෙන්න පුලුවන්කම ලැබුනා. ඒ වගේම කිසිම බලපෑමකින් තොරව විශාල ජයග්‍රහනයක් ලැබුවා. ඒ වගේම ඔබතුමාල සතුටු වෙනවා වගේම අපේ අපේක්ෂක සජිත් ප්‍රේමදාස මැතිතුමා වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කරපු ලක්ෂ 56 ට ආසන්න ඡන්ද දායකයන්ට අපේ ස්තුතිය මේ අවස්ථාවෙ මුලින්ම පුද කරනවා.

ඒ වගේම අද දිනයේ ඉදිරි 2020 වසර සඳහා අයවැය ලේඛනයක් ඔබතුමා සභාවට ඉදිරිපත් කළා. අපි ඇත්තටම අද දිනයේ විශාල ලෙස ඔබතුමාට ඕනම සහයෝගයක් ලබා දෙන්න සියලුම කතිකාවත් කර ගෙන ඉන්න වෙලාවෙ, අපේ විපක්ෂ නායක සහබන්දු මන්ත්‍රීතුමා එතුමාගෙ අදහස දැක්වුවා. මොකද ප්‍රතිවිරුද්ද මතයක් එතුමා ගේන්නෙ ඇයි කියලා. ඒක නොකර අපි විරුද්ද වෙනවනම් තමයි අසාධාරණ. එතුමා යම් සාධාරණ හේතුවක් ඉදිරිපත් කළා. එතනදි තමයි මම හිතන්නෙ නැවතත් ඡන්දයකට යන්න වුනේ. නමුත් ඒ ගැන අපි කණගාටු වෙනවා. අපි කාගෙවත් එහෙම අදහසක් බලාපොරොත්තුවක් තිබුනෙ නැහැ. ඔබතුමාට දෙන්න පුලුවන් සහයෝගය ඉදිරි වසර සහ ඉදිරි කාලය වෙනුවෙන් දෙන්න තමයි අපේ අදහස තිබුනෙ. ඇත්තටම දැන් ඔබතුමාල එක ස්ථාවරයක, ඔබතුමාලට ජනාධිපතිවරයෙක් ඉන්නවා. ඔබතුමාලට ආණ්ඩුව අපි දීල තියෙනවා. අපට ඉදිරි මාර්තු මාසෙ වෙනකම් ඉන්න තිබුන ආණ්ඩුව අපේ මැතිවරණ පරාජයත් එක්ක ඔබතුමාලට අපි කැමැත්තෙන්ම දීල තියෙනවා. නැත්නම් ඉදිරි මාස තුනක කාලයක් අපට අගමැතිවරයාට සහ ඇමතිවරුන්ට කරන්න තිබුනා. නමුත් ඒ අවස්ථාවත් දීල තියෙන මොහොතක ඔබතුමන්ලට මම හිතන්නෙ පළාත් පාලන ආයතනය, ආණ්ඩුකාරවරුන් ඒ සියලුමදෙනා එකම පැත්තක ඉන්නකොට, ඔබතුමාල එදා කරන්න බලාපොරොත්තු වෙච්ච සංවර්ධනය ඔබතුමාලට කරන්න හැකියාව ලැබෙයි. ඒ සඳහා අපි පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව විපක්ෂ කණ්ඩායම විදිහට අපට දෙන්න පුලුවන්, වචනෙකින් හරි සහයෝගයක් තියෙනවනම් අපි ඒක ලබා දෙනවා. මේක මගේ පුද්ගලික අදහස.

ඒ වගේම තමයි අද අයවැය ගැන කතා කළහම අයවැයේ අඩුපාඩු ගැන අපි කතා කරන්න යන්නෙ නැහැ. මට මතකයි ගිය අයවැයේදි ඔබතුමා දකුණු පළාත් සභාවෙ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ගෙ නම් ඒකෙ දාල තිබුන. ඒකෙ යම් අඩුපාඩුවක් වෙලා නිවැරදි කිරීමක් කළා. අද මම මේක අඩුපාඩුවක් විදිහට දකිනව නෙවෙයි. නමුත් අද පක්ෂ විපක්ෂ සියලු දෙනාගෙ නම් තියෙනවා. නමුත් අර ඇමතිතුමාලා දෙන්නට පස්සෙ අපේ හිනිදුම ආසනයේ ඔබතුමාලගෙ සංවිධායකතුමාගෙ නම තියෙනවා. අපේ අයගෙ නම් දාන්න කියලා මම ඉල්ලන්නෙ නැහැ. නමුත් මේක බද්දෙගම ආසනේටත්, හිනිදුම ආසනේටත් අයිති ප්‍රාදේශීය සභාවක් නිසා ඉසුරු දොඩංගොඩ මැතිතුමාත් ඔබතුමාලගෙ කණ්ඩායමේ ඉන්න මේ ආසනේ මේ ප්‍රාදේශීය සභාවෙ කොටස්කාරයෙක් එතුමගෙ නමවත් මේකට ඇතුලත් වුනානම් මීට වඩා වැදගත් කියලා මම හිතනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි මම ගිය ලේඛනයත් බැලුව මේකත් බැලුවා. අපේ කාගෙවත් ඕන නැහැ. නමුත් පහුගිය කාලසීමාව පුරා 2015 ඉදල පහුගිය රජයත් එක්ක මේ ප්‍රාදේශීය සභාව කරන්න ඕන කටයුතු විශාල ලෙස මුදල් මම හිතන්නෙ ලක්ෂ ගණන කියන්න බැහැ. කවදාවත් නොකරන කෝටි එකහමාරෙ වගේ පාරවල් මේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල ආරම්භ කළා. ඒ වගේම ලක්ෂ 10,15,25 වගේ පාරවල් කළා. ඒ වගේම තමයි ප්‍රධාන මාර්ග ඒ වගේ කෝටි ප්‍රකෝටි ගණනක වැඩ කරපු ආණ්ඩුවක කොටස්කාරයො විදිහට ඒකෙ හිටපු මන්ත්‍රීවරයෙක් ප්‍රාදේශීය සභාව නියෝජනය

කරන මන්ත්‍රීවරු කණ්ඩායමේ කෙනෙක් විදිහට ඇත්තටම අපි ඉතාමත් සතුටට පත්වෙනවා. පහුගිය කාල සීමාව පුරා අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට එහා ගියපු කාර්යයක් කළා. මොකද අපි ඉන්න කණ්ඩායමේ 27 දෙනාගෙ දිහා බලපුවම අපේ පක්ෂ කණ්ඩායමේ හත්දෙනා විශාල වැඩකොටසකට දායකත්වය මේ ප්‍රාදේශිය සභාව විදිහට මේ භූමිය සඳහා මේ මාර්ග සඳහා අපට දෙන්න පුලුවන් උපරිම සහයෝගය ලබා දීලා ඔබතුමාගෙ බරවලින් වැඩිකොටස ඇද්දෙ අපේ කණ්ඩායම. ඉතිං ඒ ගැන අපි නිහතමානීව සතුටු වෙනවා. නමුත් ඒ වගේම ඔබතුමාල 15 දෙනාට මම ඉදිරියෙදි ආරාධනා කරනවා. අපි කළා වගේ නෙවෙයි තනිකරම ඔබතුමාලගෙ ජනාධිපතිවරයෙක්, ඔබතුමන්ලාගේ අගමැතිවරයෙක්, ඔබතුමන්ලාගේ මැති ඇමතිවරු ඉන්න වෙලාවෙ කිසිම අඩුපාඩුවක් ඉදිරියෙදි නොවෙන්න ඔබතුමාල කටයුතු කරන්න කියල මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒකට ඔබතුමන්ලාට ශක්තිය ධෛර්යය ලැබේවි. ඉතිං ඒක ඔබතුමන්ලා අපට නෙවෙයි අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම දෙනාගෙ එතුමන්ලගෙ වරප්‍රසාද ,ඉල්ලීම් ඉටු කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම විලේගේ මගේ සහෝදර මන්ත්‍රීතුමා මගේ කොට්ඨාසයම නියොජනය කරන එතුමා කරපු කතාව බලන්න. මම සාමාන්‍යයෙන් ඔබතුමන්ලාගේ කණ්ඩායමේ මන්ත්‍රී කෙනෙක් හරි අපේ කණ්ඩායමේ හරි එහෙම විවේචනය කරන්න යන්නෙත් නැහැ. හොඳ කියන්න යන්නෙත් නැහැ. ඇත්තටම එතනදි මම යම් එකඟතාවයකට එනවා. එතුමා කතා කරපුවයින් 75% විතර ඇත්ත කතාව. මොකද මේ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරු විදිහට අපි මේ සභාවට පත්වෙලා අපි මොනවද අද වෙනකොට කරල තියෙන්නෙ සහ මේක අපේ වැඩ නෙවෙයි. අපි කරගන්න වැඩ නෙවෙයි. අපේ බල ප්‍රදේශයට, අපේ ගමට කරන්න ඕන වැඩ. මේ අයවැය ලේඛනය බැලුවම ගිය අවුරුද්දෙ තිබුන යමක් ඒකම මේ අවුරුද්දෙත් තියෙනව නම් මේකම ලබන සැරේටත් යනවනම් ඒක නෙවෙයි වෙන්න ඕන. ඒවා යම් දුරට අපි මොනවද ඒකෙ සඳහන් වන ඒවායින් අපට ලඟා වෙන්න පුලුවන් වුනේ. ඒ අයවැයේදි අපි ඉදිරිපත් කරපු යෝජනාවලින් අපට මොනවද කරගන්න හැකියාව ලැබුනෙ. ඒ ගැන අපි කොයිතාක් දුරට සාර්ථකද කියල බලන්න පුලුවන්. නමුත් සියලුම යෝජනා වගේ අපි කරපුව නෙවෙයි තියෙන්නෙ. නමුත් ඔබතුමාගෙ කතාවෙදි කිව්වා. යම් යම් ආයතනවලින් ඒව කළා කියලා. ඒ වගේම තමයි අපේ විජිත් සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා. පාරවල් දිහා බැලුවහම පාරවල්වල හැමදාම එහෙනම් බෝඩ් විතරයි කිව්වා. ඇත්තටම පහුගිය කාලෙ එහෙම තමයි. ඒ බෝඩ් ගහන එක නවත්වපු එකත් ඉතාමත් හොඳ දෙයක්. බෝඩ් දිහා බැලුවම මීටර් 100 200,300,500 බෝඩ් හැම හන්දියකම තියෙනවා. ඒක නවත්වපු එකත් හොඳයි. මොකද පහුගිය කාලෙ එච්චර සංවර්ධන කටයුතු හැකි විදිහට ආරම්භ කළා. කරගෙන ගියා. ඉතිං ඉදිරියෙදි බෝඩ් එක නැතුව හරි ඒ අවශ්‍ය කටයුත්ත කරන්න. ඔබතුමන්ලා මැදිහත් වෙන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි අපේ විලේගේ මන්ත්‍රීතුමා ඒ කතා කරපු අතරෙම කිව්වා. මිල වැඩි වෙච්ච දේවල් ගැන. තේ මිල,කුරුඳු මිල,ගම්මිරිස් මිල වැඩි වුනා. ඇත්තටම ඒක හොඳයි අපේ ආර්ථිකයට අපේ ප්‍රදේශයට ඒක ඉතාමත්ම වටිනවා. නමුත් එතුමා කිව්ව වගේම සති තුනක් ඇතුලත ඔබතුමාලට එච්චර දෙයක් කරන්න හැකියාව ලැබුනා. ඒ ගැන මම සතුටු වෙනවා වගේම මම කණගාටු වෙනවා හාල් මිල පැනු මිල රුපියල් 10 වත් අඩු කරන්න හැකියාව නොලැබීම ගැන. මොකද අර වැඩි කළා වගේම ඒ සති තුන ඇතුලත රුපියල් පහකින් හරි අඩු කරන්න පුලුවන් වුනානම් ඒක වටිනවා. එක එක වැඩට තමයි රජයක් තියෙන්නෙ. එක එක ඇමතිවරු ඉන්නෙ. ඒ සඳහා යම් මැදිහත් වීමක් කරලා මිල පාලනයක් කරලා එහෙමත් නැත්නම් පිට රටින් හරි තාවකාලිකව ගෙන්වලා, අපි කුඹුරු වගා කරලා ඒව එනකොට මාස ගණනක් යනවා. අර කරපු දේම ඒකටත් කළානම් හොඳයි කියල ඔබතුමන්ලගෙ මැති ඇමතිවරුන්ට ඒකත් යෝජනා කරල ආරම්භයක් ලබාගන්න කියල මේ ගරු සභාවෙදි මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි විශේෂයෙන්ම ඒ සියලු කාරණාවලට අමතරව මම ගරු සභාපතිතුමාට මුලින්ම කිව්වෙ. පෙරපාසල් සඳහා අපි නිළ ඇඳුම් ලබාදෙනවා නම් අපට ඇත්තටම මේ පෙරපාසල් ප්‍රමානය බර වැඩියි. මොකද පෙරපාසල් 15 ක් කියන්නෙ දකුණු පළාතෙ කිසිම පළාත් පාලන ආයතනයකින් නඩත්තු කරන්නෙ නැති පෙරපාසල් ප්‍රමාණයක්. නමුත් අපි ඒක නඩත්තු කරනවද කියල හිතෙනවා. අපි නිකන් ළමයි ටිකක් හදල අයාලේ යවනව වගේ වැඩක්. ඒ 15 ට අවශ්‍ය පහසුකම් අපට දෙන්න බැරිනම්, අපට ඉදිරියෙදි හරි කරන්න තියෙන්නෙ. කිහිපයක් පුද්ගලික අංශයට හරි භාරදීලා කීපයක් අපට කරන්න පුලුවන් ප්‍රමාණයට නිසියාකාරයෙන් පවත්වා ගෙන යන්න. විශේෂයෙන් බද්දෙගම ප්‍රාදේශීය සභාවෙ පෙරපාසල් දෙකයි තුනයි තියෙන්නෙ. නමුත් ඒ අය ඒකෙ මුදල් අය කරන්නෙත් නැහැ. නිල ඇඳුමෙ ඉදල සියලුම වරප්‍රසාද පහසුකම් ඒ දරුවන්ට ලබා දෙනවා. නමුත් අපේ පෙරපාසල් ගණන ලොකුයි. පෙරපාසල් 15 ළමයි හාරසිය ගණනයි. නමුත් අපි ඒ ගොල්ලන්ට කරන දෙයක් නැහැ. අපේ මේක පාලනය කරනවා විතරයි. ඒ නිසා ඒක ගැන ඊට වඩා අවදානය යොමු කරන්න ඕන. ප්‍රමාණය අඩු කරලා හරි ඒ දරුවන් වෙනුවෙන් විශේෂයෙන් දුප්පත් දරුවො තමයි පුද්ගලික පෙරපාසල්වලට නොගිහිල්ල මේවට එන්නෙ. ඒ දරුවන් වෙනුවෙන් මීට වඩා යම් දෙයක් පුලුවන් ප්‍රමාණයට කරන්න අපි වගබලා ගන්න ඕන කියන එක තමයි මගේ පුද්ගලික හැගීම.

ඒ වගේම අපේ විලේගේ මන්ත්‍රීතුමා කිව්වා වගේ එතුමාට වතුර බවුසරය ලබාගන්න බැරිවෙලා තියෙනවා. වෙනත් වෙනත් දේවල් ගැන කිව්වා. ඇත්ත ඒ කතාව. එතුමන්ලටවත් එහෙම බැරිනම් අපි ගැන මොන කතාද? විශේෂයෙන්ම මම කියන්න ඕන. සමහර වෙලාවට වතුර බවුසරයක් අපට ගන්න බැරිවුනාට මේ සභාවෙ වැඩ කරන රියදුරෙකුට කතා කළා නම් ඒක පැය භාගෙන් හම්බවෙනවා. මේ ගරු මන්ත්‍රී කෙනෙකුට පක්ෂ විපක්ෂ කාටවත් ඒක කරන්න බැරිවෙලා තියෙනවා. සභාපතිතුමාට කරන්න පුලුවන්කම තියෙනවා. නමුත් අපි ඒක දැකල තියෙනවා. අපි ඒක අත් දැකීමෙන් කියන්නෙ. නමුත් ඒක එහෙම වෙනවනම් මේ ගරු මන්ත්‍රීවරු විදිහට අනිත් 26 දෙනාත් කණගාටුවට පත්වෙන්න ඕන. අපි බොරුවට ඇවිල්ල අයවැයට විතරක් ඡන්දෙ දෙන එක නෙවෙයි. ඒ ගැනත් ඔබතුමා හරි කවුරු මේ පුටුවට මොන පක්ෂෙන් පත්වුනත් ගරු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂාවෙන විදිහට කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි විලේගේ මන්ත්‍රීතුමා සඳහන් කරපු වතුසමාගම් වලින් ගොම අදින එක ඇත්තටම අපි නිරන්තරයෙන් කතා කළා. එක දවසක් මම හෝමදොල වත්තෙ ජල යෝජනා ක්‍රමයක ආරම්භක රැස්වීමට ගිහිල්ල එන කොට හෝමදොල වත්තෙ ප්‍රධාන කාර්යාලය ඉස්සරහ ගොම ලොරි හතක් තිබුනා. මම එවලෙම ඔබතුමාට කතා කරල ඇහුවා. ඒකට ක්‍රියාමාර්ගයක් වුනේ නැද්ද කියලා. ඔබතුමා කිව්ව වුනා කියල. ඊට පස්සෙ හොයල බලනකොට ලියුම තාම මේසෙ උඩ කිව්වා. නමුත් අපි ලියුම් ගැහුවට මදි පොලීසිය සහ අපේ බලතල පාවිච්චි නොකරන එකේ ලොකු අඩුපාඩුවක් මේ සභාවෙ තියෙනවා. ඉතිහාසෙ මට මතකයි හිටපු සභාපතිවරු සමහර අවස්ථාවන්වලදි මීට වඩා ඒවට බලපෑම් කළා. අවශ්‍ය දේට බලපෑම් කරන්න අපට හැකියාව තියෙනවා. අපට මෙතන කතා අහන් නැතුව, අපට පනතෙන් ලැබුණු බලතල පාවිච්චි කරනවනම්. අපට මන්ත්‍රීවරු විදිහටත් මීට වඩා පෞර්ෂය තියාගෙන ගම ඇතුලට ගිහිල්ලා කටයුතු කරන්න හැකියාව තියෙනවා. ඔබතුමාට හරි දුරකතන ඇමතුමක් දුන්නම ඒක වෙන බව දන්නවා. සමහර වෙලාවට මිනිසුන්ගෙන් ඇහුවොත් එතනට නම් කියන්න එපා අපි ඇතිවෙන්න කියල තියෙන්නෙ කියන අවස්ථා තියෙනවා. ඉතිං ඒ ගැන අද වගේ දවසක මම කණගාටුවෙනවා. ඔබතුමාට ඔබතුමාගෙ කණ්ඩායමෙන්ම ඒ වගේ චෝදනාවක් එන එක ගැන. ඒකතාව 100% නිවැරදියි. ඒ නිසා ඉදිරි වසරේදිවත් මේ අඩුපාඩු සිදු නොවෙන්න කටයුතු කරමු කියල ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම උඩුගම නගරයේ විදුලි පහන් පත්තු වෙන්නෙ නැහැ. උඩුගම ඉස්කෝලෙ ලග දැන් තාප්පෙ තීන්ත ගානවා. මොනව හරි වැඩක් කරන්න යනවා. නමුත් ඒ හරියෙ එකම බල්බ් එකක්වත් පත්තු වෙන්නෙ නැහැ. ඉතිං ඇත්තටම අපේ මේ ප්‍රාදේශීය සභාවෙ නාගොඩටත් මාපලගමටත් එක

එක විදිහට නෙවෙයි. සියලුම ප්‍රධාන නගර ටිකට කරන දේවල් සාධාරණ ආකාරයෙන් සිදු කරන්න කියලත් ඉල්ලා සිටිනවා. පාර පළල් කළාට පස්සෙ ලයිට් කනු මාරු කළා. ඊට පස්සෙ සමහර කනුවල වීථි පහන් හයිකරලවත් නැහැ. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි පොඩි සුභ පැතීමක් කරන්න ඕන. උඩුගම මූලික රෝහල දකුණු පළාතෙ මූලික රෝහල් අතුරින් පහුගිය අවුරුද්දෙ ප්‍රථම ස්ථානය ලබා ගත්තා. එය අපේ බල ප්‍රදේශයේ වීම අපට ලොකු භාග්‍යයක්. ඒ වගේම ඒ රෝහලේ සිකුරාදා දිනයෙදි සියලුම පරීක්ෂණ නොමිලේ කරනවා. දහස් ගණනක් යන පරීක්ෂණ නොමිලේ කරලා උදේට කැඳ වීදුරුවකුත් සමග සෑම සිකුරාදා දිනයකම 80 දෙනෙකුට ඒ පහසුකම සලස්වනවා. ඉතාම හොඳ වැඩ පිළිවෙලක් කරගෙන යනවා. වර්ථමානේ ආපු සුසන්ත පුනාන්දු කියන අධ්‍යක්ෂකතුමා ඉතාම සාර්ථකව මේ ප්‍රදේශයට විශාල මෙහෙවරක් කරන්න උත්සාහ කරනවා. ඒ සඳහා අපි ප්‍රාදේශීය සභාව විදිහට අපට දෙන්න පුලුවන් යම් සහයෝගයක් තියෙනව නම් සහ ඒ කමිටු රැස්වීම්වලට හරි සහභාගිවෙලා දායකත්වය දෙන්න පුලුවන්නම් ඒක විටිනා බව ප්‍රකාශ කරනවා. ඔබතුමන්ලා ඒ ලබපු ජයග්‍රහනයට නැවත වතාවක් අපගේ ප්‍රණාමය සහ සුභ පැතුම් එක් කරමින් නැවතත් වතාවක් අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා වෙනුවෙනුත් ඡන්දය ප්‍රකාශ කරපු නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම ඡන්ද දායකයන්ටත් අපගේ ස්තූතිය කණ්ඩායම විදිහට අප ප්‍රධානය කරමින් මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාගේ අනාගතය අඩුපාඩුවකින් තොරව 2020 වසරේ සිට මේ ප්‍රදේශවාසීන්ට නියම ප්‍රතිඵල ලබන්න හැකියාව ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම ප්‍රථමයෙන්ම අභිනවයෙන් පත්වූ අපේ ගරු හත්වන ජනාධිපති වන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සුභ පතනවා. ඒ වාගේම එම ජයග්‍රහනය ලබා ගැනීමට සහයෝගය ලබා දුන්නු සියලුම ජනතාවටත් මේ වෙලාවෙ සුභ පතන්න අවස්ථාවක් කරගන්නවා. ඒ වාගේම අපේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාටත්, එතුමා වෙනුවෙන් ඡන්දය ලබාදුන් සියලු දෙනාටමත් මම සුභ පතනවා. ඒ වාගේම අප පක්ෂයක් වශයෙන් තීරණයක් ගත්තෙ නැහැ. එක් පක්ෂයකට සහයෝගය ලබා දෙනවා කියල. පක්ෂයක් වශයෙන් අපට නිදහස ලබා දුන්නා. ඕනෑම කෙනෙකුට, සුදුසු කෙනෙකුට, රට පාලනය කරන්න පුලුවන් රටට අනාගතයක් උදා කරන්න පුලුවන් කෙනෙකුට, අපගේ ඡන්දය පාවිච්චි කිරීමට. අපට කැමති කෙනෙකුට සහයෝගය ලබා දෙන්න අපේ පක්ෂය අපට අවස්තාව ලබා දුන්නා. එම අවස්තාවෙදි මමත් මගේ නායක තුමත් තීරණය කළා. අපට මේ වෙනකොට අපේ රටට අවශ්‍ය වන්නේ මේ වගේ නායකයෙක්.ඒ ප්‍රතිපත්ති රාමුව තුල මේ ප්‍රතිපත්ති රාමුව තමයි සුදුසු මේ රටට කියලා. අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සහයෝගය ලබා දෙන්න මමත් මගේ සභාවේ සභාපතිතුමාත් තීරණය කළා. එහිදී මෙම අවස්තාවේදී මට පක්ෂ වශයෙන් කිසිම කෙනෙක් ආරාධනා කළේ නම් නැහැ. අපට සහයෝගය දෙන්න. මෙයාලට සහයෝගය දෙන්න කියලා. අනාගතේ ළමයින්ට රටක් අවශ්‍යයි.ඒ නිසා ඒ ළමයින්ට අවශ්‍ය මේ නායකයා නිසා මම තීරණය කළා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සහයෝගය ලබා දෙන්න. මේ විශාල ජනවරමක් ලබාගෙන මේ නායකත්වය ලබාගත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සහයෝගය ලබා ගන්න. අපේ මේ විශාල ජන කොටසකගෙ බලාපොරොත්තු රැසක් තියෙනවා. ඒ රැස ඉෂ්ඨ කිරීමට නම් අපේ බිම් මට්ටමේ නායකයා වන්නේ අපේ බල ප්‍රදේශයේ ගරු සභාපතිතුමායි. ඉතිං සභාපතිතුමා ප්‍රමුක මේ මන්ත්‍රී මණ්ඩලය, ඉතා දක්ෂ මන්ත්‍රී මණ්ඩලයක් ඉන්නවා. ඉතිං මේ ජනවරම ලබාදුන් විශාල ජනතාවට ඔවුන්ගේ බලාපොරොත්තු ඉෂ්ඨ කර දීමට සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලය කටයුතු කරන ලෙස ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඉතිං ගරු සභාපතිතුමනි මම 2018 වර්ෂයේ අයවැයට විරුද්ධව ඡන්දය ලබා දුන්නා. ඒ අයවැයට විරුද්ධව ඡන්දය ලබා දුන්නෙ මූල්‍ය කළමනාකරණය පිළිබඳව ගිය වසරේදි මගේ කිසිම පැහැදීමක්

තිබුනෙ නැහැ. ඒ වාගේම ඒ පිළිබඳ යම් යම් අඩුපාඩු රාශියක් තිබුනා. ඒ වාගේම එයට අනුරූපව 2019 වර්ෂයේ ගොඩාක් විගණන වාර්තා දෙස බැලුවමත් 2019 වර්ෂයේ සංවර්ධන කටයුතු දෙස බැලුවමත් සාමාන්‍යයෙන් 2018 වර්ෂයට වඩා විශාල වැඩ කොටසක් ඔබතුමා විසින් අප බල ප්‍රදේශයට කරල තිබුනා. එම නිසා මම මේ සැරේ 2019 අයවැය ලේඛනයට පක්ෂව ඡන්දය දෙන්න තීරණය කළා. ඉතිං ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල දැන් පාරවල් ටිකක් සුද්ද වෙනවා. තව කියන්න තියෙන්නෙ වීථි ලාම්පුත් ඔබතුමා කිව්ව වගේම දැම්මා. ඒත් ගරු සභාපතිතුමනි වීථි ලාම්පු දාලා දවස් දෙකක් තුනක් යන කොට වීථි ලාම්පු පිච්චිලා යනවා. ඊලග වතාවටත් දැම්මත් ඒ විදිහයි. මම හිතන්නෙ මේ වීථි ලාම්පු මොනව හරි ක්‍රමයකින් පිච්චෙන්නෙ බාලවර්ගයේ බල්බද? නැත්නම් ප්‍රමිතියක් නැති බල්බද? කියල දන්නෙ නැහැ. ඒ නිසා තමයි නිතරම මේ ප්‍රශ්නය පැන නැගෙන්නෙ. බල්බ් දැම්මට බල්බ් පත්තු වෙන්නෙ නැහැ. ඒ නිසා ඉංජිනේරුවා ලවා ඒ ගැන අවදානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා. ඊලගට ගරු සභාපතිතුමනි, කුරුපනාව වංගුව කඩේ අසල ගල් ගොඩ ගහලා තියෙනවා. එතනටත් වීථි ලාම්පුවක් ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා. ඉතිං ගරු සභාපතිතුමනි, ඉදිරියේදි හොඳ සංවර්ධන වැඩසටහන් ටිකක් අප බල ප්‍රදේශයට කරගෙන යාමට ඔබතුමාටත්, ඔබතුමාගේ මන්ත්‍රී මණ්ඩලය ඇතුලු මමත් මන්ත්‍රීවරියක් වශයෙන් ප්‍රදේශයේ අපටත් සහයෝගය ලබාදීලා මගෙත් යම් යම් යෝජනා ඔබතුමාට 2019 වර්ෂයේ 2018 වර්ෂයේ මම දීපු යෝජනාත් මම හිතන්නෙ නැහැ නොසුදුසු යෝජනා කියල. ඒවා සුදුසු යෝජනා වෙන්න ඕන. අපේ ව්‍යවස්ථාව අනුව දීපු යෝජනා. ඒ නිසා ඒ ගැන සළකා බලා ඒවටත් සහයෝගයක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවා කියා පතමින්, නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුනි, ලේකම්තුමිය ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. 2020 අයවැයට අපි සුබ පතනවා ඔබතුමාට ඡන්දය නොදුන්නත් ඉදිරි වැඩ කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියල. ඒ වගේම ඔබතුමා කැමති ඔබතුමා දන්න කියන ඔබතුමාලට වැඩ කරන්න පුලුවන් ජනාධිපතිවරයෙක් ඉන්නවා. ඒ හින්දා මම විශ්වාස කරනවා. ඔබට ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දෙ යමක් කරන්න පුලුවන් වටපිටාව අනිවාර්යයෙන් ගොඩනගා ගන්න පුලුවන්. ඔබතුමා කැමති කෙනා අපේක්ෂකයෙක් හැටියට ඉදිරිපත් වෙලා ඔහු ජයග්‍රහනය කළා. ඒ විතරක් නෙවෙයි ඔබතුමාල බොහොම සම්බන්ධකම් තියෙන ඇමතිවරයෙක් පත්වෙලා තියෙනවා. රමේෂ් පතිරණ මැතිතුමා. එතුමාත් එක්ක සම්බන්ධ වෙලා තවත් මේ සභාවට යමක් කරන්න පුලුවන් ශක්තිය ලැබෙයි කියල අපි විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, කාරණා දෙකක් ගැන කතා කරන්න කතා කළේ. එකක් තමයි මාමනදොල යටලමත්ත මාර්ගයට ලක්ෂ 284 ක මුදලක් පාස්වෙලා තිබුනා. අනුමතවෙලා ඔක්කොම වෙලා තිබුනෙ බොරු නෙවෙයි මේවා. ගිවිසුම් අත්සන් කළා. නමුත් අපට වැඩ කරන්න බැරි වුනා. ලංකාවෙ හැම තැනටම මුදල් අමාත්‍යාංශයෙන් එවපු චක්‍රලේඛයක් නිසා දැන් මේ වැඩේ ඉවර වෙලා තියෙනවා. ඒ නිසා මොන ක්‍රමයෙන් හරි ඔබතුමා සම්බන්ද වෙලා, මේ මුදල ආපහු ගියොත් මම විශ්වාස කරන්නෙ නැහැ. ආපහු ගන්න පුලුවන් වේවි කියලා. ඒ පාරෙ යන්නම බැහැ. කවුරු කළාද කියල නෙවෙයි වැදගත් ගමට පාර අවශ්‍ය නිසා විජිත් මන්ත්‍රීතුමා, ඔබතුමාලගෙ සංවිධායකතුමා දිස්ත්‍රික්කෙ ප්‍රධාන ඉංජිනේරුතුමිය එක්ක සාකච්ඡා කරල තියෙනවා. මොකක්ද ඒකට කරන්න පුලුවන් කියලා. එතුමියගෙ මට්ටමින් එතුමිය උපදෙස් දීල තියෙනවා. නමුත් ඔබ දෙපල මේ පිළිඳව උනන්දු වෙලා කටයුතු කරන්න. මොකද මේ ලක්ෂ 284 ක මුදලක් ආපහු ගියොත් මම විශ්වාස කරන්නෙ නැහැ. ආපහු ඒක යටලමත්තට ගේන්න පුලුවන් වේවි කියලා. ඒක අනුමත වෙලා ඔක්කොම කරල තියෙන්නෙ. ඒ හින්ද මම හිතන්නෙ ඒකට වෙනම ලියුමක් ගහලා ගෙනාවොත්

මේක කරන්න පුලුවන් වේවි කියල මම විශ්වාස කරනවා. මොකද 70 කන්ද මාර්ගයත් ඕකටම පටන් ගන්න තිබුන දෙයක්. ඒ නිසා මේ පිළිදව ඔබේ අවදානය යොමු කරන්න කියල කියනවා.

ඒ වගේම ඔබතුමාගෙ යෝජනාවක් හැටියට යටලමත්ත 70 කන්ද ලක්‍ෂ හයක කොන්ක්‍රීට් කරන්න යෝජනා කරලා තිබුනා. මම දැන් දැක්කෙ මම කියනවා ඒක කොන්ක්‍රීට් කරන්න එපා සභාපතිතුමනි. මොකද ලක්‍ෂ 230 වියදම් කරල කාපට් කරල කිලෝමීටරයක් ඉවරවෙන තැන කොන්ක්‍රීට් කළහම ඒක මහ අපරාධයක්. මොකද ලොකු ලොරියකට යන්න බැහැ. අඩුම තරමින් මේක පන්සල ගාවට වෙනකම් වත් තාර දාන්න. දැන් මේ ලක්‍ෂ හය ඔබතුමාල මේක තාරවලට මාරු කරන්න. මොකද කොන්ක්‍රීට් කළහම එතනින් එහාට ලොකු වාහනයක් යන්න බැහැ. කඳන් ලොරියක් ගියත් කියුබ් තුනේ ලොරියක් ගියත් පාරෙ කොන්ක්‍රීට් එක කුඩුවෙලා යනවා. ඒ නිසා මේක අසාර්ථක වැඩක්. මොකද අර ලක්‍ෂ 230 වියදම් කරල හදන පාරෙනුත් වැඩක් නැහැ. ඒ නිසා අපරාදයක් මේක. මම කියන්නෙ ඒ ලක්‍ෂ හය නවත්වන්න කියන එක නෙවෙයි. වැරදියට තේරුම් ගන්න එපා. ලක්‍ෂ හය මාරු කරන්න තාරවලට. නැත්නම් මේ ලක්‍ෂ හය නිකන් කුඩු කරන සල්ලියක් වෙනවා. දැන් ඒකෙ දාපු කොන්ක්‍රීට් එකත් කුඩු කරල තමයි කාපට් එක දැම්මෙ. මේ පිළිබඳව ඔබතුමා අවදානය යොමු කරන්න. නැත්නම් අපරාදෙ මම හිතන විදිහට ගිවිසුම් අත්සන් කරල තියෙන්නෙ. මොකද මේ ලක්‍ෂ හය අපරාද මුදලක් වෙනවා. කොන්ක්‍රීට් කළොත් පාරෙ වටිනාකමකුත් නැති වෙනවා. ගමට වැඩකුත් නැති වෙනවා. මේ වැඩේ කළොත් ලොකු වාහනයක් ඒ ගමට ඇතුල් වෙන්න තියෙන ප්‍රමාණය නැතුව යනවා. මේක මොන ක්‍රමෙන් හරි වෙනස් කරලා තාරවලට දාගන්න. වෙනස් කරන්න බැරිනම් මම කියන්නෙ ඔතනම පොඩ්ඩක් එහෙ මෙහෙ කරල වෙන තැනකට දාන්න කියන එක පිළිබඳවත් සිහිපත් කරනවා.

ඒ වගේම සියලු ප්‍රති පක්‍ෂ මන්ත්‍රීවරුන්ට ඔබ ජයග්‍රහනය භුක්ති විඳීම පිළිබඳව අපි ස්තූතිවන්ත වෙනවා. ඒක කෙනෙකුට කරදරයක් නොවෙන්න හිරිහැරයක් නොවෙන්න ඔබ යම් ක්‍රියාකාරකම්වල යෙදුනා. ඒ පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. නමුත් යටලමත්තෙ මංසංදියේ ඒ හැසිරීම පිළිබඳව අපි බොහොම කණගාටු වෙනවා. ගරු සභාපතිතුමාගෙ නෝනගෙ ගෙදරටත් ඒ හානියම කළා. එයාලා ලොකු පීඩාවකට පත්කළා. ගයාන් මන්ත්‍රීතුමාල හැසුරුනා අපි බොහොම සන්තෝෂ වෙනවා. නමුත් ඒ යටලමත්ත හන්දියෙ හැසිරීම පිළිබඳව ඇත්තටම අපි කණගාටු වෙනවා. මොකද කිසිම මන්ත්‍රීවරයෙක් කිසිම ප්‍රධාන කවුරුවත් එහෙම හානියක් කළේ නැහැ. මිනිස්සු පීඩාවට පත්කළේ නැහැ. ඔබේ ඥාති සිරිමාන්න පවුලත් පීඩාවට පත්වුනා එතන හැසිරුන විදිහට. ඒ හැසිරීම පිළිබඳව අපි කණගාටුවට පත් වෙනවා. අපි දැක්ක ගයාන් මන්ත්‍රීතුමාලා, පියල් මන්ත්‍රීතුමාලා යම් යම් ක්‍රියාකාරකම් කරනවා. නමුත් පොදුවෙ කාටවත් එහෙම හානියක් වෙනවා අපි දැක්කෙ නැහැ. අපි 2015 ජයග්‍රහනය කරල කාටවත් වචනයක් වත් කිව්වෙ නැහැ. මොකද අනිත් හැසිරීම් පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ඒව සුබ වාදීව දකිනවා. නමුත් යටලමත්ත මන්සංදියේ ඒ හැසිරීම පිළිබඳව නැවතත් අපි කණගාටු වෙනවා. ඔබතුමාල දෙපලම වෙන්න ඇති නායකත්වය නොදුන්නෙ. නමුත් ඒ තරුණයන් පිළිබඳව අපේ කණගාටුව පෞද්ගලිකව ප්‍රකාශ කරනවා.

ඒ වගේම ධනංජය මන්ත්‍රීතුමා ගොම ප්‍රශ්නය පිළිබඳව කතා කළා. පෞද්ගලිකව ඒක මමත් දැක්කා. මහා විනාශයක් වෙන්නෙ. අපේ උප සභාපතිතුමාත් කිව්වා. නමුත් මෙතනින් ගත්ත ක්‍රියාමාර්යක් පිළිබඳව තරංග මන්ත්‍රීතුමා කතා කළා. ඇත්තටම සභාපතිතුමා ඕකට නැවතත් ලියුමක් ගහල අපි හැල්ලුවට ලක් වෙන්න ඕන නැහැ. ඒකට මොනව හරි කරන්න ක්‍රමවේදයක් තියෙනවනම් ඒක වහාම ක්‍රියාත්මක කරන්න. ලියුම් ගහ ගහ එයාට කතා කරලා, මෙයාට කතා කරලා වැඩක් නැහැ. වටවල අධිකාරී සභාව සභාපතිවරයව සත පහකට ගණන් ගන්නෙ නැහැ. ඉතිං ලියුම් ගහන්නෙ මොකටද? කිසිම වතු අධිකාරීවරයෙක් මේ සභාවෙ සභාපතිවරයා සහ සභාවෙ මන්ත්‍රීවරු ගණන් ගන්නෙ නැහැ. ඒක අපි නිසා නෙවෙයි ඔබතුමා නැති කර ගනිපු දෙයක් කියල පෞද්ගලිකව මම දකිනවා. නමුත් විලේගේ සභාපතිවරයා ඉන්න කොට වතුවලින් යම් සැලකිල්ලක් මෙතනට තිබුනා.

දැන් අද වෙනකොට ඔබේ හැසිරීමත් එක්ක වතු සමාගම් පාලන අධිකාරිය අපට සහයෝගයක්වත් අපට සැලකිල්ලක්වත් දක්වන්නෙ නැහැ. අපි පෞද්ගලිකව දකින දේ කිසිම වත්තක කිසිම ක්ෂේත්‍ර නිලධාරියෙක්වත් මේ සභාව කියනදේ අහන්නෙ නැහැ. මොකද එයාලට ඕන ඕන විදිහට පාරවල්වල වැඩ කරන්නෙ. පාරවල්වල වතුර පාරවල් එවන්නෙ. දැන් ගිහින් බලන්න වතුවල ඔක්කොම වතුර ටික එන්නෙ ප්‍රධාන පාරට. ඔබතුමා බලන්න දියවර ගම්මානෙ පාරෙ යන්න පුලුවන්ද? වතුවල සියලුම වතුර එන්නෙ පාරට. ඒවා මොනවත් කරන්නෙ නැහැ. ඒව ගැන අපි කතා කරල වැඩකුත් නැහැ. එයාලට ක්‍රියාමාර්ගයක් ගන්නෙ නැහැ කියල,ගත්තට වැඩක් නැහැ කියල පාලන අධිකාරිය දන්නවා. ඒ හින්ද මේ පිළිබඳ අවධානය යොමු කරලා ගොම ප්‍රශ්නය ඇත්තටම ප්‍රශ්නයක්. ධර්මසිරි මන්ත්‍රීතුමත් කතා කළා. දැන්ම නවත්වල මොනව හරි ක්‍රමවේදයක් හදන්න. ලියුම් ගහල වැඩක් නැහැ. ඔබතුමා සභාපතිවරයා හැටියට යම්කිසි බලතලයක් තියෙනවනම් ඒක ක්‍රියාත්මක කරන්න කියල ඉල්ලමින් ලබන්නා වූ 2020 නව වසර සියලුම දෙනාට සුබ නව වසරක් වේවායි කියලා ප්‍රාර්ථනය කරනවා.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ මමත් ලක්රුවන් මන්ත්‍රීතුමාගෙන් පොඩි ඉල්ලීමක් කරන්න කැමතියි. මොකද අපේ ගමෙත් පාරවල් දෙකක මුදල් නැවත යන තත්වෙට ඇවිල්ලා තියෙනවා. ඒ පාරවල් දෙකේ මුදල් කොහොම හරි නැවත රඳවගෙන,ඒ පාරවල් දෙක ඔබතුමන්ලගෙ අධීක්ෂණය යටතෙවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද ගමට ආපු සල්ලි නැවත ගියොත් ආපසු ගන්න බැරි නිසා. කොහොම හරි අපි යන පාරවල් ඒව හැදෙන්න ඕන. ඒක නිසා ඒ පාරවල් දෙක ගැන අවධානය යොමු කරන්න.

ඒ වගේම තමයි හාල් ප්‍රශ්නය, හාල් මිල ඉහල ගිහිල්ලා බොහොම උග්‍ර අතට හැරිලා තියෙනවා. ඒවගේම ගමේ තියෙන කුඹුරු ටික මුඩු බිම් බවට පත් වෙමින් යනවා. ගොවි ජනතාවට මොනව හරි සහනයක් ලබා දීලා කුඹුරු ටික කරන්න මොනව හරි වැඩපිළිවෙලක් ගේන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින්, ලබන්නා වූ 2020 වසර සැමට සුබ නව වසරක් වේවායි කියල ප්‍රාර්ථනා කරමින්, මගේ කතාව අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ලේකම්තුමිය ප්‍රධාන සභාවේ කාර්යය මණ්ඩලය සිහිපත් කරනවා. මම මුලින්ම අභිනව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ට අපේ සුභ පැතුම් පිරිනමනවා. ඒ වගේම එතුමන් ජනතාව හමුවේ ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු කරුණු කාරණා ඉදිරි මාස කීපය තුල හෝ ඉදිරි කාලවකවානුව තුල එතුමාට ඉෂ්ඨ සිද්ද කරන්න ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනය කරනවා. ඒ වගේම සභාපතිතුමනි මේ වෙලාවෙ සඳහන් කරන්න ඕන. පසුගිය දවස්වල පත්වුන අභිනව ජනාධිපතිතුමාගෙ නිර්දේශයක්ද මන්ද? සියලු ව්‍යාපෘතිවල දැන්වීම් බෝඩ් සභාව විසින් ඉවත් කරනු ලැබුවා. සභාපතිතුමනි මම එකක් සඳහන් කරන්න ඕන. ගෝනලගොඩ ගම්මැද්දෙගොඩ හොරංගල්ල මාර්ගයේ තවම වැඩ අවසන්වෙලා නැහැ. හැබැයි අර ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගේ පිංතූරය රැගත් විශාල දැන්වීම් පුවරුවනම් ගලවගෙන ඇවිල්ලා තියෙනවා. තවම පාරෙ වැඩ ඉවර වෙලා නැහැ. ඉතිං මේක ඔබතුමාලගෙ රජයේ නියෝගයක් අනුවද?නැත්නම් චක්‍ර ලේඛන ඇවිල්ලද? මේව කළේ කියල අපි දන්නෙ නැහැ. වැඩ අවසන් නොවෙච්ච පාරවල් වලත් ඇස්තමේන්තු මුදල ඇතුලත් වැඩ ආරම්භ කිරීමට ලබා දීපු ඒ දැන්වීම් පුවරු ගලවලා. මම බැලුවා ඒ බොඩ් එක ගෙනැල්ල මේ එහා පැත්තෙ තියෙනවා. මේ පිළිබඳ ඇමතිතුමත් මමත් එක්ක කතා කළා. ඉතිං මම කිව්වා අපි දන්නෙ නැහැ මේ අලුත් ආණ්ඩුවෙ වැඩ වෙන්න ඇති. ඉතිං මේ ව්‍යාපෘති අවසන් වෙලානම් කමක් නැහැ. ව්‍යාපෘති අවසන් වෙලාත් නැහැ. බෝඩ් එක ගලවගෙන ඇවිල්ලා තියෙනවා.

ඒ වගේම පරිසර හානිය පිළිබඳ කතා කරනවානම්, මේ අලුතින් පත්වුන ජනාධිපතිතුමා ජනාධිපතිවරණ ව්‍යාපාරය ආරම්භයේ සිටම ඒ පිළිබඳව දැඩිව හිතපු කෙනෙක් හැටියට මම කණගාටු වෙනවා. ඔබතුමත් අර මුලනෙ තරුණයා මිය ගිය දවසෙ කොඩිවැල් ඇදල තියෙනවා දැකල කිව්ව මේක පරිසරයට හානියක්. මේ වැඩේ අවසන් වුනාට පස්සෙ ගලවල දාන්න කියල එදා අවමංගල සභාවෙදිත් කතා කළා. හැබැයි දැන් ඊට වැඩිය පරිසර හානියක් අපි දකිනවා. මොකද මේ පස් ගල් වැලි ප්‍රවාහනය කරන්න තිබුන නීතිමය රාමුව කැබිනට් මණ්ඩලය විසින් නිදහස් කරල තියෙනවා. ඉතිං ඒ නිසා පෙරේද මම ප්‍රධාන පාරෙ එනකොට දැක්ක මේ පස් ජාවාරම දිගින් දිගටම මහා පරිමාණයෙන් සිදුවෙනවා. මොකද පහුගිය කාලේ ඔබතුමාලට සම්බන්ද දේශපාලන දහරාවෙ ඉන්න සමහර ව්‍යාපාරික ප්‍රජාව මේ කටයුත්ත කර ගන්න බැරුව හිටියෙ. හැබැයි දැන් ඒක බොහොම ජාමෙට කරනවා. මම දැක්ක ඒ ප්‍රධාන පාරෙ එනකොට මේ පස් අදින වාහනවලින් වැටුන පස් නිසා බයිසිකලයකින් ගමන් කරන පුද්ගලයෙක් ලිස්සල වැටිල තුවාල වෙලා තිබුනා. ඇත්තටම මේ පස් අදින මිනිස්සු මේ ප්‍රධාන පාරක්ය කියල හිතන්නෙ නැතුව පස් ඇදල ඒකෙන් හානියට පත්වුනේ අහිංසක මනුස්සයෙක්. ඉතිං මේක යම් ක්‍රමවේදයකට පහුගිය රජයෙන් කරගෙන ආවා. මේකට ගොඩක් පරිසර සංවිධාන විරෝධය පළ කරලා තියෙනවා. ඉදිරියෙදි ඒක යම් මට්ටමකට පාලනය වෙයි කියල මම හිතනවා. මේ පරිසර හානියත් එක්ක පරිසරය ආරක්‍ෂා කරන්න පොරොන්දු වෙච්ච අපේ නායකයො. ඒ කියපු කරුණු කාරණා අමතක කරල වැඩකටයුතු කරන්න ලේස්ති වෙනවයි කියල මට හිතෙන්නෙ. ඉතිං මේ පරිසරයට වෙන හානිය නිසා තමයි අපි කටුපොල් පිළිබඳව දැඩිව අපේ උප සභාපතිතුමත් තරංග මන්ත්‍රීතුමාල කට්ටියම පහුගිය වසරෙත් මේ වසරෙත් දිගින් දිගටම කතා කළේ. ඒ ප්‍රශ්නෙටත් ඔබතුමාලගෙ ජනාධිපතිතුමන්ගෙ යටතේ විසඳුමක් ලබා ගන්න හැකිවෙයි කියල මම හිතනවා. මොකද මේ පරිසරයට ආදරය කරන නායකයෙක් ඔබතුමන්ල පත්කර ගත්ත හින්දා.

ඉතිං මම මේ වෙලාවෙ තව එක කාරණයක් කියන්න ඕන. සභාපතිතුමනි, කුරුපනාව තේ කම්හලට යන මාර්ගයේ වැලි සෝදන තොටුපොලක් තියෙනවා. කුරුපනාව තේ කම්හලට යන මාර්ගයේ කුරුපනාව තේ කම්හලත් ගෝනදෙණිය මාර්ගයත් අතරතුර මාර්ගයේ වැලි අදින වාහන නිතර ගමන් කරන නිසා පාර ගිලා බසින තත්වයකට ලක්වෙලා තියෙනවා. මට ඊයෙ රාත්‍රියෙත් ඒ ආසන්නයේ ජීවත් වෙන කෙනෙකු කිව්වා. බලන්න මේ මාර්ගය දැඩි ලෙස ගිලාබසින්න පටන්ගෙන තියෙනවා. වැලි පටවපු වාහන නිතර ගමන් කරන නිසා තමයි මේ මාර්ගය මේ තරමට අබලන් වෙන්නෙ කියලා. ඉතිං මේ සම්බන්දව සොයල බලන්න කියල ඔබතුමාට කියනවා. මොකද මේ කුරුපනාව තේ කර්මාන්ත ශාලාවට තමයි අපේ ප්‍රදේශයේ ඉන්න තේ දළු හිමියන් තේ දළු ලබල දෙන්නෙ. ඉතිං ඒක අපි ආරක්‍ෂා කර ගන්න ඕන. ඉතිං ඒ පිළිබඳ ඔබතුමාගෙ අවදානය යොමු කරන්න.

ඒ වගේම සභාපතිතුමනි මාපලගම මංසන්දිය පිරිසිදු කරන්න අපේ සභාවෙන් ලබා දීපු කම්කරු මහත්මා දැන් ඒ කටයුත්තෙන් අයින් වෙලා තියෙනවා. හැබැයි තවම ඒ සඳහා පුද්ගලයෙක් පත් කරල නැහැ. සභාපතිතුමනි, මාපලගම මංසන්දියේ ව්‍යාපාරික ප්‍රජාවත් ඒ වගේම ජනතාවත් මේ කුණු ප්‍රශ්නය නිසා දැඩි අපහසුතාවයට පත්වෙනවා. මේ කුනු පහුගිය කාලවකවානුව තුල හැමදාම උදේට සභාවෙ සේවක මහතෙක් ලවා සුද්ද පවිත්‍ර කරනු ලැබුවා. හැබැයි දැන් ඒ කටයුත්ත කෙරෙන්නෙ නැහැ. ඒ සඳහා ඉක්මන් පියවරක් ගන්න කියලා මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා. මොකද මාපලගම නගරය කියන්නෙ ප්‍රධාන බස් නැවතුම් පොලක්. ඒ වගෙම විශාල පිරිසක් නිතර ගැවසෙන ප්‍රදේශයක් හැටියට ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියල ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම සභාපතිතුමනි, මේ දිනවල කුඹුරු වගා කරලා තියෙනවා. මේ කුඹුරු හිමියන්ට දැඩි ප්‍රශ්නයක් තියෙනවා. ගවයින්ගෙන් වන හානිය. අපි හැමදාම පහුගිය සභාවල කතා කළා වගේ මේ ගවයින්ගෙන් කුඹුරුවලට වන හානිය සම්බන්ධව වැඩි අයිතියක් තියෙන්නෙ සභාවට. මේ සභාවේ ඔබතුමාගේ මැදිහත් වීම තුල බොහොම අමාරුවෙන් වගාකළ ගොවීන්ගේ

කුඹුරු ටික ආරක්ෂා කරල දෙන්න. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවත් එක්ක එකතු වෙලා මේකට යම් වැඩපිළිවෙලක් හදන්න කියල මම ඉල්ලා සිටිනවා. ඒ වගේම සභාපතිතුමනි, මේ කටයුතු සියල්ල ඉෂ්ඨ සිද්ද කළා වගේම ඔබතුමා 2020 නව වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කළා. තරංග මන්ත්‍රීතුමන් කිව්ව වගේ ඔබතුමන්ට පහු ගිය කාලෙ යම් යම් අපහසුතා තිබුනා. මොකද රජය වෙන පැත්තක සභාව වෙන පැත්තක තිබුනෙ. ඒක නිසා දැන් ඔබතුමාලගෙ ජනාධිපතිවරයෙක් ඔබතුමාලගෙ අගමැතිවරයෙක් ඔබතුමාලගෙ රජයක් තියෙන්නෙ. මේ ටික කාලය තුල හෝ ලබන අප්‍රේල් මැයි වෙනකම් හරි අපට සභාවට යම් මෙහෙවරක් කරන්න. මේ අයවැය තුල අඩංගු කරුණු කාරණා ක්‍රියාත්මක කරන්න ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනය කරමින්, මම නිහඩ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ දීර්ඝව කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. කොහොම වුනත් වනමල් මන්ත්‍රීතුමා සඳහන් කළ අර පස් සම්බන්දව ඒකට පිළිතුරක් දෙන්න ඕන. ඇත්තටම අපි මන්ත්‍රීවරු හැටියට කිසිම කෙනෙක් කිසිම ප්‍රසාදයක් නැහැ. රජය යම් ක්‍රමවේදයක් සකස් කරන්න අත්හදා බැලීමක් සඳහා තමයි ඒ ව්‍යපෘතිය සති දෙකක් සඳහා තමයි ඒක ලබා දීල තියෙන්නෙ. ඒ සඳහා විශේෂ වැඩපිළිවෙලක් ඉදිරියෙදි සකස්වේවි. ඒ වගේම අපේ ජනතාවත් ඒක වැරදි විදිහට තේරුම් අරන් ඒක නැවතත් තිබුනටත් වැඩිය දැඩි නීති ඉස්සරහට එන්න පුලුවන්කමක් තියෙනවා. ඒ අපේ හැසිරීම් රටාව අනුව තමයි ඒ සිදුවීම් සිදුවෙන්නෙ.

මම විශේෂයෙන් අද සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. උඩවැලිවිටිය කැප්පිටියගොඩ යා කරන කොන්ක්‍රීට් පාලම යාමට නුසුදුසු තත්වයෙන් ඉතා අබලන් තත්වයේ පවතිනවා. ගරු සභාපතිතුමා මේ පිළිබද විශේෂ අවදානයක් පහුගිය කාලය තුලදි යොමු කළා. අපේ ඉනෝකා මන්ත්‍රීතුමියත් කීප අවස්ථාවකදි සභාවෙදිත් කතා කළා. ඊයෙ දවසෙ අපේ TO මහත්තයත්, දිස්ත්‍රික් ඉංජිනේරුතුමත් ගිහිල්ලා ඒ පාලම නිරීක්ෂණය කළා. ඉතිං ඒ නිසා මම හිතනවා ගරු සභාපතිතුමනි, පළාත් ප්‍රධාන ලේකම්ට මේ සම්බන්දයෙන් දැනුම් දීලා ඒ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේ පාලම ලබා ගැනීම ගරු සභාපතිතුමාගේ අනුග්‍රය සඳහා අපි බලාපොරොත්තු වෙනවා. ඉතා ඉක්මනින්ම එය සිදු කරන්න ඔබතුමාගේ සහයෝගය මම විශේෂයෙන් අපේක්ෂා කරනවා.

ඒ වගේම උඩවැලිවිටිය ප්‍රජාශාලාව පිහිටි භූමිය ඒ භූමිය මීට පෙර අපේ පොදු අරමුදලෙන් මැනලා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. නමුත් ඒ ලිපි ලේඛන අස්ථාන ගත වීම නිසා ඒක අපට ලබා ගන්න බැරිවෙලා තියෙනවා. ඒක නිසා අපි සභාපතිතුමාට ආරාධනා කරනවා. ඊලග එන සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් දාලා පවරගෙන ඉදිරියට කරමු කියන එකත් සඳහන් කරමින් ඒ වගේම විශේෂයෙන් තවත් යෝජනා තිබුනත් ඒ යෝජනා මේකෙ දාල තියෙනවා. ඒ සඳහා අපට අවස්ථාව සලසා දෙන්න කියන ඉල්ලීම කරනවා. අපි විශේෂයෙන් සභාපතිතුමනි, මේ ගම්මැද්දෙගොඩ ඉදල උඩවැලිවිටිය රූකඩහේන දක්වා යන මාර්ගය තාර ගැලවිලා ඉතාම අබලන් තත්වයට පත්වෙලා තියෙනවා. ඒකෙ වලවල් ටික හරි වසා ගැනීම සඳහා පළාත් සභාවෙ අනුග්‍රයක් ලබා ගැනීමට හැකියාවක් තියෙනවානම් ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කරන්න කියන ඉල්ලීමත් මේ වෙලාවෙ කරනවා.

ඒ වගේම මම තව යෝජනාවක් කළා. ප්‍රජා ශාලාවෙ පෙරපාසලක් ආරම්භ කරන්න කියලා. ඒ සඳහා ඔබතුමා සමග සාකච්ඡා කරල ඉදිරියෙදි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මේ වෙලාවෙ ගොඩක් දේවල් කතා කරන්න හිටියත් කතා කරන්න වෙලාව නෙවෙයි. ඒ වගේම සභාපතිතුමනි, උඩවැලිවිටිය බටහිර පානීය ජල යෝජනා ක්‍රමයක් අපේ රජයෙන් සහ දැන් තිබුණු රජයෙන් මැදිහත් වෙලා අවසන් කළා. නමුත් ඒ පානීය ජල යෝජනා ක්‍රමය නිල් දියවර ප්‍රජා සංවිධානය කියල සංවිධානයක් හදාගෙන රුපියල් 15000 ක්, පළවෙනි ලීටර් 3000 ට රුපියල් 1000 ක් ඒ ආදී

වශයෙන් ලොකු මුදලක් අය කරලා අනවශ්‍ය විදිහට කටයුත්තක් සිදු කරගෙන යනවා. එම අංග සම්පූර්ණ ජල යෝජනා ක්‍රමය අපි පක්ෂ විපක්ෂ බේදයකින් තොරව යූඑන්පී ආණ්ඩුව ශ්‍රී ලංකා ආණ්ඩුව දෙකම එකතු වෙලා තමයි ඔය ජල යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කළේ. ඒ නිසා මම යෝජනා කරනවා. ඒ ජල යෝජනා ක්‍රමයේ වැඩ අවසන් වෙලා සියල්ලම තියෙද්දි දැන් යම් කණ්ඩායමක් හතර පස් දෙනෙක් එකතු වෙලා වතුර ඒ ගොල්ලන්ට විතරක් අරගෙන අනිත් මිනිස්සුන්ට ඒකෙ වතුර ලබා දෙන්නෙත් නැතිලු. පක්ෂ විපක්ෂ නෙවෙයි හැමෝටම ඒකෙ අවශ්‍යතාවක් තියෙනවා. ඒ නිසා ඔබතුමාගෙ බලය යොදවලා මේ සභාවට පවර ගන්න කියලා ඉල්ලීම කරනවා. මම ලේකම්තුමියටත් සිහිපත් කරනවා අපට අවශ්‍ය කටයුතු සම්පාදනය කරල දෙන්න කියලා. ඒ ජල යෝජනා ක්‍රමය ප්‍රාදේශීය සභාවට පවරා ගෙන ඉදිරි කටයුතු කරන්න. ඒ කටයුත්ත අපි එහෙම නොකළොත් ලොකු අපරාදයක් වෙනවා. ගොඩක් අයට අසාධාරණයක් වෙනවා.

ඒ වගේම මේ වෙලාවෙ අපි සියලු දෙනාට වගකීමක් තියෙනවා. අපි අලුත් ආණ්ඩුවක් පත්කර ගත්තා. ඒ වගේම අපි කොටසක් සතුටු වෙනවා.කොටසකගෙ හිත් රිදෙනවා. ඒක තමයි ලෝක ස්වභාවය. අපි එදා මැතිවරණයට ලකුණු යටතේ පක්ෂ යටතේ නොයෙකුත් විදිහට බෙදිල හිටියා. දැන් මැතිවරණය අවසානයි. අපි කිසිම කෙනෙකුට කරදරයක් නොකර හොඳ ආදර්ශයක් ලබා දුන්නා. ඒ වගේම මින් මත්තට ඉතිහාසෙ හැමදාම කවුරු රජයන් පත්වුනත් අපි වැඩ ටික හරියට නොකළොත් ඒ ආණ්ඩුවට අත්වෙච්ච ඉරණම තමයි අපටත් අත්වෙන්නෙ. ඒ නිසා අපි සතුටු වෙනවා. මම මීට කලින් මේ රජය විසින් වැඩ නොකරන එකේ ප්‍රතිඵල ලැබෙයි කියන එක සඳහන් කළා. ඉතිං ඒ නිසා ඒ ප්‍රතිවිපාකම තමයි අපිත් වැඩ නොකර සිටියොත් අපටත් ලැබෙන්නෙ. ඒ නිසා ඊයෙ දවස වෙනකොට සතොසෙන් හාල් රුපියල් 84 ට ලබා ගන්න පුලුවන්කම තියෙනවා. ඒ වගේම වී අලෙවි මණ්ඩයේ තියෙන සියලුම වී මුදා හැරලා හාල් මිල පාලනය කරන්න ලොකු උත්සාහයක් දරනවා. සියල්ල එකවිට කර ගැනීමේ අපහසුතාවයක් තියෙනවා. ඒ නිසා බදු සහන මිනිස්සුන්ට ලැබෙමින් පවතිනවා. ඒ වගේම කිරිපිටි සහනය ලැබිල තියෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා. දීර්ග කාලීනව කෘෂි කර්මාන්තය නගා සිටුවන්න. විශාල වැඩ කොටසක් මේ රජය තුලින් සිදු කරාවිය කියලා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් ප්‍රාදේශීය සභාවක් හැටියට ප්‍රාදේශීය සභාවේ තියෙන මූල්‍යමය තත්වය අනුව අයවැයක්,ඉදිරි වර්ෂයේ අපි ලබා ගන්නා විදිහත් වියදම් කරන විදියත් මේ සභාවට අනුරූපව අයවැයක් ඉදිරිපත් කළා. මේ අපිට මොනවා කළත් මුදල් ප්‍රතිපාදන ලබා ගන්න බැරි වුනොත් මොන විදිහට අපි මේව සැලසුම් සහගතව කළත් මේව ක්‍රියාත්මක කරන්න ලැබෙන්නෙ නැහැ. ඒක නිසා අපි සියලු දෙනාටම ආදායම් උත්පාදනය කරන වැඩ පිළිවෙලකට යා යුතුයි. ඒ සඳහා අපි සභාවෙ පක්ෂ විපක්ෂ සියලුම දෙනා එකතු වෙලා. අදායම වැඩිකර ගැනීම සඳහා යම් වැඩපිළිවෙලකට නාවොත්, අපි මොනවා කතා කළත් මේවා අපට ක්‍රියාත්මක කර ගැනීමේ හැකියාවක් ලැබෙන්නෙ නැහැ. ඉතිං ඒ නිසා ඒවා ක්‍රියාත්මක කර ගැනීම සඳහා අපි හැම දෙනාගෙම වගකීමක් සහ යුතුකමක් තමයි යම් අදායම් උත්පාදන මාර්ග සකස් කරල සහයෝගෙන් කටයුතු කිරීම. 2020 වර්ෂය සඳහා අයවැයක් සභාවේ ආදායමේ හැටියට සභාවේ කළ යුතු මට්ටමින් එය ඉටු කිරීමට කටයුතු කිරීම පිළිබඳව ගරු සභාපතිතුමා ලේකම් තුමිය ඇතුලු කාර්යය මණ්ඩලයට අපේ ගෞරවය ප්‍රණාමය මේ වෙලාවෙ පුද කරනවා.

ඒ වගේම විශේෂයෙන් 2019 අවසාන සභා වාරය තමයි අද අපි මේ රැස් වෙලා ඉන්නෙ.ඒ නිසා ලබන සභ වාරය වෙනකොට අපි අලුත් අවුරුද්දක අලුත් සභා වාරයක් හැටියට තමයි පටන් ගන්නෙ. ඒ නිසා ඒ පටන් ගැනීමෙදි මම යෝජනා කරනවා. මේ අපේ සියලුම මන්ත්‍රී වරුන්ට මීට වැඩිය ලොකු වගකීමක් තියෙනවා. අපට ලඟට මුදල් එන්නෙ නැහැ. ඒ මුදල් ලබා ගැනීම සඳහා අපට ලොකු වෙහෙසකර ගමනක් ගමන් කරන්න ඕන. සියලු මන්ත්‍රීවරුන් ඒ වෙහෙසකර ගමන යා යුතු කාලයක්

හැටියට මම දකිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, කොට්ඨාසවල සහා මන්ත්‍රීවරුන් සඳහා මහජන කාර්යාලයක් අනිවාර්යයෙන් පවත්වා ගැනීම සුදුසුයි. ඒක රජයේත් කතා බහට ලක් වෙලා තියෙනවා. හැම ග්‍රාම නිලධාරී වසමකම ග්‍රාම නිලධාරී කාර්යාලයක් තියෙනවා. ඒ වගේම අදාල නිලධාරීට හැම වසමකම කාර්යාලයක් තියෙනවා. මේ මැතිවරණ ක්‍රමයේ කවුරුත් අවධානය යොමු නොකරපු පැත්තක්,මේ මැතිවරණය අවසන් වුනාට පස්සෙ මේ මැතිවරණයෙන් පත්වෙලා 27 දෙනෙක් අපේ සභාවටත් පත්වුනා. ඒ වගේ ලංකාවෙ හැම කොට්ඨාසයකටම මන්ත්‍රීවරයෙක් පත්වුනා. ඒ මන්ත්‍රීවරයට අභිමාණයෙන් වැඩ කිරීමේ පරිසරයක් පැවතිච්ච රජයෙන් හරි පළාත් සභාවෙන් හරි ඒ දේ වුනේ නැහැ. මන්ත්‍රීවරු ටික පත්වුනා. අලුත් මන්ත්‍රීවරු වැඩිය පත් වුනේ. ඒ මන්ත්‍රීවරුන්ට හව්හරණක් අවකාශයක් ලබා දුන්නෙ නැහැ. ඒ නිසා මේ සමබන්දයෙන් කතිකාවකුත් ඇති වෙලා තියෙනවා. සෑම කොට්ඨාසයකටම පක්ෂ බේදයකින් තොරව ගමේ ඡන්දෙන් පත්වුන මන්ත්‍රීවරයට හරි පත්කළ මන්ත්‍රීවරයට හරි එකට හරි ගමේ කාර්යාලයක් පවත්වාගෙන යෑම ඒක ඉතාමත් වැදගත් කාර්යයක්. තමන් ගෙදර පදිංචි වෙලා ඉන්න එක ඇත්ත. අපි ගෙදර ඒ කටයුත්ත කළා වුනාට නමුත් මේ කොට්ඨාස ක්‍රමය තුලදි ඒ කොට්ඨාසෙ මන්ත්‍රීවරයට ගෞරවයෙන් වැඩකළ හැකි ස්ථානයක් කාර්යාලයක් අපි ස්ථාපිත කර ගත යුතුයි. ඒ සඳහා ඉදිරි අනාගතයෙදි යම් වැඩ පිළිවෙලක් සකස් වෙයි. ඒක හැම දෙනාටම ඉතාම වැදගත් කාර්යයක් වෙනවා.

ඒ වගේම තමයි අද මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා කියන තනතුර බොහොම හැල්ලුවට ලක් වෙච්ච අවස්ථා මම දකිනවා. ඒ නිසා රටේ ව්‍යවස්ථාදායකය අනුව රටේ පළවෙනි පුරවැසියා තමයි ජනාධිපති. ඒ වගේම අගමැතිතුමා කතනායකතුමා ඒ හරහා ඇවිල්ල පළාත් සභාවේ ප්‍රධාන ඇමතිවරයා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. ඒ වගේම කොට්ඨාසෙ පළවෙනි පුරවැසිය හැටියට සැලකෙන්නෙ ගමේ ඡන්දෙන් පත්වෙන මන්ත්‍රීවරයා. මුලු සභා ප්‍රදේශයේම පළවෙනි පුරවැසිය වෙන්නෙ ව්‍යවස්ථාව අනුව සභාපතිවරයා. එතකොට ගමේ යම් ගෞරවයක්, ඒ වගේම මන්ත්‍රීවරු පක්ෂ විපක්ෂ සියලුම දෙනා ගෞරවය ලබා ගැනීමට සුදුසු විදිහට කටයුතු කිරීමත් ඒ වගේම කොට්ඨාසෙ සියලු නිලධාරීන් අභිබවා පළමුවෙන්ම ඉන්නෙ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා. මොකද අනපනත් හදන්න සහයෝගය දක්වන්නෙ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා. ඒ නිසා මේ සමාජය තුල වැරදි අවබෝධයක් තියෙනවා. ඒක තමයි ව්‍යවස්ථාවෙ සඳහන් වෙන විදිහට ඒ කටයුතු සඳහා නායකත්වය දෙන්නෙ ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්ට වැඩිය, යම්කිසි නීතිමය බලයක් ප්‍රදේශයේ මන්ත්‍රීවරයාට තියෙනවා. ප්‍රාදේශීය ලේකම්ට චක්‍රලේඛ මගින් ලැබුනට නමුත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ඊටත් වැඩිය ඉහල තැනක තමයි ව්‍යවස්ථාව අනුව තියෙන්න ඕන. මම අර්ථ දැක්වීමක් කළේ. ඒ නිසා මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරය සම්බන්ධයෙන් අපි මීට වඩා ඒ කටයුතු කරද්දි ගෞරවය රැක ගත යුතු වෙනවා.

ඒ වගේම සභාව පිළිබඳ කතා කළොත්, සභාවේ කාටවත් මම දොස් කියන්නෙ නැහැ. නමුත් සභාව ක්‍රමානුකූලව ජේන්න නැහැ. මේක අනිවාර්යයෙන් නිවැරදි කර ගත යුතුයි. ඒ වගේම සභාවේ සියලුම සේවකයොත් කල්පනා කරන්න ඕන. මම ඇවිල්ල තියෙන්නෙ රස්සාවකට. ඊලඟට අපි යැපෙන්නෙ මේකෙන් ඒ නිසා මේක අපේ ආයතනය. මේක මහජනයට සේවය කරන තැනක්. ඒ නිසා අපි මහජනයට සේවය කරන්න ඕන. අපි අහිංසක මිනිස්සුන්ගෙ බදු මුදලින් වැටුප් ලබන කණ්ඩායමක්. ඒක නිසා අපි හැම දෙනාම මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඇතුලු සියලු රජයේ සේවකයන් කල්පනා කරන්න ඕන. අපිට ලැබෙන නිවාඩුව වරප්‍රසාදයක් නෙවෙයි. අපට වරුවෙන් යන්න තියෙන එක වරප්‍රසාදයක් නෙවෙයි. ඊලඟට අපට බැහැරව යන්න තියෙන එක වරප්‍රසාදයක් නෙවෙයි. ඒ නිසා මේවා ගොනුවෙලා මෙතනදි සිද්ද වෙන්නෙ නැහැ. ඒ නිසා මම මේ වෙලාවෙ යෝජනා කරනවා. ගරු සභාපතිතුමනි, මේ ගැන මීට වැඩිය තදින් කටයුතු කරන්න. එහෙම නොකළොත් මේ කටයුත්ත කරගෙන යන්න බැරි වෙනවා. ඒ නිසා සභාවෙ සේවකයන් පිළිබඳව,අපි සේවකයන්ට අවස්ථාව දෙන්න ඕන. සේවකයො සතුටින් තියන්න ඕන. සේවකයන්ට අවශ්‍ය නිවාඩු

ගන්න දෙන්න ඕන. නමුත් යම් ක්‍රමවේදයක් සකස් විය යුතුයි. බැහැරව යනවනම් ඕනම ෆීල්ඩ් එකේ යන කෙනෙක් මෙන්න මේ ගමන තමයි යන්නෙ කියල මෙතනින් පිටවෙන කොට අදාල පොතක සටහන් වෙන්න ඕන. ඒක තමයි නීතිය. මේකෙ නීතිය ගැන කතා කළාට යම් දේවල් නීතියට අනුව කෙරෙන්නෙ නැහැ. ඒක නිසා මේක ගරු සභාපතිතුමාට තනියෙන් කරන්න බැහැ. ඒ නිසා සියලු දෙනා සභාපතිතුමාට සහයෝගය ලබා දෙන්න ඕන. මේ කටයුත්ත කරන්න. මොනව හරි අඩුපාඩුවක් තියෙන තැන සභාපතිතුමා හමුවෙලා එතුමත් එක්ක ඒ පිළිබඳ සාකච්ඡා කරන්න ඕන. අන්න ඒ වගේ වැඩපිළිවෙලක් කරන්න මේ සභාවෙ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා. වෙනත් සභාවල වගේ නැතුව මේ කාලය තුලදි අපි සියලුම දෙනා එකතු වෙලා ගමනක් යන්න මම සියලු දෙනාට ආරාධනා කරනවා. උඩවැලිවිටිය මගේ කොට්ඨාසෙ අපි වැඩපිළිවෙලක් හදල තියෙනවා. ඊයෙ දවසෙ උඩවැලිවිටිය ඉනෝකා මන්ත්‍රීතුමියගෙ කොට්ඨාසෙ අපි සංවර්ධන කමිටුවක් හැදුවා. ඒ වගේම අද උඩවැලිවිටිය බටහිර හදනවා. ගමේ ඕනම කෙනෙකුට ඇවිල්ලා ඒකට සම්බන්ද වෙන්න පුලුවන්. මොනව හරි ලැබෙනවනම් ඒ කමිටුවට තමයි අපි යොමු කරන්නෙ. උදාහරණෙකට මට ලොකු වට්ටක්ක ගෙඩියක් හම්බවුනොත් වැලිවිටියට බෙදන්න කියලා. ඕක හතරට කපලා ග්‍රාම සේවා වසම් හතරෙ අර කමිටු හතරට දෙනවා මෙන්න මේ දේ කරන්න කියලා. එතකොට ඒ ගොල්ලො තමයි වගකියන්නෙ. මේ රජයෙන් මේ මන්ත්‍රීවරුන්ට විශාල සහනදායී වැඩපිළිවෙලක් සූදානම් කළා. ඒකෙන් එක මන්ත්‍රීවරයෙක් ප්‍රයෝජන ගත්තෙ නැහැ. නමුත් ඔබට ලොකු වගකීමක් තියෙනවා. මේ පත්වෙන මන්ත්‍රීවරු සියලු දෙනාට මම පුන පුනා කියනවා. තමන්ට වගකීමක් පවරල තියෙනවනම් ඒ වගකීම ඉටු කරන්න. ඒ වගේම සමාජ සේවය කරන්න බැරිනම් එන්න ඕන නැහැ. එහෙමනම් මේක කරන්න තව ඕන තරම් මිනිස්සු ඉන්නවා. ඒ නිසා මේක පිරුවටයක් වගේ එකක්. ඒ සඳහා කවුරුවත් අපට ප්‍රතිපාදන දෙන්නෙ නැහැ. කවුරුවත් අපට නායකත්වය දෙන්නෙ නැහැ. අපි හොයාගෙන ගිහිල්ලා කරන්න ඕන. ඒ කරන්න ඉතාම හොඳ අවස්තාවක් ඔබට ඉස්සරහදි උදාවෙලා තියෙනවා. ඒ සඳහා සියලු දෙනාට ආරාධනා කරනවා.

ඒ වගේම විශේෂයෙන්ම මම සඳහන් කරනවා. සභාපතිතුමනි අපේ ඉනෝකා මන්ත්‍රීතුමිය කියපු උඩවැලිවිටිය ගම් මායිම හරහා තියෙන පාලම, ඒ ගිවිසුම යටතේම කරන්න කටයුතු සූදානම් කරලා තියෙනවා. ඒ ගිවිසුම දීර්ඝ කර ගැනීම සඳහා ගොවි සංවිධානෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. අනිත් පාර සඳහා නම් ගිවිසුම් අත්සන් කරල නැහැ. ඒකනම් කරන්න බැරි වේවි. උඩවැලිවිටියෙ එක නම් කරන්න පුලුවන් කම තියෙනවා. සභාපතිතුමා ඒ සඳහා අවශ්‍ය පරිසරය හා අවකාශ ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම සභාපතිතුමනි විශේෂයෙන්ම මම අපේ සභාපතිතුමාට මම ස්තූතිවන්ත වෙනවා. උඩවැලිවිටිය ගම්මැද්දෙගොඩ යා කරන මාර්ගයේ නඩු කටයුත්ත සඳහා මැදිහත්වීමක් කරල මුදල් ලබා ගැනීම සඳහා අවකාශ ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට මේ වෙලාවෙ ස්තූති වන්ත වෙමින් ගොඩක් කතා කරන්න තිබුනත් කාලවේලාව ඉක්ම යන බැවින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීවරුනි මන්ත්‍රීවරියනි, මම පළමුවෙන්ම උප සභාපතිතුමා ඇතුලු පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ට ගෞරවණීය ස්තූතිය පුද කරනවා. අද දින මම ඉදිරිපත් කළ 2020 සඳහා වූ අයවැයට සහයෝගය දැක්වීම පිළිබදව. නමුත් වැරදි වැටහීමක් නිසා අපිට ඡන්ද විමසීමකට යන්න සිදු වුනා. ඒකෙදි මට 27 දෙනාම කැමැත්ත ප්‍රකාශ කළා කියල තමයි මම හිතන්නෙ. මොකද අපේ ප්‍රති පක්ෂ මන්ත්‍රීවරුනුත් විරෝධතාවයක් දැක්වුවෙ නැහැ. ඒ පිළිබද මම එතුමන්ලටත් ගරු කරනවා. ඒ සියලු මන්ත්‍රීතුමන්ලට මන්ත්‍රීතුමියන්ලට මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා.

ඊලගට මම මේ අවස්ථාවක් කොට ගන්නවා. පසුගියදා පැවති ජනාධිපතිවරණයේ සමස්ථ ශ්‍රී ලංකාවෙ බහුතර ජනතාව අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයත් සමග ඒකාබද්ධ වෙලා. එතුමාගේ ජයග්‍රහණයට සහය දක්වලා, ශ්‍රී ලංකාවේ හත්වැනි විධායක ජනාධිපති හැටියට පත්කිරීමට ඡන්දය ප්‍රකාශ කළ සියලු දෙනාටම අපේ ගෞරවණීය ස්තූතිය පුද කිරීමට, ඒ ජයග්‍රහණයෙන් සතුටට පත් වෙන අපි ඒ සියලු දෙනා සමගම සතුට බෙදාගෙන, රටේ ඉදිරි අනාගතය ආරක්ෂාකාරී හොඳ සෞභාග්‍යමත් රටක් බවට පත්වෙනවා දකින්න අපි කවුරුත් ආසයි. මම ජනාධිපතිධූරයට පත්වුනේ සිංහල බෞද්ධ ඡන්දයෙන්ය කියල එතුමා නිර්භීත ප්‍රකාශයක් කළා. එතුමාගේ එම නිර්භීත ප්‍රකාශයට අපි ගරු කරනවා. නමුත් එතුමා ඒකෙන් අදහස් කළේ නැහැ. දෙමළ හෝ මුස්ලිම් බර්ගර් ජනතාවගේ ඡන්ද අවශ්‍ය නැහැ කියලා. මොකද සුළු ජාතීන්ගෙ අදහසක් තිබුනා. ඒ අයගේ ඡන්දය නැත්නම් රටේ නායකත්වයට පත් වීමට කාටවත් බැහැ කියලා. නමුත් ඒ සිතුවිල්ල මෙවර ජනාධිපතිවරණයෙදි ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ට ඡන්දය දීලා අපේ බහුතර ශ්‍රී ලාංකිකයන් ඒ සිතුවිල්ල මුසාවක් බවට පත් කළා. ඒ නිසා ඉදිරියෙදි මම හිතන්නෙ රටේ කිසියම් වූ ප්‍රශ්නකාරී තත්වයක් ඇති නොවේවි කියලා. මොකද එතුමා හොඳ සිංහල බෞද්ධයකු නිසා. නියම සිංහළ බෞද්ධයන් සියළුම ආගම්වලටත්, සියළුම ජාතීන්ටත් එකසේ ආදරය කරන නිසා.

පාර්ලිමේන්තුවෙ ගරු අග්‍රාමාත්‍ය හැටියට හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා පත්වීමත්, ඒ වගේම ගාලු දිස්ත්‍රික්කයෙන් අපේ නායකත්වය දරණ වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාට කැබිනට් අමාත්‍යධූරයක් ලැබීමත්, ඒ වගේම අධීනීතිඥ මොහාන් පී සිල්වා ගරු මන්ත්‍රීතුමාටත් රාජ්‍ය ඇමතිකමක් ලැබීමත් ගැන අපි සතුටු වෙනවා. එතුමන්ලාට ලැබිච්ච අමාත්‍යාංශවලින් අපේ බල ප්‍රදේශයට ලබාගත හැකි උපරිම සහයෝගය ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අපි ජයග්‍රහණය කළාම අපේ මන්ත්‍රීතුමාලා කිව්ව වගේ මෑත කාලීනව තිබුන ඡන්දවලින් වඩාත්ම යහපත් සුහදශීලී කාටවත් කරදරයක් නැති ඡන්දයක් මෙදා තිබුනෙ. ඒ අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ දර්ශනය නිසා. පෝස්ටර් ව්‍යාපාර නොමැති නිසා අඩදබර ඇතිවුනේ නැහැ. මේක සාමකාමී ඡන්දයක් හැටියට අපි දකින්නෙ. ඒ සාමකාමීත්වය තුල මධ්‍යස්ථ මතධාරී උගත් බුද්ධිමත් ජනතාව. තමන්ගෙ තීරණය ඉදිරිපත් කරලා, වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් ජනාධිපතිධූරයට පත්කළා. ප්‍රති පක්ෂ අපේක්ෂක හිටපු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා. එතුමාත් උනන්දු වුනේ රටේ ජනාධිපති වෙන්න. නමුත් එතුමාගේ ඒ ප්‍රතිපත්තිවලට බහුතර ජනතාව කැමති නැති නිසා එතුමා පරාජිත අපේක්ෂකය වුනා. නමුත් එතුමා වර්ථමානෙ එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ නායක ධූරයට පත්වෙලා. ඒ පක්ෂයේ උන්නතිය සඳහා වැඩ කරයි කියල අපි බලාපොරොත්තු වෙනවා. මොකද එක්සත් ජාතික පක්ෂය ගෞරවණීය පක්ෂයක්. එනිසා අපි එතුමාටත් සුබ පතනවා. විශේෂයෙන් නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ඉදිරි අනාගතයේ අපි බලාපොරොත්තු වෙන ආකාරයට වැඩ කරන්න පුලුවන් වෙයි. ප්‍රාදේශීය සභාවෙ පසුගිය අවුරුදු එකහමාර තුල ඒ කෙරිච්ච සංවර්ධන කටයුතුවලදි ගරු මන්ත්‍රීතුමන්ලා ඇත්තටම සතුටු වෙන්න නැතුව ඇති. අප සභාව පසුගාමී ප්‍රාදේශීය සභාවක් නිසා අපට ඕන ආකාරයට අපගේ යොජනා ඉෂ්ඨ කර ගන්න බැහැ. අපි කොච්චර කිව්වත්, යෝජනා දැම්මත් මූල්‍ය තත්වයේ දූර්වලකම නිසා අපට ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න හැකියාවක් නැහැ. සමහර මන්ත්‍රී යෝජනා ඉටු කිරීමට නොහැකිවීම තුල මම දෝෂදර්ශනයට ලක්වුන අවස්ථා තිබුණා. නමුත් මම කියන්න කැමතියි මම එක සතයක් වංචා කරලවත් අයුතු විදිහට ප්‍රයෝජන අරගෙනවත් නැහැ. මම තියෙන ප්‍රතිපාදන සියලු දෙනාට සම ආකාරයෙන් දුන්නා. විශේෂයෙන්ම මම පළමුවෙන්ම රුපියල් ලක්ෂය ගානෙ මේ මන්ත්‍රීවරුන්ට දුන්නා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒක නැහැ. නමුත් 15 දෙනාම යන්නෙ තම බල ප්‍රදේශයේ වැඩ කරන්න. ඉතිං කොට්ඨාස 15 ම වැඩ කෙරෙන නිසා ඒ අවස්ථාවෙ මට ලැබුන ලක්ෂ 71 න් අපේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂය ගානෙ ප්‍රදානය කළා. ඊට පස්සෙ අපට මුද්දර ගාස්තු හැටියට පන්ලක්ෂ විසිදාහක මූල්‍ය පුතිපාදනයක් ලැබුනා. පොලවල්වල ආදායම හැර මන්ත්‍රී ප්‍රතිපාදනයක් හෝ වෙනත් ප්‍රතිපාදන අපට ආවෙ නැහැ. ඒ නිසා බොහොම අමාරුවෙන්

කළමනාකරණය කරගෙන තමයි මේ කටයුතු කරන්න සිදු වුනේ. අපි පත්වන්නට ප්‍රථම තිබූ ප්‍රාදේශීය සභාවලදි මාසෙකට ලක්ෂ 10 වෙන්න පළාත් සභාවෙන් ප්‍රාදේශීය සභාවට මුදල් ලැබුනා. එතකොට ආදායම් තත්වයත් හොඳයි. ඒ දවස්වල කම්කරුවන් වැඩියි. නිලධාරීන් අඩුයි. අද නිලධාරීන් වැඩියි කම්කරුවන් අඩුයි. කම්කරුවො පස්දෙනයි හයදෙනයි ඉන්නෙ. එතුමන්ලා වැඩකරන්න ගියාම පාරක් එක දවසින් ඉවර කරන්න බැහැ. මාසයක් විතර වැඩ කරන්න වෙනව එතන. මොකද ඒ අදාල ප්‍රදේශයේ මන්ත්‍රීතුමා ඒක ඉවර කරල තවත් ඒව කර ගන්නවා මිසක් එන්න දෙන්නෙ නැහැ. අපටත් ඒක කර ගන්න බැරි වෙනවා. ඒනිසා තමයි ඒ එයාලගෙ වැඩකටයුතු කරද්දි යම් යම් ප්‍රදේශවලදි අඩුපාඩු සිද්ද වෙන්නෙ. මන්ත්‍රීතුමාලා මට දෝෂාරෝපනය කළාට එතුමන්ලා මෙම තනතුරට පත්වුනානම් නම් ඔය තත්වෙ තමයි. මම යන්තම් මේ කටයුත්ත බෙද හදාගෙන කරන නිසා මෙම විදියටවත් වැඩ කෙරෙනවා.

ඊලගට තවත් කියන්න ඕන. සභාපතිතුමාගෙ තියෙන බලතල ක්‍රියාවට නංවන්නෙ නැහැ කියල කියනවා. ක්‍රියාවට නංවන්නෙ නැතුව නෙවෙයි මම සාධාරණව කරන්න යන කොට නොයෙක් නොයෙක් බලපෑම් එනවා. එතකොට මමත් අපහසුතාවයට පත් වෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා. ඉදිරි වර්ෂයේ කිසියම් හෝ කෙනෙකුගේ කිසියම් හෝ විදිහක බලපෑමකට මම යටත් නොවී කටයුතු කරන්න. ඒ නිසා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නෙ. ඔබතුමන්ලත් මට මොනවත් බලපෑම් කරන්න එන්න එපා. මම යුක්ති සහගත විදිහට වැඩ කරනවා. එන අවුරුද්දෙ ඉදල ඒක මම හරියටම කරනවා. ඒ නිසා මම මේ අවුරුදු දෙක බලා හිටියෙ සියලු දෙනාගෙ යහපත උදෙසා සාධාරණව වැඩකරන්න. ඒකෙදි යම්යම් අඩුපාඩු සිද්ද වෙන්නෙ අර මම කලින් කියපු මූල්‍ය සම්පත අපට නොමැති නිසා. මොකද සභාපති හැටියට මට ඔය හැමදේම කියන්න බැහැ. මම අර කලින් කිව්ව වගේ ගෙදරක බල්ලෙක් මැරිලා හිටියත් සභාවට කෝල් කරනවා. එවැනි සමාජෙක අපි ජීවත් වෙන්නෙ. ඒ නිසා කරුණාකරලා මන්ත්‍රීතුමාලත් හිතන්න.

ඊලගට මන්ත්‍රීතුමාලගෙ අදහස් ඉදිරිපත් වෙද්දි සංවර්ධනය කල පාරවල්වල ගහපු බෝඩ් ගැලවීම පිළිබදව කියවුනා. මම මේ බෝඩ්වලට එදා ඉදලම විරුද්ධ කෙනෙක්. මොකද බෝඩ් එකට රුපියල් 5000 ක් 6000 ක් වෙනවා. පසුගිය සභා කාලවල අපි සංවර්ධනය කල පාරවල්වල බෝඩ් ගහන එකට මම විරුද්ධ වුණා. නමුත් මේ බෝඩ්වලටත් අදාළ ඇස්තමේන්තුවේ වෙන්වෙන මුදලක් ඇති නිසා හැම පාරකම බෝඩ් ගහන්න සිද්ද වුනා. නමුත් වර්ථමාන ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගෙ නව දැක්ම තුල. එතුමාම රාජ්‍ය ආයතන සහ එම පරිශ්‍රයන් තුල ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය පමණක් ප්‍රදර්ශනය කිරීමට උපදෙස් දී තිබෙන්නෙ. "අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි සියලුම රාජ්‍ය ආයතනයන් සහ එම පරිශ්‍රන් තුල සම්ප්‍රදායක් වශයෙන් ප්‍රදර්ශනය කෙරෙන වත්මන් ජනාධිපතිතුමාගේ ඡායාරූපය වෙනුවට ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය පමණක් ප්‍රදර්ශනය කිරීමටත් ඒ අනුව අනිකුත් සියලුම දේශපාලන ප්‍රභූවරුන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය නොකිරීමට කටයුතු කරන ලෙසත් දන්වා තියෙනවා. එමෙන්ම මාර්ග නාම පුවරුවල ප්‍රදර්ශනය කර ඇති දේශපාලන ප්‍රභූවරුන්ගේ ඡායාරූප ඉවත් කර මාර්ගයේ නම පමණක් ප්‍රදර්ශනය කර තැබීමටත් අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි තව දුරටත් දන්වා තිබෙනවා." මේ චක්‍රලේඛය අනුව තමයි අපි කටයුතු කළේ. හැබැයි ඒත් මම තවම එච්චර ඉක්මන් වුනේ නැහැ. අනිත් ප්‍රාදේශීය සභා ගලවන්නෙ නැහැ කිව්වට අනිත් හැම ප්‍රාදේශීය සභාවක්ම අපට ඉස්සර වෙලා ක්‍රියාත්මක වෙලා. නමුත් අපි ඒ ගලවන බෝඩ් ආරක්ෂිතව සභාවෙ තියෙනවා. අවශ්‍ය වුනොත් නැවත ඉදිරිපත් කරන්න කියලා. ගරු මන්ත්‍රීතුමනි, මම අතිගරු ජනාධිපතිතුමාට සුභ පතලා රුපියල් 6000 ක පමණ වියදම් කරල කටවුට් එකක් නාගොඩ හන්දියෙ ප්‍රචාරය කළා. ගහලා එක දවසයි තිබුනෙ. මෙන්න අනිත් පැත්තට එනවා. මේවා ඉවත් කරන්න කියලා. එතන තිබුන අර ලොකු බෝඩ් එකත් ගලවන්න කියල. පස්සෙ මගෙන් කීප දෙනෙක් ඇහුවා. චක්‍රලේඛයක් ඇවිල්ලද කියල. එතකොට මේ චක්‍රලේඛයක් ඇවිල්ලා තිබුනෙ නැහැ. දුරකතනෙන් තමයි පොලීසිය දැණුම් දීම කළේ.

සංවර්ධන කටයුතුවලදී වර්ථමානෙ තියෙන සංවර්ධන කටයුතු ඇත්තටම කෙරිය යුතු ඒවා. නමුත් කාල රාමුවක් නියම කරල තියෙන නිසා නිසි වේලාවට ඒවා අවසන් කල යුතුයි. ඒවා නොකෙරුනොත් අදාළ නිලධාරීන් අපහසුතාවයට පත්වෙනවා. ඒ නිසා අපි ඒ කටයුතු කර ගන්නනම් කවුරුත් උනන්දු වෙලා ඒ අදාල කාලසීමාව තුල කරන්න අපි කවුරුත් කටයුතු කරන්න ඕන. ඒ වගේම ආදාහනාගාරය පිළිබඳ විමසුවා. ඒකෙ දැන් හැම කටයුත්තක්ම ඉවරයි. ඉඩම අපට ලබා ගැනීමේ කටයුතු අවසන් අදියරේ තියෙන්නෙ. පියල් මන්ත්‍රීතුමනි, අපි මාපලගම නගරය පිරිසිදු කරන්න අර දමිළ ජාතික පුද්ගලයා ජනවාරිවල ඉඳලා ගමු. ජනවාරිවල ඉඳලා ඒක නිසි ක්‍රමවේදයක් ඇතුව කරමු. ධනංජය මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට ගොම පොහොර අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව ලේකම්තුමිය අදම ඒ පිළිබඳව අදාල ආයතන දැනුවත් කරලා, ඉදිරි ක්‍රියාමාර්ග ගන්න. මේ සම්බන්ධව සභාවේ කතා කළ බවත් කියන්න.

ඒ වගේම ගෝනදෙණිය පිට්ටනිය පිළිබඳව සඳහනේදී ගරු ධනංජය මන්ත්‍රීතුමනි, මගේ උවමනාවට කල එකක් නොවෙයි. මේක මම ලිඛිතව දීලා නෙවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙ ලේකම්තුමිය මෙම පාර සංවර්ධනය කිරීමට විරුද්ධද කියලා ඇහුවා. අපට විරුද්ධ වෙන්න දෙයක් නැහැ. අපේ පෙරපාසල සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයට යන පාරක් නිසා, එතන අල්ලපු ඉඩම මිලදී ගත්ත කෙනා තමයි එයාගෙ අවශ්‍යතාවයට, එම පාර සංවර්ධනය කිරීමට කටයුතු කරන්නෙ. උඩුගම, නාගොඩ ප්‍රධාර පාර සංවර්ධන කටයුත්තෙදි ඉහත ඉඩම ලබාගෙන තියෙනවා ගල් දාන්න හරි මොනවට හරි. එම අවශ්‍යතාවයට පාර සංවර්ධනය කරන්න තමයි ගල් වගයක් දාලා තියෙන්නෙ. ධනංජය මන්ත්‍රීතුමා මගෙන් අහනවා. පිට්ටනියෙ ගල් දාන්න දුන්නද කියල. මම කිව්වා ගල් දාන්න දුන්නෙ නැහැ කියලා. පස්සෙ බැලින්නම් පිට්ටනිය අයිනෙ ගල් දාලා තියෙනවා. මම දුරකථනයෙන් ඇහුවට පස්සෙ තමයි දන්නෙ. පාර සංවර්ධනය කරගන්න තමයි ABC ගොඩගහල තියෙන්නෙ කියලා. ඊලගට AGA දැනුවත්ව තමයි කරලා තියෙන්නෙ. අපේ ගරු මන්ත්‍රීවරු දන්නවා උපසභාපතිතුමා දන්නවා. පිට්ටනිය මැදින් තමයි ඒකෙ නියමිත පාර තියෙන්නෙ. ඒක නීත්‍යානුකූලව කළොත් ඒ පාර එයාලට දෙන්න වෙනවා. මමත් මේ සාධාරණය කරන්නෙ. මම පිට්ටනිය නැති කරන්න දෙන්නෙ නැහැ. මම මෙතන සභාපති වෙලා ඉන්නකම් එක බිම් අගලක් කාටවත් දෙන්නෙ නැහැ. මම සභාවට නීත්‍යානුකූලව ඉඩම් පවරගෙන තියෙනවා. මම මේ සභාවට දාලා තමයි ඒ කටයුත්ත කළේ. එම ආයතනයෙන් කිව්වා පිට්ටනිය අංග සම්පූර්ණ කරලා, ගස් වවලා, පාරත් හදලා දෙන්නම් කියලා. අපට කර ගන්න බැරි දේවල් ඒව කර ගන්නයි අපේ අවශ්‍යතාවය. මගේ අදහසකුත් තිබුනා ඒ පිට්ටනිය සංවර්ධනය කරල යම් දෙයක් කරන්න. ඒ නිසා කවුරුවත් හිතන්න එපා මම සභාපති වෙලා ඉන්නකම් මේකෙ එක බිම් අගලකටවත් හානියක් වෙන්න වැඩ කරනවයි කියලා. ඒක මම වගකීමෙන් කියන්නෙ.

ඊලගට නෙලී මන්ත්‍රීතුමිය කිව්වා වගේ යටලමත්තෙ ඇල හරහා ඇති අබලන් පාලම කඩන බව මම දන්නෙ නැහැ. දවසක් නන්දසේන මහත්මයා ඇවිල්ලා පාලම ගලවන්න අවසර ඉල්ලුවා. එහෙම ලියුමක් අපට දෙන්න බැහැ. යම් කිසි ආයතනයකින් ඉල්ලීම් කරනවානම් අපට අවසර දෙන්න පුලුවන්. නමුත් ඉරිදා ගලවලා තියෙනවා. මගේ ලග ඔබතුමියගෙ නොම්මරය තිබුනෙ නැහැ. මම එතන කෙනෙකුට ගිහිල්ලා බලන්න කියලා රියදුරු කැලුම්ට කතා කරලා ලොරිය යැව්වා. නමුත් අයින් කරපු යකඩ බට ගේන්න බැහැ. කපල ගේන්න ඕන. මොකද අපි එහෙමයි හැමදේම ආරක්ෂා
කරන්න යන්නෙ. මම සභාව සතු සම්පත් නැති කරන්නෙ නැහැ. තවත් කාරණයක් තමයි ජයනි නිලධාරිනිය පෙරපාසල් උත්සව පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් නොකිරීම. හැබැයි පෙරපාසල් පාලිකාවන් තමයි මන්ත්‍රීවරුන්ට ආරාධනා පත්‍ර දුන්නෙ. මටත් ආරාධනාව එයාල දුන්නෙ. නමුත් ගරු මන්ත්‍රීවරුන්ට ඒ පෙරපාසල් උත්සව පිළිබඳව දැනුවත් නොකිරීම සම්බන්ධයෙන් අපෙන් වරදක් වෙලා තියෙන බව පේනවා. ඒ වගේම කුරුපනාවෙ වැලි ගොඩදාන ස්ථාන පිළිබඳව කිව්වා. ඉදිරියෙදි අවශ්‍ය කටයුතු කරනවා. ජල යෝජනා ගැන ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා. ඒ වගේම

පෙරපාසලක් අලුතින් ආරම්භ කරන්න කිව්වා. අපේ තව මන්ත්‍රීතුමෙක් කිව්වා පුලුවන්නම් පෙරපාසල් ආපහු පෞද්ගලික අංශයට දෙන්න කියලා. බලමු කොහොම නමුත් මේ ඉල්ලීම් කරන පෙරපාසල ප්‍රදේශයට අවශ්‍යතාවයක්. මොකද මේ අවශ්‍යතාවය නිසා කොහොම හරි පෙරපාසලක් ස්ථාපිත කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමන්ලා, උප සභාපතිතුමන් අපි සියළු දෙනා බලාපොරොත්තු වෙනවා. ඉදිරි අනාගතේ අනාගතේ මේ ප්‍රාදේශීය සභාවෙ සංවර්ධනය සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගෙ ඒ වගේම කවදත් අපට අපි වෙනුවෙන් හිතලා මතලා වැඩකරපු අපේ අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ ආශිර්වාදය බැල්ම අපට ලැබේවි කියලා. විශේෂයෙන්ම අපට සංවර්ධන ක්‍රියාවලියෙදි පසුගිය අපේ රජයන්වලදී අපට බැසිල් රාජපක්ෂ ඇමතිතුමා බොහොම යහපත් ප්‍රතිචාර දැක්වුවා. එතුමාගෙ අනුදැනුම ඇතුව ඉදිරියෙදි ප්‍රාදේශීය සභාවටත් මන්ත්‍රීවරුන්ටත් ප්‍රතිපාදන වෙන්වෙලා. අපට අපේ ගමේ වැඩකරන්න මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙයි කියලා අපි බලාපොරාත්තු වෙනවා. ඒ බලාපොරාත්තුවත් හදවතේ තියාගෙන. අද 2020 වර්ෂයේ අයවැය වෙනුවෙන් ඔබ දුන් සියලු සහයෝගය සහ කැමැත්ත මම නැවත නැවතත් මතක් කරමින් 2020 වර්ෂය වාසනාවන්ත වර්ෂයක් වේවා. අපේ තියෙන මොනවා හෝ හිත් අමනාපකම් අමතක කරල 2020 වර්ෂයේ ඉදල 27 දෙනාම සහයෝගෙන් එක අම්මගෙ දරුවන් වගේ වැඩකටයුතු කරන්න මට සහාය වෙන්න. ඒ වගේම මම ගරු මන්ත්‍රීතුමන්ලගෙන් ඉල්ලා සිටිනවා. මට සහය දෙන්න මේ 27 දෙනාටම එකා මෙන් වැඩකරන්න. ඒ වගේම ජනවාරි පළවෙනිද උදේ මේ ස්ථානයේ හාමුදුරුවරු වඩම්මවා සාංඝික දානයක් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒකට ඔබතුමාලගෙ පැමිණීම සහ සහයෝගය බලාපොරොත්තු වෙනවා. ඒකත් මතක් කරමින් මම මීට වඩා යමක් කියන්නෙ නැහැ. ඔබ සියලු දෙනාටම ලබන්නා වූ 2020 වර්ෂය කිරියෙන්, පැණියෙන් ඉතිරෙන සුභ නව වසරක් වේවා පතමින්, නවතිමි. සියළු දෙනාට තෙරුවන් සරණයි.

සභාපති,
නාගොඩ ප්රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:- .............................